8857

වාර්ෂික වාර්තාව 2010

11 NOV 2011

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

11 NOV 2011

වාර්ෂික වාර්තාව
2010

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
අංක 114,
විජේරාම මාවත,
කොළඹ 07.

2011 සැප්තැම්බර් 14 දින.

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම්

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පාලක මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් ලේඛන මේ සමග ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. ආදායම් සහ වියදම් විගණන වාර්තාව
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිරීක්ෂණ

සභාපති
පාලක මණ්ඩලය

පටුන

	පිටු අංක
සංස්ථාපනය	iv
පාලක මණ්ඩලය	v
පාලක මණ්ඩල රැස්වීම්	vi
සංක්ෂිප්තය	01-02
කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය	03-09
කෘෂි සම්පත් කළමනාකරණ අංශය	10-17
පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය	18-20
අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය	21-33
මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය	34-39
සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය	40-41
පුස්තකාලය	42
ප්‍රකාශන ඒකකය	43
2010 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය/ස්වභාවය	44
කාර්ය මණ්ඩල සංවර්ධනය	44-45
ගිණුම්	46-55
විගණකාධිපතිගේ වාර්තාව	56-65
වාර්තාව 14(2C)	66-74

සංස්ථාපනය

1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වර්ෂයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවනු ලැබ ඇත. මූලික අවස්ථාවේ දී ආයතනය වෙත එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ ඥානය සහ මූල්‍ය සහයෝගය ලැබුණි. නිල බලයෙන් පත්වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් මෙම ආයතනය පාලනය කරයි. රටේ කෘෂි ක්ෂේත්‍රයේ සංවර්ධනයට මුල්වන ආයතනයන්ගේ නියෝජිතයන්ගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධානියා සහ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දරයි.

ආයතනයේ අරමුණු රාශියකි. රටේ සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන් ජාතික සහ ජාත්‍යන්තර ආයතන මගින් කරනු ලබන ගොවිජන ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩි දියුණු කිරීම, සහයෝගය දීම, දිරි ගැන්වීම සහ සහභාගිත්වය ලබාදීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අපේක්ෂාවයි. තව දුරටත්, ගොවිජන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශයන් සැපයීම අරමුණු කරගෙන ආයතනය මගින් පර්යේෂණ හා විමර්ශන කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. පර්යේෂණයන්ට අමතරව, ආයතනය මගින් ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. සමස්තයක් වශයෙන් ආයතනය ගොවිජන ගැටලු සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආයතනයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක පහත සඳහන් වෙයි.

දැක්ම

තිරසර ගොවිජන සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය සහ බෙදා හැරීමේ ප්‍රමුඛයා බවට පත්වීම.

මෙහෙවර

සමාජ-ආර්ථික පර්යේෂණ සහ පුහුණු ක්‍රියාකාරකම් ඔස්සේ ගොවිජන සහ ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.

ඉලක්ක

1. දැනුම ජනනය සහ නියමිත වෙලාවට බෙදා හැරීම මගින් ප්‍රතිපත්ති ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම.
2. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
3. ක්‍රියාබද්ධ පර්යේෂණ තුළින් ග්‍රාමීය සංවර්ධන ආදර්ශයන් සැකසීම.
4. සැපයුම් ක්‍රියාවලිය තුළ සිටින පාර්ශ්වකරුවන් සඳහා වෙළෙඳපොළ බුද්ධි තොරතුරු සැපයීම.
5. ආයතනයේ සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම.

පාලක මණ්ඩලය

එස්. අමරසේකර මහතා	-	ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සභාපති 2010 ජුනි 23 තෙක්
කේ.ඊ. කරුණාතිලක මහතා	-	ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සභාපති 2010 ජුනි 23 සිට
මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතා	-	අධ්‍යක්ෂ, හෙ.ගො.ප.පු. ආයතනය 2010 මැයි 19 දක්වා
ලලිත් කාන්ත ජයසේකර මහතා	-	අධ්‍යක්ෂ, හෙ.ගො.ප.පු. ආයතනය 2010 මැයි .21 සිට
පී.එල්. නන්දසිරි මහතා	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, 2010 ජුනි සිට
කමලා උයන්වත්ත මහත්මිය	-	අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, 2010 මැයි දක්වා
කේ.ඒ.යූ.එස්. ඉඹුලාන මහතා	-	අතිරේක ලේකම්, වාරි සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය 2010 ජුනි සිට
ඩබ්.එම්. ජයතිලක මහතා	-	අතිරේක ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය 2010 මැයි දක්වා
ඩී.සී.ඒ. ගුණවර්ධන මහතා	-	අධ්‍යක්ෂ, කර්මාන්ත ඉදිකිරීම් වෙළෙඳ සහ සේවා අංශය, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2010 ජුනි සිට
එම්.පී. හේවාවිතාරණ මහතා	-	සහකාර අධ්‍යක්ෂක, ජාතික අයවැය දෙපාර්තමේන්තුව 2010 මැයි දක්වා
පී.ඩී.ඩබ්. ජයවර්ධන මහතා	-	අතිරේක ලේකම්, (පරිපාලන හා මූල්‍ය) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා	-	අතිරේක ලේකම් (පර්යේෂණ සංවර්ධන සහ සැලසුම්) අධ්‍යාපන අමාත්‍යාංශය 2010 ජුනි සිට
මාලිනී පීරිස් මහත්මිය	-	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, 2010 මැයි දක්වා
එස්. එදිරිසූරිය මහතා	-	අතිරේක ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය, 2010 මැයි දක්වා
ප්‍රියන්ත මායාදුන්න මහතා	-	අතිරේක ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය, 2010 ජුනි සිට
ආචාර්ය කේ. සමරසිංහ මහතා	-	කෘෂි පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, 2010 ජුනි සිට
මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා	-	කෘෂි පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, 2010 මැයි දක්වා
කේ.එන්. මානකෝට්ටේ මහතා	-	කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, 2010 ජුනි සිට
ආචාර්ය පිනාදරී ද සොයිසා මහත්මිය	-	කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, 2010 මැයි දක්වා
එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මහතා	-	ඉඩම් කොමසාරිස් ජනරාල්
රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා	-	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ඉංජිනේරු ආචාර්ය පී.පී.ඒ. ගොඩලියද්ද මහතා	-	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් 2010 මැයි දක්වා
එච්.පී.එස්. සෝමසිරි මහතා	-	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් 2010 මැයි සිට
ඒ.පී.ජී. කිත්සිරි මහතා	-	සමුපකාර සංවර්ධන කොමසාරිස් ජනරාල්
ඒ.එම්.ගුණවර්ධන බණ්ඩා මහතා	-	ලේකම්, පාලක මණ්ඩලය

පාලක මණ්ඩල රැස්වීම් 2010

රැස්වීම් පැවැත් වූ දින	සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව
01. 2010 ජනවාරි 12	08
02. 2010 මාර්තු 01	08
03. 2010 අප්‍රේල් 22	06
04. 2010 ජුලි 16	09
05. 2010 ඔක්තෝබර් 14	07
06. 2010 දෙසැම්බර් 23	08

සංක්ෂිප්තය

වර්ෂ 2010 වන විට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තිස් අටවැනි සංවත්සරයට පිවිසි යේය. සෑම වසරක ම පෙබරවාරි 21 දිනට යෙදෙන සංවත්සරය සැමරීම සඳහා පසුගිය කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වූ වැඩසටහන් හා සම්බන්ධ පර්යේෂණ සම්මන්ත්‍රණ, ගොවි සමුළු, ප්‍රසිද්ධ දේශන සහ මාධ්‍ය සම්මන්ත්‍රණ සංවිධානය කෙරේ. ආයතනයේ ප්‍රධාන කාර්යයක් වී ඇත්තේ කෘෂි ක්ෂේත්‍රයේ ගැටළු සම්බන්ධව පර්යේෂණ සිදු කරමින් ගොවි ප්‍රජාවේ උන්නතිය උදෙසා එම ගැටළු නිරාකරණය කරගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දැනුම පුළුල් කිරීම යි. පසුගිය 38 වසර තුළ මෙම ආයතනය මගින් පර්යේෂණ අධ්‍යයන 380 ක් සහ පුහුණු වැඩසටහන් 280 ක් පවත්වා ඇත.

පසුගිය වසර තුළ ආයතනයේ කාර්යයන් ලෙස පර්යේෂණ අධ්‍යයනයන් 17 ක් සැලසුම් කර තිබුණි. එකී අධ්‍යයන පාර්ශ්වකරුවන්ගේ උපදෙස් මත තෝරා ගනු ලැබිය. මෙයින් එක් පර්යේෂණ අධ්‍යයනයක් වන්නේ, "පෞද්ගලික සමාගම් විසින් මෙහෙයවන ලද, රජය සතු තේ වතුවල ක්‍රියාකාරීත්වය" යන්නයි. එම අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු නොමැති වූ බැවින් නවතා දමන්නට සිදුවිය. එසේ වුව ද, අනෙක් පර්යේෂණ අධ්‍යයන 16 හි වැඩකටයුතු ආරම්භ කරනු ලැබූ අතර සැලසුම් කළ ආකාරයට ම ඉන් 11 ක් සම්පූර්ණ කොට අවසන් කරන ලදී. තව ද එයින් පර්යේෂණ අධ්‍යයන දෙකක් 2011 වසර තුළ දී අවසන් කිරීමට සැලසුම් කොට ඇත. අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් හේතුවෙන් මෙම අධ්‍යයනයන් අතුරෙන් හතරක් අවසන් කොට නොමැති වුව ද, ඉන් 90% ක වැඩකටයුතු වසර අවසන් වන විට සම්පූර්ණ කර තිබේ. මෙම පර්යේෂණ අධ්‍යයන හා සම්බන්ධ සොයා ගැනීම්, නිගමනයන් හා පැහැදිලි කිරීම් එම වාර්තාවන්හි ඇතුළත් කොට ඇති අතර විස්තරාත්මක තොරතුරු ඒ ඒ අංශ යටතේ දක්වා ඇත.

අඛණ්ඩ පර්යේෂණ අධ්‍යයනයන්ට අමතරව විශේෂ ඉල්ලීම් මත විවිධ අධ්‍යයනයන් සඳහා යොමුවීම පසුගිය වසරේ දී සිදු විය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව අධ්‍යයන දෙකක් සිදු කෙරිණි. ඒවා නම්, "2010 දී වී/සහල්වල තත්ත්වයන්" සහ "කොළඹ එළවළු තොග වෙළෙඳපොලේ සංවිධාන සහ මෙහෙයුම්" යන අධ්‍යයනයන් වේ. සහල් / වී වාර්තාවන්හි විවිධ සහල් පරිභෝජනය කරනු ලබන දිස්ත්‍රික්කවල විවිධත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර තිබේ. එමෙන් ම, සහල් නිෂ්පාදනයේ විවිධත්වයන් විශ්ලේෂණයට ලක් කොට ඇත. එළවළු පිළිබඳ වාර්තාවෙහි 4 වැනි හරස් වීදියේ ධාන්‍ය වෙළෙඳපොළ සමග පවත්නා සම්බන්ධතාවයන් පිළිබඳ ව විශේෂයෙන්ම සඳහන් කර තිබේ. තව ද, ඵලදායි ක්‍රියාකාරීත්වයකට මෙම වෙළෙඳපොළ ද්විත්වය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාගත හැකි බව නිගමනය කර තිබේ.

මෙම පර්යේෂණයන්ට අමතරව පසුගිය වසර තුළ පුහුණු වැඩසටහන් 43 ක් මෙහෙයවා ඇති අතර එම වැඩසටහන් මගින් ගොවීන් ඇතුළු පුද්ගලයින් 3573 ක් පුහුණු කර තිබේ. මෙයට අමතර ව "ග්‍රාමීය පානීය ජලය කළමනාකරණය සහ සනීපාරක්ෂාව පිළිබඳව ජාත්‍යන්තර පුහුණු වැඩසටහනක් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියානු පැසිපික් කලාපීය මධ්‍යස්ථානය (CIRDAP) හා ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය (NIRD) සමග සහයෝගීතාවයෙන් සංවිධානය කිරීමට ආයතනයට හැකිවිය. මෙම පුහුණුවීම්වලදී තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ගොවීන් මුහුණුදෙන ගැටළු ඔවුන් විසින් ම නිරාකරණය කරගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී තිබුණි. මෙය අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ ශක්තිමත් ගොවි සංවිධාන අඩුවීම හේතුවෙන් විවෘත ආර්ථිකය තුළ ගොවි ප්‍රජාවට ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසු නිසා ය. මෙම තත්ත්වය සලකා බැලීමේ දී ගොවි සංවිධාන බලගැන්වීමේ පුහුණු වැඩසටහන් මූලික වේ. මෙම වැඩසටහන යටතේ වඩාත් ප්‍රචලිත වූ වැඩසටහනක් නම් 'සොබාදහමේ ගොවිතැන' පිළිබඳ දැනුවත් කිරීම යි. එම වැඩසටහන අවධානය යොමු කොට ඇත්තේ අපේ මුතුන් මිත්තන් විසින් ඉතා සාර්ථකව යොදා ගනු ලැබූ සාම්ප්‍රදායික වගා ක්‍රමය පිළිබඳව යි. ඉන්දියාවේ පර්යේෂණ ආයතන මගින් සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම අධ්‍යයනය කොට ඒවායෙහි පවතින සාර්ථකත්වය අනුව වගාව සඳහා ගොවීන්ට නිර්දේශ කරනු ලබයි. ශ්‍රී ලංකාවට ද අවශ්‍ය නම් මෙවන් ප්‍රවේශයකට පිවිසිය හැකි ය. ඊට හේතුව පාරම්පරික වගා තාක්ෂණය පරිසර හිතකාමී සහ අඩු වියදම් සහිත වුවක් බැවිනි.

කෘෂිකාර්මික අලෙවිකරණ තොරතුරු සේවාව (AMIS) 1979 වසරේ ක්‍රියාවට නගන ලද අතර නිරන්තරයෙන් සතිපතා / මාසික විවරණිකා ප්‍රකාශයට පත් කරමින්, දෛනික මිල ගණන් මාධ්‍යයට යොමු කරමින් මිල තොරතුරු ආයතනික වෙබ් පිටුවේ හි යාවත්කාලීන කරමින් අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ. ඊට අමතර ව, ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කෙරේ. භාවිතා කරන්නවුන්ගේ පහසුව පිණිස ජංගම දුරකථන ඔස්සේ මිල තොරතුරු ලබාදීමේ අවශ්‍යතාවය ආයතනය මගින් හඳුනාගෙන ඇත. පෞද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් මෙම ව්‍යාපෘතිය දියත් කිරීම ආයතනයේ අපේක්ෂාව යි. ඉන්දියාව, බංගලාදේශය සහ අප්‍රිකානු රටවල් ගණනාවක් ඇතුළත් ව බොහොමයක් රටවල අලෙවි තොරතුරු සේවාව සාර්ථකව ක්‍රියාත්මක වේ. මෑතක දී ලෝක බැංකුව මගින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව, ටැන්සානියාවේ වී ගොවීනට වී. මෙ.ටො. 01 ක් සඳහා අමෙරිකා ඩොලර් 600 ක් ලබා ගැනීමට හැකි වූ බව අනාවරණය කොටගෙන තිබේ. ඊට ප්‍රථමයෙන් එය මෙ.ටො.01 ක් සඳහා අමෙරිකා ඩොලර් 100 ක් විය. ජංගම දුරකථන පදනම් කොට ගත් අලෙවි තොරතුරු පද්ධතිය ක්‍රියාවට නැගීමෙන් පසු මෙම මිල වැඩිවීම සිදු වී ඇත. වෙළෙඳපොළ මිල විශ්ලේෂණය, කෘෂිකාර්මික අලෙවි තොරතුරු සේවාවේ ම අංගයකි. වාර්ෂික වී/සහල් මිල විශ්ලේෂණය මගින් ගොවීනට දුෂ්කර කාල

පරිච්ඡේදයක් වූ 2009 වසර සමඟ සැසඳීමේ 2010 වසරේ මිලෙ හි අඩුවීමක් පෙන්නුම් වෙයි. ප්‍රමාණවත් කළමනාකරණයක් නො පැවතීම මෙය සිදුවීමට හේතු වී තිබුණි. 2010 වී නිෂ්පාදනය වාර්තාගත වුවකි. එය මේ දක්වා අත් කොටගෙන ඇති ඉහළ ම වී නිෂ්පාදනය වන අතර මාස 15 ක කාලයක් සඳහා ජාතියට ආහාර සැපයීමට එය ප්‍රමාණවත් වේ. සැපයුම මනා ලෙස කළමනාකරණය නො කරන්නේ නම් ඉහළ අස්වැන්න වී ගොවියාට හානිදායක වන්නේ කෘෂි බෝගයන්ගේ ස්වභාවික නිෂ්පාදනයේ වැඩිවීමක් සමඟ තියුණු ලෙස මිල ගණන් අඩුවන බැවිනි. සැපයුම කළමනාකරණය කළ හැකි හොඳ ම ක්‍රමය වන්නේ අලෙවි පීඩනය පාලනය කිරීම සඳහා ගොවීනට හා ගොවි සංවිධානයන්ට ණය පහසුකම් ලබාදීම මඟින් ගොවිපළ මට්ටමේ ගබඩා කිරීම් සඳහා දිරි ගැන්වීම යි. එමඟින්, ඉහළ මිලකට අලෙවි කිරීම ඔස්සේ ආදායම වැඩි කරගැනීමට හැකි වේ.

2010 වසරේ එළවළු මිල ගණන්වල තියුණු වැඩිවීමක් දැකිය හැකි විය. බොහෝ එළවළු වර්ගයන්ගේ වාර්ෂික මිල ගණන් කි.ග්‍රෑ. 01 කට රු.100 ඉක්මවා ගොස් තිබුණි. වසරේ අවසන් කාලයේ දී, වෙළෙඳපොලේ රතුළූනු හිඟයක් නිරීක්ෂණය විය. එබැවින්, මිල ගණන් කි.ග්‍රෑ. 01 කට රු.400 ඉක්මවා ගියේ ය. විමසුමට බඳුන් වන කාලපරිච්ඡේදයේ දී මුං සහ කව්පි මිල ගණන් ද අසාමාන්‍ය ලෙස ඉහළ මට්ටමක පැවතිණි. අර්තාපල් ළූනු, මුං සඳහා පැවති ඉල්ලුම ආනයන මඟින් සපුරා ගන්නා ලදී. සහල් නො වන අංශයේ ක්‍රියාකාරීත්වය යහපත් මට්ටමක නො පැවතිණි. මෙම අංශයේ සංවර්ධනයට හරස් වී ඇති ප්‍රධාන බාධක ද්විත්වය වන්නේ තත්ත්වයෙන් අඩු බීජ හිඟය සහ ව්‍යාප්ති සේවාවන් හි පවතින දුර්වලතාවය බව මෙම අංශය පිළිබඳ විමසුමෙ හි දක්වා ඇත. රජයේ බීජ ගම්මාන වැඩසටහන ශක්තිමත් කිරීම අවශ්‍ය ය. ශ්‍රී ලංකාවේ ගොවිපොළ මට්ටමේ පවතින කළමනාකරණ දුර්වලතාවය, විභවතාවය සහ සැබෑ ලෙස ලැබෙන අස්වැන්නේ පරතර මඟින් පෙන්නුම් කරයි. මෙම පරතරය අවම කිරීම සඳහා ව්‍යාප්ති සේවය කඩිනමින් නැවත ස්ථාපනය කිරීම අවශ්‍ය ය. ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල සිදු කෙරෙන පර්යේෂණ මඟින් අනෙකුත් ගොවීන්ට වඩා ව්‍යාප්ති සේවා නිලධාරීන් සමඟ සම්බන්ධ වී ඇති ගොවීන්ට ඉහළ අස්වැන්නක් ලබා ගන්නා බව පෙන්නුම් කරයි.

ආයතනයේ ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීම සඳහා වෙනත් ආයතන සමඟ හවුල්කාරත්වය ගොඩනගාගැනීම එක් ක්‍රමෝපායයකි. සලකා බලන කාලපරිච්ඡේදය තුළ උතුරු පළාතේ දේශීය වශයෙන් අවතැන් වූ පුද්ගලයන්ගේ ආහාර සුරක්ෂිතතා තක්සේරු කිරීමේ සහයෝගිතා කාර්යය ඔස්සේ ලෝක ආහාර වැඩසටහන (WFP) සමඟ හවුල්කාරත්වය ගොඩ නගා ගැනීමට ආයතනයට හැකියාව ලැබුණි. ඊට අමතර ව ශ්‍රී ලංකාව සඳහා ආහාර ආරක්ෂණ අවේක්ෂක පද්ධතියක් ස්ථාපනය කිරීමට ඒකාබද්ධ ව්‍යාපෘතියක් සැලසුම් කෙරෙමින් පවතී. සර්ඩැප් (CIRDAP) හි තාක්ෂණික කමිටු රැස්වීමට සහභාගි වීම සඳහා ඇෆ්ගනිස්ථානයේ සංචාරය කළ කාලපරිච්ඡේදයේ දී ඉන්දියාවේ පිහිටි ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ජාතික ආයතනයේ (NIRD) නිලධාරීන් සමඟ කාර්ය මණ්ඩල හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ පර්යේෂණ හා සම්බන්ධ කරුණ පිළිබඳ ව සාකච්ඡා විය. මෙම සාකච්ඡා සාර්ථක වූ අතර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියානු පැසිපික් කලාපීය මධ්‍යස්ථානය (CIRDAP) හා ලෝක ආහාර වැඩසටහනට (WFP) අමතරව ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ජාතික ආයතනය (NIRD) හෙ.කො.ගො.ප.පු. ආයතනයේ තෙවැනි ජාත්‍යන්තර හවුල්කරු වීමට බොහෝ විට ඉඩ ඇත.

2010 වසරේ ක්‍රියාකාරකම් විස්තර කිරීම ඉදිරි පිටුවලින් සිදුවේ.

ලලිත් කාන්ත ජයසේකර
අධ්‍යක්ෂ

කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

අවසන් කළ අධ්‍යයන

1. **තෝරාගත් වාණිජ බෝග සම්බන්ධව ග්‍රාමීය ණය වෙළෙඳපොළ පිළිබඳ විමර්ශනය**

පර්යේෂණ කණ්ඩායම :	ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා	-	සම්බන්ධීකාරක
	බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය :	ඒකාබද්ධ අරමුදල		

ඉහළ තාක්ෂණය සඳහා ආයෝජනය කළ නොහැකි සුළු ගොවීන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය හා ආදායම ඉහළ නැංවීම සඳහා ණය වැදගත් වූ යෙදවුමකි. මෙය වඩාත් විද්‍යමාන වනුයේ ඉහළ නිෂ්පාදන වියදමක් සහිත වාණිජ බෝගයන් ලෙස සැලකිය හැකි මිරිස්, බී ළූනු සහ අර්තාපල් වැනි වගාවන් සම්බන්ධයෙනි. වාණිජ බෝග වගාවන් හි නියැලුණු බොහෝ ගොවීන් රජය මගින් ආරම්භ කරනු ලැබූ සහනදායී ණය යෝජනා ක්‍රම තිබියදීත් අවිධිමත් ණය ක්‍රම මත යැපෙන තත්ත්වයක් පෙනෙන්නට තිබේ.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙ හි සඳහන් පරිදි ගොවි බැංකුව ශක්තිමත් කිරීම සඳහා වැදගත් වන නිර්දේශ හා මගපෙන්වීම් සකසා ගැනීමේ අරමුණ ද ඇතිව මිරිස්, බී ළූනු හා අර්තාපල් යනාදී වාණිජ බෝගයන් හි ණය වෙළෙඳපොළ අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය ක්‍රියාත්මක කෙරිණි.

මෙම බෝගයන් සඳහා විශේෂිත වූ දිස්ත්‍රික්කයන් හි සිටින ගොවීන් පදනම් කරගත් ප්‍රශ්නමාලා සමීක්ෂණයක් ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කරනු ලැබිණි.

අරමුණු

මෙම අධ්‍යයනයෙ හි මූලික අරමුණ වූයේ ඉහත සඳහන් වාණිජ බෝග හා සම්බන්ධ අවිධිමත් ණය මූලයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ග්‍රාමීය මූල්‍ය වෙළෙඳපොළෙහි හැසිරීම අධ්‍යයනය කිරීම ය. එහි විශේෂිත අරමුණු පහත සඳහන් වෙයි.

- i වාණිජ බෝග වගා කරන ගොවීන් ණය ලබා ගන්නා මූලයන් හි ස්වභාවය සහ වැදගත්කම පිළිබඳව සොයා බැලීම.
- ii ඔවුන්ගේ ණය යෙදවුම් හා නිමවුම් සමග පවත්නා අන්තර් සම්බන්ධතාවය විමර්ශනය කිරීම සහ ඒ හේතුවෙන් ඇති වන සමාජ – ආර්ථික ගැටළු සොයා බැලීම.
- iii තිරසාර පදනමක් තුළ වඩාත් මෘදු ප්‍රවාහයක් ඇසුරින් සුළු ගොවීන්ට ණය ලබා දීම සඳහා යෝග්‍ය ණය ක්‍රමයක් නිර්මාණය කිරීම අරබයා යෝජනා හා මූලික මගපෙන්වීම සැපයීම.

නිමැවුම

සොයා ගැනීම් සහ නිර්දේශ සහිත පළමු කෙටුම්පත සකස් කර ඇත.

සොයා ගැනීම්

- i ඉහත සඳහන් වාණිජ බෝගයන් වගා කරන ගොවීන්ගෙන් බහුතරයක් එනම් බී ළූනු ගොවීන්ගෙන් 85% ක්, මිරිස් ගොවීන්ගෙන් 90% ක් සහ අර්තාපල් ගොවීන්ගෙන් 95% ක් වගාව සඳහා ණය ලබා ගෙන ඇති අතර එමගින් තවදුරටත් ණයවල ඇති වැදගත්කම තහවුරු වේ.

- ii මිරිස් සහ අර්තාපල් බෝගයන් හි එක් ගොවියකු ලබාගත් සාමාන්‍ය ණය සංඛ්‍යාව 3 ක් වූ අතර බී ළූනු සඳහා එය 2 ක් වේ. මෙම තත්ත්වය විවිධ දිස්ත්‍රික්ක, ග්‍රාමීය හා නාගරික වශයෙන් ද නොවෙනස්ව පැවතිණි.

iii එක් ගොවි පවුලක් ලබාගත් ණය ප්‍රමාණයෙහි සාමාන්‍යය බෝග, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය, නාගරික වශයෙන් වෙනස් වූ අතර එහි සාමාන්‍යය මිරිස් සඳහා රු.261,128 ක්, බී ළූනු සඳහා රු.70,629 ක් සහ අර්තාපල් සඳහා රු.177,477 ක් ලෙස දැක්වේ.

iv මෙම බෝගයන් වගා කරන ගොවීන් සැලකූ විට මුදල්, ද්‍රව්‍ය සහ සේවා යන තුන් ආකාරයෙන් ම ණය ලබා ගැනීම සිදු කර ඇත. ලබාගත් මුළු ණය ප්‍රමාණයෙන් මතු වී පෙනෙනුයේ මුදල් ලෙස ලබාගෙන ඇති ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතය 79% ඉක්මවා ඇති ආකාරයකි. ද්‍රව්‍ය සහ සේවා ණය ප්‍රමාණ සැලකූ විට පිළිවෙළින් 22% සහ 1% ට වඩා අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කරයි.

v ණය ලබාගත් විවිධ වූ මූලයන් සලකා බැලීමේ දී විධිමත් ලෙස ණය දෙන ආයතනයන්ගෙන් ණය ලබා ගැනීම මූලිකත්වයක් ගෙන ඇති අතර එය 85% ක ප්‍රතිශතයක් පෙන්වයි. ලබාගෙන ඇති ණයවල වටිනාකම අනුව සලකා බැලූවිට බෝග තුන සම්බන්ධයෙන් ම විධිමත් ආයතනයන්ගෙන් ලබාගත් ණය 90% ක් තරම් ඉහළය.

vi ණය මුදාහරින විවිධ වූ ණය මූලාශ්‍රයන් අතර ලංකා බැංකුව, මහජන බැංකුව වැනි රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකුවලට වඩා ජනප්‍රියතාවයක් පෙන්වයි. රජයේ බැංකුවල ඇපකරුවන් ලෙස ගොවි ප්‍රජාවෙහි දෙදෙනෙකුගේ අත්සන ප්‍රමාණවත් වීම, සුළු ගොවීන් මේ සඳහා මහත් නැඹියාවක් දැක්වීමට ප්‍රධාන හේතුවක් වී තොමැත.

vii ප්‍රධාන ණය ලබා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස ගොවිජන බැංකුව පිළිගැනීමට ලක් නො වීමට හේතුවක් ලෙස ගොවීන් සඳහන් කර ඇත්තේ එමඟින් ගොවියකු සඳහා සපයන උපරිම ණය මුදල රු.25,000 ක් වැනි සුළු ප්‍රමාණයක් වීම යි. ගොවිජන බැංකුවේ ක්‍රියාකාරීත්වය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව ගොවීන් අතර වූ නොදැනුවත්භාවය මත ගොවිජන බැංකු සාමාජිකත්වය ලබා නො ගැනීම ද මීට හේතු වූ අනෙකුත් කරුණු වේ.

viii මිරිස් සහ බී ළූනු වගාවන් සඳහා ණය නිකුත් කිරීමේ දී මරණාධාර සමිති, ගොවි සංවිධාන, කාන්තා සමිති සහ වෙනත් සුභසාධක සංගම් වැනි ප්‍රජා සංවිධානයන් ද පිළිවෙළින් ඉහළ දායකත්වයක් ලබා දී ඇත. මිරිස් සහ බී ළූනු ගොවීන් වෙත නිකුත් කර ඇති ණය සංඛ්‍යාවෙන් පිළිවෙළින් 16% ක් සහ 8% ක් සපයා ඇත්තේ මෙවැනි ප්‍රජා සංවිධානවලිනි.

ix මෙම බෝග වර්ගයන් තුන නිෂ්පාදනයේ දී වඩාත් ජනප්‍රිය ණය ලබා ගැනීමේ ක්‍රමය වී ඇත්තේ රන්භාණ්ඩ උකස් කිරීම යි. මෙම බෝග තුන වෙනුවෙන් ලබාගත් ණයවල වටිනාකම මුළු ණයවලින් 25% ක් ද, මුදල් ණය වලින් 35% ක් ද වේ. වෙනත් ණය ක්‍රමවලට වඩා මෙය ප්‍රචලිත වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සාමාන්‍ය ගොවි ණය ලබා ගැනීම සඳහා ගොවීන් සතුව වෙනත් සුරැකුම් නොමැතිකම, රත්‍රං උකස්කර මුදල් ලබා ගැනීම වෙනුවෙන් ගත කළ යුත්තේ කුඩා කාල පරාසයක් වීම සහ ඒ වෙනුවෙන් යෙදවිය යුතු මූලික පිරිවැය අවම වීමත් ය.

x අවිධිමත් ලෙස ණය ලබාගැනීමේ දී ණය සහ යෙදවුම් මෙන් ම ණය සහ නිපැයුම් අතර ද අන්තර් සම්බන්ධතාවයක් පවතී. නමුත් වත්මන් තාක්ෂණ දියුණුව ද සමග ගොවීන්ගේ නිපැයුම් සඳහා නියමිත මිල පිළිබඳව තොරතුරු ලබාගත හැකි පසුබිම් නිර්මාණය වී ඇති හෙයින් ඉහත දැක්වූ අන්තර් සම්බන්ධතාවයන්හිදී හානිකර ප්‍රතිඵල ඇතිවීම අවම වීමක් නිරීක්ෂණය කළ හැක.

xi වෙනත් මාර්ගයන්ගෙන් ණය ලබාගැනීම වෙනුවෙන් යෙදිය යුතු පිරිවැය, සපයා ගැනීමට ගතවන කාලය යනාදියට සංසන්දනාත්මකව රන් උකස් සේවාවෙන් ණය ලබාගැනීම වඩාත් වාසිදායක ලෙස ගොවීන් පිළිගෙන ඇත.

xii අඩු පිරිවැයක් යටතේ වඩා පහසුවෙන් ණය ලබා ගතහැකි ක්‍රමයක් නිසා ගොවි බැංකුව ඔවුන්ගේ ණය අවශ්‍යතා සපුරන ආයතනයක් ලෙස ශක්තිමත් කළ යුතුය යන්න ගොවීන්ගේ අදහසයි.

නිර්දේශ

i වෙනත් විධිමත් මූලාශ්‍ර මඟින් ණය ලබා ගැනීමේ දී දීර්ඝ කාලයක් බලාසිටිය යුතු වීම, ඒ හා අදාළ විවිධ කාර්යයන් වෙනුවෙන් වැඩි කාලයක් මිඩංගු කළ යුතුවීම සහ ණය ලබාගැනීම සඳහා දැරිය යුතු පිරිවැය සාපේක්ෂව ඉහළ අගයක පැවතීම ආදී හේතු නිසා ඊට විකල්ප ණය මූලාශ්‍රයක් ලෙස ගොවි බැංකුව හඳුන්වාදිය යුතු ය.

ii සාමාජික නොවන ගොවි පවුල් අතර ගොවි බැංකුව පිළිබඳවත්, එහි ප්‍රතිලාභ පිළිබඳවත් දැනුවත්භාවය ඇති කිරීමෙන් ගොවි බැංකුවෙහි ණය සැපයුම් ජාලය ප්‍රතිසංවිධානය කළ යුතුව ඇත.

iii වාණිජ ආහාර බෝග වගාවලට ගොවීන්ගේ ණය අවශ්‍යතාවයට සරිලන පරිදි ගොවි බැංකුවෙන් ණය ලබාදීම සඳහා මෙම බැංකු සවිමත් කළ යුතුය. සාමාජික සංඛ්‍යාව ඉහළ නැංවීම, ඉතිරිකිරීම් සඳහා දිරිදීම, කොටස් නිකුතුව වැඩි කිරීම වැනි ක්‍රම ඒ සඳහා අනුගමනය කළ හැක.

iv දැනුවත්භාවය ඇති කිරීම හා සමාජ සජීවීකරණය තුළින් කුඩා කණ්ඩායම් වඩාත් හොඳින් ක්‍රියාත්මක වන ඒවා බවට පත්කළ හැක. මේ මගින් කණ්ඩායමෙ හි සියළු ක්‍රියාකාරකම් වෙනුවෙන් සියළු ම සාමාජිකයන් තුළ සාමූහික හැඟීමක් ඇති කළ හැක.

v ගොවි බැංකුව සවිමත් කිරීම සහ එහි එදිනෙදා කටයුතු කරගෙන යාම සඳහා කෘ.ප.නි.ස. වරුන්ගේ සජීවී දායකත්වයක් ලබා ගත යුතු අතර ඔවුන් යෙදවීම තුළින් අඩු කාලයක් හා අඩු පිරිවැයක් යටතේ ගොවි ණය ලබා දීමට කටයුතු කළ යුතුය.

vi ඕනෑම බෝගයක් සඳහා ගොවිජන බැංකුවෙ හි වර්තමානයේ පවතින උපරිම ණය මුදල වන රු.25,000 ප්‍රදේශයන් අනුව බෝගයට සරිලන පරිදි වෙනස් විය යුතු ය. සෑහීමකට පත්විය හැකි අරමුදල් ප්‍රමාණයක් පවතින සමහර ගොවි බැංකු ශාඛාවන්ට ණය දීම සම්බන්ධව පවතින මෙම සීමාව, ප්‍රමාණවත් ණය මුදලක් ලබා දීමේදී අවහිරයක් වී ඇත.

vii ගොවි බැංකුව මගින් ණය දීමේ දී එම මුදලට යෙදවුම් ලබා ගැනීම අනිවාර්ය කර ඇතත්, තමන් රිසි පරිදි විවිධ වූ ආකාරයන්ගෙන් මිශ්‍රිත කෘමි නාශක/වල් නාශක යොදන්නාවූ ගොවීන්ට එය බරපතල ගැටළුවක් බවට පත්ව ඇති නිසා එසේ ද්‍රව්‍යමය වශයෙන් ණය ලබාදීම අනිවාර්ය නො කළ යුතුය.

viii අර්තාපල් වගා කරන ප්‍රදේශයන් හි ගොවි සංවිධාන සහ මරණාධාර සමිති වැනි වෙනත් ප්‍රජා සංවිධාන ඉතිරිකිරීම් සහ ණය දෙනු ලබන සංවිධාන ලෙස සජීවීකරණය කළ යුතුය.

2. අඳ ගොවීන්ගේ වර්තමාන තත්ත්වය

පර්යේෂණ කණ්ඩායම :	ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	සම්බන්ධීකාරක
	එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මෙනවිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය :	ඒකාබද්ධ අරමුදල්		

විෂය ක්ෂේත්‍රය

මෙරට සුළු ගොවි ක්ෂේත්‍රයේ වඩාත් විවාදයට භාජනය වූ කරුණක් වන අඳ ගොවි ක්‍රමය මෑත කාලයේ සිට බරපතල ගැටළුවක් බවට පත්ව ඇත. අස්වද්දන ලද මුළු කුඹුරු ප්‍රමාණයෙන් 13% කට ආසන්න ප්‍රමාණයක් පුරා පැතිර පවත්නා අඳ ගොවි ක්‍රමය 2000 දී සම්මත කරන ලද අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත නිසා වඩාත් මාතෘකාවට භාජනය විය. අඳ ගොවියාගේ දරුවන්ට එය උරුම වීමේ අයිතිය නො ලැබීමත් සමග අඳ ගොවීන් හා කුඹුරු හිමියන් අතර, ඒවායේ අයිතිය පිළිබඳ ගැටළු මතු වී ඇත. මෙය ප්‍රතිපත්ති සම්පාදකයින් පමණක් නොව දේශපාලඥයින් අතර ද වඩාත් විවාදයට භාජනය වූ කරුණක් බවට පත් විය. අදාළ ගැටළුව පිළිබඳ නිවැරදි තීරණ ගැනීම සඳහා අඳ ගොවිතැන පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නොමැත. එම අඩුව පිරවීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිණි.

අරමුණු

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ වර්තමාන ශ්‍රී ලංකාවේ අඳ භුක්ති ක්‍රමයේ ක්‍රියාත්මකභාවයත් අඳ ගොවීන් හා ඉඩම් හිමියන්ගේ සමාජ-ආර්ථික පසුබිම හා ඔවුන් මුහුණපා ඇති ගැටළු අධ්‍යයනය කිරීමත් වඩාත් සුරක්ෂිතවූ ගොවිජන සේවා පනතක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීමත් ය. මාතර, අනුරාධපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව අඳ ගොවීන් හා ඉඩම් හිමියන් සමග සිදු කරන ලද ප්‍රශ්නාවලි සමීක්ෂණයක්, මගින් මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී. කණ්ඩායම් සාකච්ඡා හා ප්‍රධාන පුද්ගල සාකච්ඡා මගින් අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගන්නා ලදී.

විශේෂ අරමුණු

i අඳ ගොවීන් සහ ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය විමසා බැලීම.

ii 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමෙන් පසු අඳ භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ප්‍රශ්න සහ ගැටලු හඳුනා ගැනීම.

iii එම ගැටළුවලට පිළියම් ලෙස දැනට යෝජිත පනත් කෙටුම්පත පිළිබඳ අඳ ගොවීන්, ඉඩම් හිමියන් හා ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීම.

iv අඳ ගොවියාත් ඉඩම් හිමියාත් යන දෙපක්ෂයම තෘප්තියට පත් වන ආකාරයේ තිරසාර අඳ භුක්ති ක්‍රමයක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම.

නිමැවුම

මෙම අධ්‍යයන පදනම් කරගනිමින් වාර්තාවක් සකස් කරන ලද අතර ඊට අමතරව ආයතනය මගින් පළකරනු ලබන ගොවි කටයුතු අධ්‍යයන වාර ප්‍රකාශනය සඳහා ලිපියක් ද සකස් කර ඇත. එහි සොයා ගැනීම් හා නිර්දේශ අදාළ ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ඉදිරිපත් කරනු ලැබිණි.

සොයා ගැනීම්

i සමීක්ෂණයට ලක් කළ අඳ ගොවීන් අතරින් බහුතරයක් (79%) අවුරුදු 52 ඉක්මවූ අය වන අතර ඉඩම් හිමියන් අතරින් 61% ක් අවුරුදු 55 ඉක්මවූ අය වෙති.

ii සමීක්ෂණයට ලක් කළ අඳ ගොවීන් අතරින් බහුතරයක් එනම් 57% ක් එක් ඉඩම් හිමියකු යටතේ පමණක් අඳ ක්‍රමයට වගා කරන බව වාර්තා විය.

iii හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්කවල සමීක්ෂණයට ලක් කරන ලද අඳ ගොවීන්ගෙන් බහුතරයක් එනම් පිළිවෙළින් 93% ක් හා 77% ක් ප්‍රධාන ජීවනෝපාය ලෙස ගොවිතැනේ යෙදී සිටින අය වෙති. කෙසේ වුව ද මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැනේ නිරත වන අඳ ගොවීන් ප්‍රමාණය සාපේක්ෂව අඩු අගයක් (69%) වන අතර මෙයට හේතුව ඔවුන්ගේ කුඹුරු සාපේක්ෂව කුඩා වීම හා අතිරේක රැකියා මාර්ගයක් ලෙස ගොවිතැනේ නිරත වීම ය.

iv ප්‍රවේණිය ගෙවීම සම්බන්ධව රටේ විවිධ ප්‍රදේශවල විවිධ සම්මුතීන් පවතින අතර අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර මේ පිළිබඳව එකගතාවයක් නොමැත.

v අඳ ගොවියා මිය ගිය පසු අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමට දැනට පවතින පනත මගින් හැකියාවක් නොමැති නිසා ගැටළු මතු වී ඇත.

vi මේ හේතුවෙන් ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම සම්බන්ධ ආරවුල් විශාල වශයෙන් වාර්තා වන අතර අඳ ගොවීන් විසින් ඉඩම් හිමින්ට ප්‍රවේණිය නිසි පරිදි ගෙවීම සිදු නො වන බව ද වාර්තා විය.

නිර්දේශ

i අඳ ගොවීන් සහ ඉඩම් හිමියන් මුහුණපාන ගැටළු විසඳීම සඳහා ගොවිජන විනිශ්ච සභාව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

ii නව පනත 2000 සිට බලාත්මක කිරීම මගින් මෙතෙක් අසාධාරණයට ලක්වූවන්ට සාධාරණයක් ඉටුකිරීම සිදුකළ යුතු ය.

iii අලුතින් උපරිම වගා ඉඩම් සීමා නියම නොකර දැනට වගා කරන ඉඩම් ප්‍රමාණයන් ම වගා කිරීමට අඳ ගොවීන්ට අයිතිය ලබා දිය යුතුය.

iv අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර ඇතිවන එකගතාවයක් මත අඳ ගොවියාගෙන් පසු අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

v රජයේ තක්සේරු වටිනාකමක් යටතේ ඉඩම් හිමියා හා අඳ ගොවියා යන පාර්ශ්ව දෙකෙන් කැමති එක් පාර්ශවයකට අයිතිය නිශ්චිත වන සේ කුඹුරු ඉඩම මිලදී ගැනීමට ඉඩ සලසා දිය යුතු ය.

vi අද ක්‍රමය යටතේ වගා කරන ඉඩම් මිලදී ගැනීමට ණය පහසුකම් අවශ්‍ය ගොවීන්ට ඉඩම් බැංකු ක්‍රමයක් යටතේ සහනදායි පොළියට ණය පහසුකම් සපයා දිය යුතුය.

vii ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් සතු බලතල විමධ්‍යගත කර ගම් මට්ටමේ නිලධාරීන්ට අඳ ඉඩම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වැඩි බලතල ලබා දිය යුතුය.

3. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ව්‍යාප්ති සේවය සුළු ගොවි අංශය කෙරෙහි බලපෑම

පර්යේෂණ කණ්ඩායම : එම්. ඩී. සුසිලා ලුරදු මහත්මිය - සම්බන්ධීකාරිකා

එස් ඇපාසිංහ මහතා - සම පර්යේෂක

සාගරිකා හිටිහාමු මහත්මිය - සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය : ඒකාබද්ධ අරමුදල

විෂය ක්ෂේත්‍රය

ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ කෘෂිකාර්මික තොරතුරු හා දැනුම පිළිබඳ වු අවශ්‍යතාව සපුරා ලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රමෝපායන් භාවිතා කරමින් 2004 වර්ෂයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික්ක 21 ක් තුළ සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක නමින් ග්‍රාමීය ගොවීන්ට කෘෂි දැනුම හා තොරතුරු ලබා ගැනීමේ ඒකක 55 ක් ස්ථාපිත කරන ලදී. මෙම ඒකකයන් හි ක්‍රියාකාරීත්වය පිළිබඳ වර්තමාන තත්ත්වය හා එහි ප්‍රගතිය පිළිබඳ ඇගයීමත් එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ගොවීන්ගේ යෝජනා සොයා බැලීමත් මෙම අධ්‍යයනයේ අපේක්ෂාව විය.

අරමුණු

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ක්‍රියාකාරීත්වය, වර්තමාන ප්‍රගතිය හා ගොවි ප්‍රජාව වෙත එහි ඇති බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම

විශේෂ අරමුණු

i ස්ථාපිත කර ඇති සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකවලින් කෙතරම් ප්‍රමාණයක් සාර්ථකව පවත්වාගෙන යන්නේ ද යන්න සොයා බැලීම.

ii මෙම ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය සහ ඔවුන් එම තොරතුරු කෙතරම් දුරට භාවිතා කරන්නේ ද යන්න සොයා බැලීම.

iii ගොවීන් මෙම ඒකක හරහා ලබාගෙන ඇති දැනුමේ ස්වභාවය සහ ඔවුන්ට එයින් ලැබුණු ප්‍රයෝජනවත්භාවය පිළිබඳ අධ්‍යයනය කිරීම.

iv ඒකක හරහා සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ ඒකක පවත්වා ගැනීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විමසා බැලීම.

v ඒකක ප්‍රයෝජනවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සිදු විය යුතු සංශෝධන පිළිබඳව නිලධාරීන්ගේ හා ගොවීන්ගේ අදහස් විමසීම.

vi සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක සාර්ථකව ක්‍රියාත්මක කරවීම තුළින් ග්‍රාමීය ව්‍යාප්ති සේවයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීම.

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක අතරින් දිස්ත්‍රික්ක 03 ක් තුළ අධ්‍යයනය සිදු කෙරිණි. එම දිස්ත්‍රික්ක 03 හි ස්ථාපිත සයිබර් ඒකක 09 කට අදාළව ගොවීන් 181 දෙනෙකුගේ නියැදියක් සමීක්ෂණයට පාදක විය. එම

නියැදිය සයිබර් ඒකක හරහා සේවය ලබා ගත් ගොවීන් 90 ක් සහ සේවය ලබා නො ගත් ගොවීන් 91 දෙනෙකුගෙන් සමන්විත විය.

නිමැවුම

මෙම අධ්‍යයනය මගින් ලබා ගත් තොරතුරු හා සොයා ගැනීම් පාදක කරගනිමින් පර්යේෂණ වාර්තාවක් සකස් කළ අතර එමගින් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

සොයාගැනීම්

i ගොවීන්ගෙන් 58% ක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ සයිබර් ඒකකයක් පිහිටුවා ඇති බව නො දනී. සයිබර් ඒකකයක් පිහිටුවා ඇති බව දන්නා පිරිසෙන් ද 64.6% ක් එයින් තමන්ට සේවයක් ලබා ගත හැකි බව නොදනී.

ii සයිබර් ඒකකය හරහා ලබා ගත් දැනුම සේවය ලබාගත් ගොවි නියැදියෙන් 97% කට ප්‍රයෝජනවත් වී ඇත. එසේ ප්‍රයෝජනවත් වූ ගොවීන්ගෙන් 68% කට තමන්ගේ ගොවිතැනින් ලැබූ අස්වැන්න ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි වීමෙන් ආදායම් ඉහළ ගොස් ඇත.

iii 51% ගොවීන් දැක්වූ පරිදි සයිබර් ඒකකයට පැමිණෙන විට ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයා ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත වීම, සේවය ලබා ගැනීමේ දී ගැටලුවක් වී ඇත.

iv සයිබර් ඒකකයන් හි සාර්ථකත්වය පිළිබඳ නිලධාරීන්ගේ අදහස් විමසීමේ දී ඔවුන්ගෙන් 64.6% ක් සඳහන් කලේ සයිබර් ඒකක සාර්ථකව ක්‍රියාත්මක නො වන බව යි.

v 67% ක් නිලධාරීන් සඳහන් කළ පරිදි ඒකකය පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුවත්භාවය නිසා ගොවීන්ගේ සහභාගිත්වය අඩු වීම අසාර්ථකත්වයට බලපෑ ප්‍රධාන හේතුව වී ඇත.

නිර්දේශ

i සයිබර් ඒකක පිළිබඳ දීපව්‍යාප්ත මට්ටමින් ගොවීන් දැනුවත් කිරීම.

ii ගොවීන්ට මෙන් ම නිලධාරීන්ට ද පහසු වන සේ සයිබර් ඒකක සඳහා ම වෙන් වූ කෘෂිකාර්මික හා පරිගණක දැනුම සහිත පුද්ගලයෙකු පත් කිරීම.

iii සයිබර් ඒකකවල උපකරණ අලුත්වැඩියාව සහ වෙනත් නඩත්තු කටයුතු සඳහා කඩිනම් ප්‍රතිපාදන ලබා ගත හැකි ක්‍රමවේදයක් සකස් කර එහි අධීක්ෂණය දෙපාර්තමේන්තු මට්ටමේ ඉහළ නිලධාරියෙකු යටතට පත් කිරීම.

iv සයිබර් ඒකකය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හරහා ගොවියාට ඉතාමත් පහසුවෙන් පරිහරණය කළ හැකි මෙන් ම ඒකකය හා සමඟ සමීප සබඳතාවයක් ගොඩනගා ගත හැකි ගොවිජන හිතකාමී මට්ටමේ ස්ථානයක් බවට සයිබර් ඒකකය සකස් කිරීම.

v ඒකකය හරහා දෛනික වෙළෙඳපොළ මිල ගණන් හා මිල තත්ත්වයන් හඳුනාගැනීමට ගොවීන්ට පහසුකම් සැලසීමේ ඒකකයක් බවට එය පත් කිරීම.

අනෙකුත් ක්‍රියාකාරකම්

i "ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ වී වගාවෙහි ආර්ථික නිදහස්කරණය හා ක්ෂුද්‍ර ණය විවරණය තුළින් ප්‍රතිපත්ති සම්පාදනය" යන මැයෙන් ජෙන්ඩර් ඇන්ඩ් සෝෂල් ඉෂුෂ් සඟරාවෙහි 2007 අංක 1 වෙළුම 6 සඳහා ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා විසින් ලිපියක් සකස් කරනු ලැබිණ.

ii. ශ්‍රී ලංකා පරිපාලන සහ සංවර්ධන පරිපාලන ආයතනය මගින් 2010 ඔක්තෝබර් 25-29 දක්වා පැවැත්වූ 'පුහුණුකරුවන් පුහුණු කිරීම' යන පුහුණු වැඩසටහන සඳහා එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මෙනවිය, බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මිය සහ කේ.පී.අයි. ප්‍රියදර්ශනී මෙනවිය යන අය සහභාගී වූහ.

iii කොළඹ විශ්ව විද්‍යාලයෙ හි භූගෝල විද්‍යා අංශයේ ජනගහන සංගමය, මගින් 2010 දෙසැම්බර් 3-5 දක්වා පවත්වන ලද පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ කෙටිකාලීන පාඨමාලාවක් සඳහා බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මිය සහ කේ.පී.අයි. ප්‍රියදර්ශනී මෙනවිය සහභාගි වූහ.

iv වර්ෂ 2010 දෙසැම්බර් මස 10 දින කොළඹ විශ්ව විද්‍යාලයේ දී පැවැත්වූ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයෙ හි වාර්ෂික සමුළුව වෙනුවෙන් 'ශ්‍රී ලංකාවේ කෘෂි අංශය තුළ රාජ්‍ය වියදම් විවරණය මැයෙන්' පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මෙනවිය විසින් සිදු කරන ලදී.

v "ශ්‍රී ලංකාවේ අද ගොවි ක්‍රමයෙහි වර්තමාන තත්ත්වය" යන මැයෙන් ගොවි කටයුතු අධ්‍යයන සඟරාව සඳහා ආර්.එල්.එන්. ජයතිස්ස මහතා සහ එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මෙනවිය විසින් ලිපියක් සපයන ලදී.

vi ගොවිකටයුතු අධ්‍යයන 2009 8 වෙළුම 1 කලාපය සඳහා සුසිලා ලුර්දු මහත්මිය විසින් "කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා ග්‍රාමීය මට්ටමේ ගොවි අවශ්‍යතා සපුරාලීමට සුදුසු නියෝජිතයෙක්ද" මැයෙන් ලිපියක් සපයන ලදී.

කෘෂි සම්පත් කළමනාකරණ අංශය

අවසන් කළ අධ්‍යයන

1. **අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් "පැරෂුට් තාක්ෂණයට" කෙරෙහි අනුගත වී ඇති රටාව හඳුනාගැනීම හා රටේ අනෙකුත් ප්‍රදේශවලට මෙම තාක්ෂණය ව්‍යාප්ත කිරීම නිර්ණය කරන්නා වූ සංඛ්‍යාත හඳුනාගැනීම**

පර්යේෂණ කණ්ඩායම	: පී.ආර්. වීරක්කොඩි මහත්මිය	-	සම්බන්ධීකාරිකා
	එස්.කේ. කුමාර මහත්මිය	-	සම පර්යේෂිකා
	ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	: ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් අනුගත වී සිටින "පැරෂුට් තාක්ෂණය" පිළිබඳ ව අවබෝධයක් ලබාගැනීම සහ රටේ අනෙකුත් ප්‍රදේශවලට මෙම තාක්ෂණය ප්‍රචලිත කිරීමෙන් එය භාවිතයට ගත හැකි ද යන්න තහවුරු කරගැනීම මෙම අධ්‍යයනය මඟින් සිදු කෙරිණි.

අරමුණු

මෙම තාක්ෂණය නිසි ලෙස තක්සේරු කර උතුරු මැද පළාත තුළ භාවිතයට ගැනීම යෝග්‍ය දැ'යි අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණයි.

විශේෂ අරමුණු

i උතුරු මැද පළාත සඳහා තෝරා ගන්නා ලද මෙම තාක්ෂණය ආරෝපණ ගත කිරීමේ දී ඇති වන්නා වූ ආකල්පිත හා චර්යාත්මක ලක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය කිරීම.

ii ඉහත සඳහන් තාක්ෂණය ආරෝපණය කිරීමේ දී ඇතිවන්නා වූ බාධකයන් හා දුර්වලකම් හඳුනාගෙන ඒ සඳහා සුදුසු ප්‍රතිපත්ති උපදේශකයන් නිර්දේශ කිරීම.

සොයා ගැනීම්

i මහවැලි ගොවීන් විසින් යොදා ගෙන තිබෙන මෙම "පැරෂුට් තාක්ෂණය" ඉතා සාර්ථක ය. ද්විතීය ප්‍රවර්ධන විශ්ලේෂණයට අනුව මෙම තාක්ෂණය ආරෝපණය කිරීම සඳහා තීරණ ගැනීමේ දී ඒ සඳහා යොදාගැනෙන විශ්ලේෂණාත්මක සාධකයන් හයක් වේ. තව ද ගොවීන්ගේ නිපුණතාවයන්, ශ්‍රම සම්පත, සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය සහ අමුද්‍රව්‍ය ලබාගැනීමේ අවකාශය "පැරෂුට් තාක්ෂණය" ආරෝපණය කිරීමේ දී සැලකිය යුතු බලපෑමක් සිදු කරයි.

ii මෙම තාක්ෂණය ආරෝපණය කිරීමේ දී අත්‍යාවශ්‍ය සාධකයන් වන්නේ අමුද්‍රව්‍ය ලබාගැනීමේ අවකාශය සහ ප්ලාස්ටික් තැටි (බන්දේසි) වේ. ක්ෂේත්‍ර කටයුතුවල දී ගොවීන්ගේ නිපුණතාවයන් ඉතා අත්‍යාවශ්‍ය සාධකයකි. පැළ තවාන් කළමනාකරණයේ දී මෙම තාක්ෂණය භාවිතා කළ හැකි නිපුණ ශ්‍රමිකයින් සඳහා වැඩි ඉල්ලුමක් පවතියි.

iii පැළ තවාන් කරන කාලය තුළ දී "පැරෂුට් තාක්ෂණය" සඳහා ජලය ඉතා අත්‍යාවශ්‍ය සාධකයක් වේ. තව ද මහවැලි කලාපය තුළ ජල හිඟතාවයක් නොපවතියි. එහෙයින් එය එතරම් ව බලනොපානු ඇත. "පැරෂුට් තාක්ෂණය" ආරෝපණය කිරීමේ දී පළාත් නියතයන් තුළ දිස් වූ ප්‍රධානතම සාධකයක් ලෙසට ජල හිඟය සැලකිය හැකි ය.

iv "පැරෂුට් තාක්ෂණය" තුළින් දිස්වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ බීජ අංකුර ශක්තිමත් කිරීම, ධාන්‍ය ප්‍රමාණයන් වැඩි කිරීම සහ වැඩි අස්වනු නෙළා ගැනීමයි. මහවැලි කලාපය තුළ විශ්ලම්භ ප්‍රාන්තරයට අනුව සැසඳීමේ දී වැපුරුම් ක්‍රමයට අනුව නෙළාගත් 79% ක අස්වැන්නට වඩා "පැරෂුට් තාක්ෂණය" භාවිතය මඟින් 95% කට වැඩි අස්වැන්නක් නෙළා ගැනීමට ගොවීන්ට හැකි වී තිබේ.

v දැනුම සහ ශිල්පීය ඌනතාවයන් සහ අමතර සේවාවන් වන ආදර්ශ වැඩසටහන්, සහ දැනුම පුළුල් කිරීමේ දැනුවත් කිරීමේ පුළුල් වැඩසටහන්වල ප්‍රමාදය, අමුද්‍රව්‍යයන් භාවිතය පිළිබඳ ගොවීන්ගේ අවම දැනුම, සේවක හිඟය, කෘෂි උපදේශකයින්ට විශාල ප්‍රමාණයක් ආවරණය කිරීමට සිදුවීම, ගොවිබිම්වලට පැමිණෙන වාර ගණන සීමාවීම, ක්ෂේත්‍රයට තාක්ෂණය ආරෝපණය කිරීම පිළිබඳ වැඩසටහන් නොමැතිවීම යන සාධකයන් නිසා මෙම තාක්ෂණය ආරෝපණය කිරීම කෙරෙහි බාධාවන් පැන නැඟී තිබේ.

vi "පැරැණුට් තාක්ෂණය" අවසානයේ භාවිතා කරන පොදු සහ නියත පුද්ගලයින් තුළ තිබෙන ඍණාත්මක ආකල්පයන් නිසා මෙම තාක්ෂණය ව්‍යාප්ත වීම ඇනහිට තිබේ.

vii අමතර සේවාවන්වල සාමාන්‍ය භාවිතයන්ට අනුව ගොවිබිම්වල ක්‍රියාත්මක වූ ආදර්ශනාත්මක වැඩසටහන් හරහා අවම අඩුපාඩු යටතේ වුව ද මෙම තාක්ෂණය ආරෝපනය කිරීමේ උවමනාවක් ගොවීන් තුළ තිබිණ. ගොවි සාමාජිකයන් අතර අදාළ තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා මෙම වැඩසටහන සාර්ථක ක්‍රමයක් ලෙස සමීක්ෂණ වාර්තාවලින් තහවුරු වී ඇත.

viii සමස්තයක් ලෙස ගෙන බැලුව හොත් ගොවි ප්‍රජාව තනි තනිව, කාණ්ඩ වශයෙන් සහ පුළුල් ලෙස දැනුවත් කිරීම ප්‍රමාණාත්මකව සිදු වී නොමැති වීම, වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ අවම දැනුමක් ගොවි ප්‍රජාව තුළ තිබීම, නව තාක්ෂණය බෙදා හැරීමේ නිසි ක්‍රමවත් බවක් නො තිබීම යන සාධක වත්මන් කළමනාකරණය මුහුණ දෙන ගැටළු වේ.

නිමැවුම

හෙක්ටර කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සොයා ගන්නා ලද තාක්ෂණික සාධකයන් ප්‍රකාශයට පත් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකඟ විය.

2. හාල්පිටි කර්මාන්තය පිළිබඳ වත්මන් තත්ත්වයන්

පර්යේෂණ කණ්ඩායම	:	පී.ආර්. වීරක්කොඩි මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		එස්.කේ. කුමාර මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

හාල් පිටි කර්මාන්තයේ නියැළී සිටින තෝරාගත් මහා පරිමාණයේ, මධ්‍යම පරිමාණයේ සහ සුළු පරිමාණයේ ව්‍යාපාරිකයන් සමග සාකච්ඡා කර හාල් පිටි කර්මාන්තය නංවාලීමේ අවශ්‍යතාවය පෙන්වාදීම.

අරමුණු

i හාල් පිටි කර්මාන්තයේ නියැළී සිටින ව්‍යාපාරිකයින් සහ එම නිෂ්පාදනයන් හඳුනාගැනීම.

ii ව්‍යාපාරිකයින්ගේ, තාක්ෂණිකයින්ගේ සහ නිෂ්පාදකයින්ගේ තොරතුරු සහ දැනුම ඒකරාශී කිරීම.

iii හාල් පිටි කර්මාන්තයේ ක්‍රම රටාව හා එම කර්මාන්තයට අනුබද්ධ අංශයන් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම.

iv හාල් පිටි කර්මාන්තය මුහුණ දෙන්නා වූ ප්‍රශ්න හා ගැටළු හඳුනාගැනීම.

v හාල් පිටි කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා සුදුසු යෝජනාවන් ඉදිරිපත් කිරීම.

සොයා ගැනීම්

i මෙරට සහල් පිටි කර්මාන්තය ඉතා සුළු ප්‍රමාණයක් වූ මහා පරිමාණ ව්‍යාපාරිකයින් සහ මධ්‍යම හා සුළු පරිමාණයේ ව්‍යාපාරිකයින්ගේ සංයුතියකින් සැකසී ඇත. පසුගිය දශකය තුළ මෙම කර්මාන්තයේ සැලකිය යුතු වර්ධනයක් දිස් වේ.

ii වෙළෙඳපොලේ දිස්වන සහල් පිටි නිෂ්පාදනයන් අතර රතු සහ සුදු ඉඳි ආප්ප පිටි සහ ආප්ප සෑදීමට මිශ්‍ර කර ගන්නා සහල් පිටි ප්‍රධාන තැනක් ගනී. වෙළෙඳපොළ තුළ ඉතා කලාතුරකින් සහල් නූඩ්ල්ස් (100%) දැක ගත හැකි යි. නමුත් දැන් වෙළෙඳපොළ තුළ සහල් පිටි මිශ්‍ර නොයෙකුත් නිෂ්පාදනයන් දැකිය හැකි යි. මෙම නිෂ්පාදනවල ප්‍රමිතිය සහ මිල ව්‍යාපාරිකයින්ට අනුව සිත් සේ වෙනස් කරන අතර මේ සඳහා පිළිගත් ක්‍රමවේදයක් නොමැත.

iii සහල් පිටි කර්මාන්තය කොටස් දෙකකින් සමන්විත වේ. ඒ තෙත් සහල් පිටි නිපැයුම් සහ වියළි සහල් සැපයුම් ලෙස වේ. පිළිවෙළින් මෙහි අස්වනු සීඝ්‍රතාවය 115% ක් සහ 95% ක් වේ. ඒ අනුව ලැබුණු දත්තයන් මත තෙත් සහ වියළි සහල් කිලෝ 1 ක් සෑදීමට රු. 2.44 ක් සහ රු. 4.35 ක් පිළිවෙළින් වැය වේ.

iv දේශීය වෙළෙඳපොළ තුළ සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයින්, ප්‍රචාරණය සඳහා විශාල මුදලක් වැය කරනු ලබයි. මේ අතර මහා පරිමාණයේ ව්‍යාපාරිකයින් තම අතරමැදියන් හරහා දේශීය හා විදේශීය වෙළෙඳපොළට තම නිෂ්පාදනය ලබාදීම මගින් ප්‍රචාරණය සඳහා වැයවන මුදල පියවා ගනු ලැබේ.

v හාල් පිටි කර්මාන්තයට අදාළ තොරතුරු ලබාදීමට සහ ව්‍යාපාරිකයින් පුහුණු කිරීමට රජයේ සංවිධාන කිහිපයක් යොමු වී සිටියි. මෙම රාජ්‍ය ආයතන නම් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය සහ ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය වේ. තව ද සහල් පිටි ජනප්‍රිය කරවීම සඳහා දායක වූ පෞද්ගලික අංශයේ ආයතනයක් වන්නේ 'කැති රිච්' පදනම වේ. වඩාත් ප්‍රබල සේවාවක් ලබාදීමේදී මෙම ආයතනයන් මුහුණ දෙන ප්‍රධානතම ගැටළු වන්නේ මානව සහ ආර්ථික සම්පත්වල ඇති සීමාන්තික බවයි.

vi 'විදාතා' සම්පත් ආයතනය බේකරි හිමියන් අතර සහල් පිටි නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා ප්‍රයත්නයක් දරා තිබේ. නමුත් සහල් පිටි නිෂ්පාදනවලට තිබෙන ඉල්ලුමේ ඌනතාවයන් නිසා මේ සඳහා යොමු වූ බේකරි හිමියන් ප්‍රමාණය ඉතා ස්වල්පයක් වේ. තව ද වෙළෙපොළට සුදුසු බේකරි නිෂ්පාදන සඳහා අවශ්‍ය ඉතා අනර්ඝ තත්ත්වයේ සහල් පිටි ප්‍රමාණාත්මක නොවන නිසා සහල් පිටි බේකරි හිමියන් නිෂ්පාදන ගැටළුවලට මුහුණපායි.

vii ව්‍යාපාරිකයන් මුහුණ දෙන ප්‍රධානතම ගැටළු වන්නේ යන්ත්‍ර සූත්‍ර උසස් ලෙස නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීම, තොරතුරු ලබාගැනීමේ අපහසුතාවය සහ ප්‍රමාණාත්මක ධාරිතාවයක් නොතිබීම යන සාධකයන් වේ. සහල් මිලේ විශාල වශයෙන් සිදුවන උච්චාවචනයන් සහල් පිටි කර්මාන්තයේ ප්‍රවර්ධනයට බලපා තිබේ. මිල ඉහළ යෑමත් සමග නිතරම සහල්වල හිඟතාවයක් ඇති වේ. සහල් පිටි කර්මාන්තය ජීවනෝපායක් කරගත් සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට මෙම තත්ත්වය ප්‍රබල ලෙස බලපානු ලබයි.

viii ජාතිය ගොඩනැගීමේ බද්ද, තාක්ෂණික දැනුමේ ඌනතාවයන්, යටිතල පහසුකම්වල ඌනතාවයන් හා සහල් පිටි බේකරි නිෂ්පාදනයන් සඳහා තිබෙන ඉල්ලුම අවම වීම සහල් පිටි කර්මාන්තයේ ප්‍රවර්ධනයට ඇති ගැටළු ලෙස දැක්විය හැකිය.

නිමැවුම

මෙම විෂය පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශය අතුළත්ව විවිධ පාර්ශවකරුවන් අතර දැනුවත් කිරීම් සිදු කෙරිණි.

3 ඉඩම් අවක්‍රමණය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම	:	පී.ආර්. වීරක්කොඩි මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		එස්.කේ. කුමාර මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	:	පුස්තකාල ලේඛනයන් පරයේෂණය සඳහා භාවිතා කළ අතර කිසිදු මූල්‍ය සහායක් නොමැත.		

විෂය ක්ෂේත්‍රය

ලිපි ලේඛනවල අඩංගු තොරතුරු මගින් ඉඩම් අවක්‍රමණය පිළිබඳ මානව විද්‍යාත්මක ක්‍රියාවලිය සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට තිබෙන පරතරයන් අධ්‍යයනය කිරීම.

අරමුණු

මෙහි සමස්ත පරමාර්ථ වන්නේ ඉඩම් අවක්‍රමණය පිළිබඳ මානව විද්‍යාත්මක ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යයනය කිරීම යි. මේ අධ්‍යයනයෙ හි තවත් අරමුණු කිහිපයක් ද තිබේ.

i ඉඩම් අවක්‍රමණය පිළිබඳව මානව විද්‍යාත්මක ක්‍රියාවලියේ ඇති වෙනස් අර්ථකථනයන් පිළිබඳව පැහැදිලි කරගැනීම.

ii ජනතාව සහ ඉඩම් ආශ්‍රිත විවිධ සම්බන්ධතා පිළිබඳ තොරතුරු සැකසීම.

iii ඉඩම් අවක්‍රමණයේ දී මානව විද්‍යාත්මක ක්‍රියාවලියේ සම්බන්ධතා පිළිබඳ ව පැහැදිලි කිරීමක් ලබා ගැනීම.

iv ඉඩම් අවක්‍රමණයේ මානව විද්‍යාවේ පරීක්ෂකවරුන්, වෘත්තිකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ප්‍රතිපත්ති විශ්ලේෂකයින් අතර ඉතා හොඳ අවබෝධයක් ගොඩනැගීම.

සොයා ගැනීම්

i ඉඩම් අවක්‍රමණය පිළිබඳ මානව විද්‍යාවන්ට තුඩු දෙන ප්‍රාථමික හා ද්විතික සමාජ-ආර්ථික සාධකයන් හඳුනාගැනීම.

ii සමාජ-ආර්ථික සාධකවල ආකෘතික විචල්‍යභාවය නිසා ඉඩම් අවක්‍රමණය පිළිබඳ මානව විද්‍යාත්මක සාධකයන් ආරම්භ වේ. මෙහි දී ප්‍රාථමික අවධියේ ආකෘතීන් සඳහා දරිද්‍රතාවය, ඉඩම් බෙදීයාමේ අසමතුලිතභාවය, ඉඩම් භුක්තිකරුවන්ගේ අනාරක්ෂිත බව, ජනගහනයේ වර්ධනය සහ රැකියාමය අවශ්‍යතාවයන් යන සාධක ඇතුළත් වේ.

iii ඉහත සඳහන් සමාජ-ආර්ථික සාධකයන්ට අනුව ඉඩම් ආරවුල්වල දී මැදිහත්කරුවන් තම කටයුතු අනිසි ලෙස භාවිතා කිරීම, පාලනයන් හා අත්හැර දැමීම සිදු වී තිබේ.

iv ඉඩම් ක්ෂේත්‍රයේ සුළු වශයෙන් ක්‍රියාත්මක වූ මහා පරිමාණයේ සමාජ-ආර්ථික සාධකයන් ඉඩම් අවක්‍රමණයෙ හි පැහැදිලි වෙනසක් ඇති කරවීමට දායක වූ ප්‍රධාන බලවේගය වේ.

v ඉඩම් අවක්‍රමණය සඳහා ධනවත් සහ දුගී ජනතාවගේ දායකත්වය ලැබුණු අතර මොවුන් සියළු දෙනා ඉඩම් හරහා යැපෙන්නන් බවට උපකල්පනය කළ හැකි ය. එනමුත් දුගීභාවය හා ඉඩම් අවක්‍රමණය පිළිබඳව රැස් කරන ලද දත්තයන් හරහා සිදු වූ හානීන් පිළිබඳව ප්‍රමාණාත්මක සාධකයන් හෙළිදරව් වී නොමැත.

vi මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වන අවසාන සාධකය වන්නේ ඉඩම් අවක්‍රමණයේ මෙහෙයුම පමණි. ප්‍රාථමික හා ද්විතික මට්ටම්වල මැදිහත්වීම අවශ්‍ය බව අධ්‍යයනය අවසානයේ ප්‍රකාශ වේ.

vii දුගී බව අවම කිරීමේ ප්‍රාරම්භක මට්ටමේ උපායන් ලෙස, විශේෂයෙන් ම ගොවි නොවන ක්ෂේත්‍රවල ආදායම් වැඩිකිරීමේ මාර්ගය, ඉඩම් භුක්ති විඳින්නන්ගේ අනාරක්ෂිතභාවය හා මනා සැලසුම්ගත පුළුල් (විදාරණ) වැඩසටහන් මෙහි ඉලක්කගත වැදගත් සාධක වේ.

viii ද්විතීය තත්ත්වයේ උපායයන් ලෙස, ඉඩම් භාවිතා කරන්නන් සම්බන්ධ ව්‍යාප්ත පරීක්ෂණයන් සඳහා මිත්‍රශීලි මැදහත්වීම් අත්‍යාවශ්‍ය වේ. මෙමගින් ඉඩම් හරහා යැපෙන ප්‍රජාවගේ ආදායම් මාර්ගය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ ප්‍රවේශයන් තුළින් දුප්පතුන් තෝරාගැනීමේ රටාවන් වර්ධනය වේ. වන වගාවන් හරහා වාණිජ වට්නාකම්වලට අමතර අගයන් එකතුවන අතර එයට හොඳම උපායශීලි නිදසුන වන්නේ දැව ආශ්‍රිත නිපැයුම වේ.

නිමැවුම

ක්ෂේත්‍රයේ සිටින විද්වතුන්ගේ අවධානය පිණිස අධ්‍යයනයේ සියළුම සොයාගැනීම් වාර ප්‍රකාශන තුළින් ප්‍රකාශනයට පත් කරනු ඇත.

4. ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී වගා ක්‍රමය

පර්යේෂණ කණ්ඩායම	:	එස්.කේ. කුමාර මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		පී.ආර්. වීරක්කොඩි මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	:	පුස්තකාල ලේඛනයන් පර්යේෂණය සඳහා භාවිතා කළ අතර කිසිදු මූල්‍ය සහායක් නොමැත.		

විෂය ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පරිසර හිතකාමී වගා ක්‍රමවල වැදගත්කම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

අරමුණු

මෙම අධ්‍යයනය ප්‍රධාන අරමුණු දෙකකින් සමන්විත වේ.

i ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී වගා ක්‍රමයන්ට අයත් විවිධ පැතිකඩ පිළිබඳ පහදා දීම.

ii පරිසර හිතකාමී වගාක්‍රමය සඳහා ජාතික මට්ටමේ පවතින බලපෑම් හා එය තවදුරටත් වර්ධනය කිරීමට සුදුසු උපදෙස් ලබාදීම.

සොයා ගැනීම්

i ස්ථාවර කෘෂිකාර්මික සංකල්පය ඉලක්ක කරගනිමින් පාරිසරික වගා ක්‍රමය තුළ කාබනික පොහොර යොදන ක්‍රම හා හරිත වගා ක්‍රම සඳහා එක හා සමාන වටිනාකමක් හිමිව ඇත. තව ද පාරිසරික හිතකාමී වගාක්‍රමය හෝ කාබනික පොහොර යොදන වගා ක්‍රමය ශ්‍රී ලංකාවේ නිතරම යොදා ගන්නා ක්‍රමයන් නොවේ. නමුත් කාබනික පොහොර පමණක් රසායනික පොහොර සමග මුසුකොට ගොවිතැන සඳහා බහුලව යොදා ගන්නා බව දිස් වේ. මෙම ක්‍රමය ඉතා සුළු වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙන ක්‍රමයක් ලෙස සැලකේ.

ii මෙරට පාරිසරික වගා ක්‍රමය සඳහා දේශීය ඉඩම් භාවිතාව, සරුබිම් කළමනාකරණය කිරීමේ චර්යාවන්, කෙම් ක්‍රම මූලික වූ දේශීය පළිබෝධ කළමණාකරණ චර්යාවන්, පාරම්පරික ගොවිතැන් කිරීමේ ක්‍රමයන් සහ පළිබෝධ කළමනාකරණය හා ගොවිතැන් ක්‍රමය සමග ඒකාබද්ධ වූ ඝටකයන් ආදී වූ සාධක මෙහි අඩංගු වේ. තව ද පාරිසරික වගා ක්‍රමය හෝ එයට සමාන වගා ක්‍රමයක් ප්‍රචලිත කිරීමට කෘෂි ක්ෂේත්‍රයේ පැහැදිලි වැඩපිළිවෙළක් තවමත් නොමැත.

iii පසුගිය කාලවකවානු තුළ දී පාරිසරික වගා ක්‍රමය, මෙහි අනුයුක්ත කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයේ වැඩසටහන් සහ ව්‍යාපෘතීන් කෙරෙහි නිසි අවධානයක් යොමු කර තිබේ. රටේ අනාගත සැලසුම් තුළ දී පාරිසරික වගා ක්‍රමය ප්‍රචලිත කිරීම මගින් අත්පත් කරගන්නා වූ ප්‍රතිඵලයන් නිසි ලෙස මැන බැලීම ඉතා අත්‍යාවශ්‍ය සාධකයන් වේ.

iv ජන සමාජය තුළ පාරිසරික වගා ක්‍රමය සම්බන්ධව ගනු ලබන ප්‍රතිපත්තිවල නිසි ඵල ප්‍රයෝජනයන් නො ලැබීම සම්බන්ධව අවධානය යොමු කිරීම ද සිදුවිය යුතුය.

v රජයේ අවම අනුග්‍රාහකත්වයකින් අනුයුක්ත කර තිබෙන ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන් සඳහා සැලකිය යුතු ප්‍රමාණයකින් අවධානය යොමු කොට මෙය ස්ථාපිත කිරීමට පියවර ගැනීම සිදු කළ යුතු ය. ග්‍රාමීය වශයෙන් පළිබෝධනාශක කළමනාකරණ වැඩසටහනෙහි ප්‍රධානතම පුද්ගලයින් වෙන්නේ ගොවි ප්‍රජාව වේ. පළිබෝධනාශක කළමනාකරණ වැඩසටහන්වල දී මෙම ගොවි ප්‍රජාව පුහුණුකරුවන්, පර්යේෂණ නිලධාරීන් සහ සංවිධායකයින් ලෙසින් විශාල කාර්යයක් ජන සමාජය තුළ ඉටු කරනු ලබයි.

නිමැවුම

මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්‍යාඥයින්ගේ අවධානය පිණිස මේ අධ්‍යයනයෙහි සොයා ගැනීම් වාර ප්‍රකාශන ලිපියක් ලෙසින් ප්‍රකාශනය කිරීම අපේක්ෂා කෙරේ.

5. ශ්‍රී ලංකාවේ වී / සහල් මිල සහ වෙළෙඳපොළ අතිරික්තයේ හැසිරීම් රටාව අධ්‍යයනය කිරීම

පර්යේෂණ කණ්ඩායම :

	ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය	-	සම්බන්ධීකාරිකා
	ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	-	සම පර්යේෂක
	ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	සම පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය : ඒකාබද්ධ අරමුදල

විෂය ක්ෂේත්‍රය

දිවයින පුරා සිදු කරන ලද සමීක්ෂණයට අනුව වී වල මිල තීරණය කිරීමට බලපාන විවිධ කලාපවල සහ විවිධ වෙළඳපොළවල නියෝජිතයින්ගේ වෙළෙඳපොළ අතිරික්තයේ හැසිරීම් රටාව අධ්‍යයනය කිරීම.

අරමුණ

ශ්‍රී ලංකාවේ වී මිල තීරණය කෙරෙහි බලපාන විවිධ වෙළෙඳපොළ නියෝජිතයින් අලෙවි කරන ආකාරය, අතිරික්ත අලෙවිය සහ අලෙවි යාන්ත්‍රණය පිළිබඳ පෘථුල අධ්‍යයනයක් හරහා මේ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම. එබැවින් මෙම අධ්‍යයනය පැහැදිලි ඉලක්කයක් කෙරෙහි යොමුවී තිබේ. එමගින් ශ්‍රී ලංකාවේ වී මිල තීරණය කිරීමේදී ප්‍රතිපත්ති සම්පාදකයින්ට වී වෙළෙඳපොලේ මිලෙහි වාෂ්පශීලීභාවය අවම කිරීමටත් සැබෑ තත්ත්වයක් නිරාවරණය කිරීමටත් මෙම අධ්‍යයනය උපකාරී වනු ඇත.

විශේෂ අරමුණු

i ගොවිබිම් මට්ටමින් අලෙවි අතිරික්තය සහ අලෙවි කළ හැකි අතිරික්තය මැන බැලීම.

ii ගොවිපොළ හා ගම් මට්ටමින් ගම්වල අලෙවි ව්‍යාප්ත රටාව හෝ එම ප්‍රදේශවල අලෙවි යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යයනය කිරීම.

iii වෙළෙඳපොළ අතිරික්තය මිලදී ගන්නන් හා එම යාන්ත්‍රණය ක්‍රියාකරවන්නන් හඳුනාගැනීම.

iv වී ගොවීන්ට බලපාන ගබඩා කිරීම් හා වෙළෙඳපොළ අතිරික්තය කෙරෙහි බලපාන සාධකයන් පිළිබඳ සොයා බැලීම.

v ගොවිපළ මිල කෙරෙහි බලපාන නිශ්චිත සාධකයන් සොයා බැලීම.

vi ප්‍රාදේශීය වී වෙළෙඳපොළේ ගැනුම්කරු බලය විභාග කරබැලීම.

සොයා ගැනීම්

i අලෙවි අතිරික්තය සමස්ත ස්ථායී නිපැයුමෙන් 61-94% ක් වන අතර දිස්ත්‍රික්ක අනුව සලකා බැලීමේදී අවම ප්‍රමාණය වාර්තා වන්නේ කුරුණෑගල හා උපරිම ප්‍රමාණය අම්පාර දිස්ත්‍රික්කයෙන් වේ. තවද ප්‍රමාණයන් අතර යම් ආකාරයක වෙනස්කම් දිස්වේ.

ii 2009/10 මහා කන්නයේ කුරුණෑගල සිට අම්පාර දිස්ත්‍රික්කවල එක් ගොවියකු ලද සාමාන්‍ය අලෙවි අතිරික්තය කි.ග්‍රෑ.3,760 සිට කි.ග්‍රෑ. 10.320 අතර ප්‍රමාණයක් වේ. නමුත් 2010 යල කන්නයේදී අනුරාධපුර කි.ග්‍රෑ. 2,143 සිට පොළොන්නරුව කි.ග්‍රෑ. 5,730 ක් දක්වා වර්ධනයක් පෙන්නුම් කර ඇත.

iii ආපදා අලෙවිකරණය වශයෙන් අතිරික්ත අලෙවිය පැහැර කිරීම, ගබඩා ඌනතාවය, සහන මිලට අනුකූලව අලෙවිය සිදු වේ. සාමාන්‍ය මිලට අනුකූලව අලෙවි කිරීම තුළින් අලෙවි අතිරක්තය බැහැර කිරීමට සිදුවේ. මහ කන්නය තුළදී අනුරාධපුර ගොවියන් 91% කට වාසි ලැබෙන ලෙස වී සම්ප්‍රේෂණය වීමත් යල කන්නයේ දී පොළොන්නරුව ගොවීන් 83% ක් හා අම්පාර දිස්ත්‍රික්කයෙන් ගොවීන් 88% ක් වී සම්ප්‍රේෂණය වීම සිදුවිය. කුරුණෑගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල කුඩා ගොවීන් ප්‍රථමයෙන්ම ණය වාරික ගෙවන බැවින් ඔවුන් ඉතා ප්‍රබල වේ. මෙම දිස්ත්‍රික්කවල 40-45% ගොවීන් අස්වනු නෙළීම සමඟ අතිරික්තය අලෙවි කිරීමට සමත් වී සිටියි. අම්පාර ප්‍රදේශයේ ගබඩා පහසුකම්වල ඌනතාව නිසා 10% ක ප්‍රමාණයක් අස්වනු නෙළීමත් සමගම අතිරික්තය බැහැර කරනු ලබයි.

iv 2009/2010 අනුරාධපුර මහකන්නයේ සමීක්ෂණයේදී අලෙවි අතිරික්තය 30% ක් වන අතරම එය අස්වනු නෙළීමෙන් අනතුරුව අලෙවි කිරීමට හැකි වී තිබේ. තවද හම්බන්තොට හා කුරුණෑගල යන ප්‍රදේශවල පිළිවෙලින් 66% ක් හා 49% දිස්වේ. 2010 වසරේ යල කන්නයේ අලෙවි අතිරික්තය සමීක්ෂණය කර බැලීමේදී අම්පාර ප්‍රදේශයේ අස්වනු නෙළීමෙන් අනතුරුව 16% ක් අලෙවි කර තිබේ. එමෙන් ම හම්බන්තොට අස්වනු නෙලීමන් පසුව 61% ක් අලෙවි අතිරික්තය අලෙවි කර තිබේ.

v ගොවිබිම් මට්ටමින්, ගම්වල එකතුකරන්නන් හරහා හෝ මෝල් හිමියන් මඟින් හෝ වී මිලදී ගැනීම සිදුවේ. අනුරාධපුරයේ ගම් මට්ටමින් එකතු කරන්නන් ඉතා ප්‍රබල කාර්යයක් ඉටු කරන අතර එම ක්‍රියාවලිය පොළොන්නරුව දක්වා ව්‍යාප්ත වී ඇත. වී මිලදී ගැනීම ගම්මට්ටමේ එකතු කරන්නන් හරහා සිදුවන විට, තැරැව්කරුවන් මඟින් මෝල් හිමියන්ට තොග වශයෙන් අලෙවි කිරීම සිදුවේ. මෙහිදී මෙම තැරැව්කරුවන් අලෙවිකරණය තුළ මැදිහත්කරුවන් ලෙස ක්‍රියාත්මක වේ. හම්බන්තොට, කුරුණෑගල, අම්පාර හා පොළොන්නරුව යන ප්‍රදේශවල මෝල් හිමියන් විසින් වී මිලදී ගනු ලැබීම සාමාන්‍ය ලෙස සිදු වේ.

vi මූලික වශයෙන් ඉල්ලුමට සාපේක්ෂව වී මිලදී ගන්නා ගැණුම්කරුවන් කාණ්ඩ තුනකට වෙන්කළ හැකි වේ. වසරක් පුරාම ක්‍රියාත්මක වන නම් කරන ලද වී මිලදී ගන්නා මහා පරිමාණයේ මෝල් හිමියන්ද, දැනට පවතින මිලට අනුව වී මිලදී ගන්නා සුළු හා මධ්‍යම පරිමාණයේ මෝල් හිමියන් ද රජය විසින් සහතික කරන ලද මිලට වී මිලදී ගනු ලැබේ. වෙළඳපොලේ ඉල්ලුම පැහැදිලි වශයෙන් කොමිස් මත පදනම් වෙයි.

vii මෝල් හිමියන්ගේ ක්‍රියාකාරිත්වය හුදු සැකසුම්කරුවන් ලෙසින් පමණක් ම නොවේ. තොග හා සිල්ලර ගැණුම්කරුවන් ලෙසින්ද කටයුතු කළ අවස්ථා තිබේ. විශේෂයෙන් ම මහා පරිමාණයේ මෝල් හිමියන්ගේ සිට පාරිභෝගිකයා දක්වාම ක්‍රියාත්මක වේ. ඍජු මැදිහත්වීම්, මෙහෙයුම් කටයුතු යාන්ත්‍රණය හා නව තාක්ෂණය මහා පරිමාණයේ මෝල් හිමියන් කෙරෙහි සැබෑ වශයෙන් බලපාන සාධකයක් වේ.

viii වී මිල තීරණය වන්නේ කලාපීය වශයෙන් ප්‍රමාණාත්මකව ව්‍යාප්තව පවතින මෝල් ප්‍රමාණය අනුව යි.

නිමැවුම

ශ්‍රී ලංකාවේ වී මිල ස්ථාවරව පවත්වාගෙන යෑමට බලපවත්නා සාධකයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදායකයින් දැනුවත් කිරීම සිදු කෙරිණි.

6. **වී වගාවේ අස්වනු නෙළීමේ අදියරට බලපාන සමාජ ආර්ථික සහ පාරිසරික යාන්ත්‍රණය**

පර්යේෂණ කණ්ඩායම :	එස්. ඇපාසිංහ මහතා	–	සම්බන්ධීකාරක
	එස්.කේ. කුමාර මහත්මිය	–	සම පර්යේෂිකා
	කේ.පී.අයි. ප්‍රියදර්ශනී මෙනවිය	–	සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය : ඒකාබද්ධ අරමුදල

විෂය ක්ෂේත්‍රය

වාරිමාර්ග බහුලව පවතින ප්‍රදේශවල වී අස්වනු යාන්ත්‍රණයට බලපාන සමාජ ආර්ථික හා පාරිසරික සාධකයන් පිළිබඳ අධ්‍යයනය කිරීම.

අරමුණ

වී අස්වනු නෙළනු ලබන ක්‍රියාවලිය කෙරෙහි බලපාන සමාජ, ආර්ථික, පාරිසරික හා සංස්කෘතිමය සාධකයන් අධ්‍යයනය කර සමාජ ප්‍රගතිය වර්ධනය කිරීමට ගත හැකි ප්‍රතිපත්තිමය සාධකයන් සහතික කිරීම.

විශේෂ අරමුණු

i නිෂ්පාදන වියදම් අවම කිරීමට යාන්ත්‍රණයන් භාවිතා කරගත හැකි ආකාරය පරීක්ෂා කරබැලීම.

ii නිපැයුම්වල ප්‍රමිතිය සහ බිත්තර වී සැපයුම කෙරෙහි යන්ත්‍රසූත්‍රවල බලපෑම පරීක්ෂා කරබැලීම.

iii යාන්ත්‍රීකරණය මගින් ශ්‍රම ශක්තිය ඉවත් කළ ආකාරය ගවේෂණය කිරීම.

iv පරිසරයට යාන්ත්‍රීකරණයේ ඇති බලපෑම අධ්‍යයනය කිරීම.

v අස්වනු නෙළන කාලය තුළදී යන්ත්‍රසූත්‍ර භාවිතය හා නඩත්තුවේ වැදගත්කම් හඳුනාගැනීම.

vi යන්ත්‍රසූත්‍ර භාවිතය මගින් සමාජීය වශයෙන් ඇති වාසි හා එහි ඇති ඍණාත්මක බලපෑම් විමසීම.

vii යන්ත්‍රසූත්‍ර වඩාත් ඵලදායී ආකාරයට භාවිතාවට ගැනීමට හැකිවන අයුරින් ප්‍රතිපත්ති සකසා යෝජනා කිරීම.

සොයා ගැනීම්

i සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර භාවිතා කිරීමට හේතුව වෙන්නේ ශ්‍රමිකයින්ගේ ඌනතාවය සහ ඒ සඳහා ගෙවන මිල අධික වීමත්, යන්ත්‍රසූත්‍රවලට අවම මුදලක් වැය වීම හේතුවෙන් වියදම අවම කරගත හැකි නිසාය. සංයුක්ත අස්වනු

නෙළීමේ යන්ත්‍ර භාවිතා කිරීමෙන් මතුවන ගැටළුව නම් තෝරාගත් පස් සාම්පල් කොටසින් 71% ක සංයුක්ත වී තිබීමත් වී තුළ විශාල ප්‍රමාණයක තෙතමනයක් අඩංගු වී ඇති බව 90% ගොවීන් විසින් වාර්තා කර තිබීමත් වේ. තවද අක්කර 1 ට වී බුසල් 1-5 ප්‍රමාණයක් හානි වී තිබිණි. මෙයට අමතරව වාර්ෂිකව මෙහි කුළී වියදම ද ඉහළ යන බවක් දිස්වේ.

ii වී නිෂ්පාදනය කරන ප්‍රදේශවල ශ්‍රමික මට්ටමේ ඌනතාවයක් ඇතිවීමේ ප්‍රතිඵලය හේතුවෙන් සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර භාවිතාවට ගැනීමට සිදුවී තිබේ. තෝරාගත් ජනගහනයෙන් 70% ක් පමණ වාර්තා කරන්නේ ශ්‍රමික ඌනතාවයත්, අස්වනු සැකසීමේදී යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් වියදම් අඩු කිරීමට හා කාලය ඉතිරි කිරීමට හැකිවීමත් යන කාරණා මේ සඳහා බලපා ඇති බව යි. යන්ත්‍ර භාවිතයෙන් ලබාගත් අස්වැන්නට බොහෝ සේ හානි වී තිබෙන බව දිස් විය.

iii අස්වැන්න නෙළීම සඳහා කම්කරු ශ්‍රමය පමණක් යොදා ගැනීම සසඳන කල අඩු ශ්‍රමයක් හා අඩු පිරිවැය හේතුවෙන් කුඩා සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍රය භාවිතා කරන ලදී. නමුත් සංයුක්ත අස්වනු නෙළීමේ හා සංයුක්ත පෑගීමේ යන්ත්‍ර හා සසඳද්දී කුඩා සංයුක්ත අස්වනු නෙළීම් යන්ත්‍රය සඳහා වැයවන අධික කාලය අවාසියක්ව තිබිණි. කෙසේ නමුත් සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර භාවිතයෙන් නෙළාගත් අස්වැන්න තෙතමනය සහිත විය.

iv මඩ සහිත පසක් පැවතීම නිසා අනෙකුත් යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි ප්‍රදේශවල ඇඹ්‍රමෙක් යන්ත්‍ර භාවිතා කෙරේ. ඊළඟ කන්නයේ බිත්තර වී නිපදවීම සඳහා අස්වැන්න භාවිතයට ගන්නා ගොවීන් වී පෑගීම සඳහා ඇඹ්‍රමෙක් යන්ත්‍ර භාවිතයට බලාපොරොත්තු වේ.

v නව යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේ වාසි ලෙස ගෘහණියන් සතු කාර්යයන් අවමවීමත් සහ අස්වනු නෙළන කාලය තුළ ශ්‍රමිකයින්ට ආහාර සැකසීම ආදී කාරණා පැන නොනැගීමත් සිදු වේ. තවද මේ නව යන්ත්‍ර භාවිතා කිරීම නිසා කෘෂිකර්මාන්තය කෙරෙහි තරුණ පරපුරේ ඇදීයාමක් ද පවතී.

vi බිත්තර වී නිෂ්පාදනයේ දී මෙම යන්ත්‍ර භාවිතා කිරීමේ ගැටළු පැන නගී. මෙම ස්වභාවය නිසා වී ගබඩා කිරීම සමග තෙත සහිත බව වැඩිවීමේ ගැටළු සහ එම අවස්ථාවේ වීවල පිරිවැය නිෂ්පාදන අලෙවි කිරීමේ දී ගැටළු ලෙස පැන නැගී තිබේ.

නිමැවුම

තාක්ෂණය භාවිතා කිරීමේදී මතුවන ගැටළු හා එය දියුණු කිරීමට ගත හැකි පියවර සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීම යි.

පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය

අවසන් කළ අධ්‍යයන

1. **ජනාවාස යෝජනා ක්‍රම තුළ අවිධිමත් ලෙස ඉඩම් කැබලිවීම පිළිබඳ අධ්‍යයනය**

පර්යේෂණ කණ්ඩායම	:	පී.පී. ද එල්.ඩබ්. සමරසිංහ මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		එම්.එම්.එම්. අනියාර් මහතා	-	සම පර්යේෂක
මූල්‍ය මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

ජනාවාස යෝජනා ක්‍රමය තුළ ඉඩම් සඳහා ඉල්ලුම වැඩිවීම සහ ඉඩම් නැවත බෙදීම ජනගහන වර්ධනය සමග උග්‍ර වෙමින් තිබේ. 1935 ඉඩම් සංවර්ධන පනත හා පසුකාලීන සංශෝධනවලට අනුව කට්ටිහිමියෙකුට මුලින් ම පවරා දුන් ඉඩම, වාරිමාර්ග ආශ්‍රිත පහත් බිම්වල දී නම් අක්කර 1.5 ට වඩා අඩු කොටස්වලට ද උස්බිම් ජනාවාසවල දී නම්, අක්කර 5 ට වඩා අඩු කොටස්වලට ද නැවත බෙදිය නො හැකි ය. කෙසේ නමුත් වර්තමාන තත්ත්වය තුළ අදාළ පනත් නො සලකා හරිමින් මුලින් ම පවරා දුන් ඉඩම් අවිධිමත් ලෙස නැවත නැවතත් කුඩා කැබලිවලට බෙදී ගොස් පවතී. මෙම තත්ත්වය තුළ විධිමත් ක්‍රමයක් තුළ ඉඩම් කට්ටිකිරීම තවදුරටත් අනුමත කරමින් පවතින පනත සංශෝධනයට ලක් කිරීම සඳහා ප්‍රතිලාභීන්ගේ බලපෑම් වැඩිවෙමින් පවතී.

මෙම අධ්‍යයනය මඟින් වාරි ජනාවාස යෝජනා ක්‍රම තුළ ඉඩම් බෙදීයාම සහ එමගින් කට්ටි හිමියන්ගේ ජීවිකාව, ගොවි ආර්ථිකය හා පාරිසරික වශයෙන් එහි බලපෑම තක්සේරු කිරීම මෙන් ම පවත්නා පනත පිළිබඳ කට්ටි හිමියන්ගේ මතය සහ පනත සංශෝධනය සඳහා යෝජනා ලබා ගැනීම ද අපේක්ෂා කරන ලදී.

අරමුණු

i ඉඩම් බෙදීයාමේ ප්‍රමාණය තක්සේරු කිරීම.

ii ඉඩම් කට්ටි කිරීම සඳහා පාදක වූ හේතූන් විමර්ශනය කිරීම.

iii දරුවන් අතර ඉඩම් බෙදා දීමේ දී යොදා ගත් නිර්නායක ලේඛනගත කිරීම.

iv ඉඩම් කට්ටි කිරීම සහ අදාළ කරුණුවල ප්‍රතිවිපාක අධ්‍යයනය කිරීම.

v වර්තමාන පනත පිළිබඳ කට්ටි හිමියන්ගේ මතය සහ පනත සංශෝධනය සඳහා කට්ටිකරුවන්ගේ යෝජනා විවරණය කිරීම.

සොයා ගැනීම්

i අධ්‍යයන ප්‍රදේශ තුළ පහත් බිම් කොටස් 28% ක් පමණ අවිධිමත් ලෙස අක්කර 1.5 ට වඩා අඩුවෙන් කැබලි කර තිබිණි. කෙසේ නමුත්, පිළිවෙළින් පහත් බිම්වල හා උස් බිම්වල 57% ක් හා 30% ක් වූ ගොවීන්ට දෙමාපියන්ගෙන් උරුම වූ ඉඩම් සඳහා ඔවුන්ගේ හිමිකාරීත්වය තහවුරු කරන කිසිදු නීතිමය ලියවිල්ලක් නො පැවතිණි.

ii ඉඩම් කට්ටි වීම සඳහා බලපාන ප්‍රධානම හේතුව නම් ගොවීන් විසින් දරුවන් සියළු දෙනා අතරේ තම ඉඩම් සම සමව බෙදා දීමයි. එසේ සමානව බෙදාදීම සිය සමාජමය යුතුකමක් ලෙස ඔවුහු සලකති. එම නිසා බොහෝ ගොවියන් පනතෙන් නිරූපිත අවම ප්‍රමාණය සැලකිල්ලට නො ගනිමින් ඔවුන්ගේ සෑම දරුවකු අතර ම ඉඩම සමාන ලෙස බෙදීමට කැමැත්තෙන් සිටී.

iii ගොවීන් බොහෝ දෙනෙක් අක්කර 1.5 ට වඩා අඩු වුවත් තම ඉඩම්වල හිමිකාරීත්වය ඊළඟ පරම්පරාවට නීතිමය වශයෙන් පවරා දීමට වැඩි කැමැත්තක් දක්වන්නේ නමුදු එසේ කිරීමට නො හැකි වීම, 60% ට වඩා වැඩි පදිංචිකරුවන්ට බරපතල සමාජමය හෝ ආර්ථිකමය ගැටළුවක් ඇති කර නොමැත. ඔවුන්ගේ දරුවන් හට ඉඩම් හිමිකම් නීතිමය වශයෙන් පවරාදීමේ නොහැකියාව නිසා ගැටළු අත්දකිමින් සිටින බව ගොවීහු 20% ක් ප්‍රකාශ කළහ.

iv පවතින නීතිය යටතේ ජනාවාස යෝජනා ක්‍රම තුළ පහත් බිම් අක්කර 1.5 ට වඩා අඩු ලෙස නැවත බෙදීමේ තහනම පිළිබඳ 65% ට වඩා වැඩි ගොවීන් ප්‍රමාණයක් දැනුවත්ව සිටී. නමුත්, 70% ක් තරම් වූ ගොවීහු තමන් සතු ඉඩම් කට්ටි තම අභිමතය පරිදි බෙදීම අනුමත කරමින් පවත්නා නීතිය සංශෝධනය කළ යුතු බවට යෝජනා කරති. අසීමාන්තිකව ම ඉඩම් කට්ටි කිරීම නතර විය යුතු බැවින් ඉඩම් කට්ටියක් බෙදිය යුතු අවම ප්‍රමාණය අක්කර 1 ක් දක්වා සීමා කිරීම සඳහා 12% ක් පමණ ගොවීහු වැඩි කැමැත්තක් දක්වති.

v ප්‍රතිලාභීන්ගෙන් 55% ක් පමණ ඔවුන්ගේ ඉඩම් හිමිකම් සෑම දරුවකු අතර ම සමාන ලෙස බෙදීම අභිප්‍රාය බව පෙන්නුම් කළහ. සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළ 13% ක් පමණ අනාගත ඉඩම් අයිතිය පිළිබඳ තීරණය කර නොමැති අතර 17% ක් ඔවුන්ගේ ඉඩම් හිමිකම් පවුලේ බාලයාට පවරාදීමට කැමැත්තෙන් සිටියහ.

vi පවත්නා ඉඩම් කට්ටි කුඩා කැබලිවලට නීත්‍යානුකූල ලෙස බෙදීම මගින් ජල කළමනාකරණ සහ වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තුව තුළ ගැටළු නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මක් නිසාද යත්, නීත්‍යානුකූල ඉඩම් කට්ටි ගණන වැඩිවීමත් එක් එක් ඉඩම් කට්ටිය සඳහා වැඩි වාරි ජල ප්‍රමාණයක් අවශ්‍යවීමත් වැඩි ජල අපහනයක් ඇතිවීමත් හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තු සඳහා සම්පත් අවශ්‍යතාවය (භෞතික හා මානව) ඉහළ යයි. ඉඩම් කුඩා කැබලි ලෙස නීතිමය අයුරින් පැවරීම ගොවීන්ට තම කට්ටි පවුලෙන් බාහිර අයට විකිණීමට දිරි දෙන අතර පවුලේ සාමාජිකයන් අතර පැවති සමගියට බාධා කරන්නක් බව නිලධාරීහු විශ්වාස කරති.

නිර්දේශ

i අවිධිමත් ලෙස ඉඩම් කැබලි කිරීම බහුතරයක් ගොවීන්ට බාධාවක් නොවූ බැවින් ද එමගින් කිසිදු බරපතල සමාජ-ආර්ථික ප්‍රතිවිපාක නිර්මාණය කර නොතිබුණු බැවින් ද අසීමාන්තික ලෙස ඉඩම් කැබලි කිරීමට ප්‍රතිලාභීන්ට ඉඩ ලබා දෙන සේ පනත සංශෝධනයට නිර්දේශ නො කරයි.

ii අනුප්‍රාප්තිකයකු නම් කිරීමකින් තොරව මුල් ඉඩම් අයිතිකරු (දෙමාපියන්) මිය ගිය අවස්ථාවක දී වැඩිමල් පුත්‍රයාට පමණක් නොව, ඉඩමේ අවම සීමාව අක්කර 1.5 දක්වා වන පරිදි පවුලේ සාමාජිකයන් අතර බෙදා ගැනීමට ඉඩලැබෙන සේ පවත්නා පනත සංශෝධනය නිර්දේශ කරයි.

iii ජනාවාස යෝජනා ක්‍රම තුළ ඉඩම් සඳහා වන තදබදය අවම කිරීම සඳහා ගොවිපොළ නො වන රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ රජයේ නව ඉඩම් පවරාදීමේ වැඩසටහන් යටතේ, ඉඩම් පවරාදීමේ දී පැරණි ජනාවාසවල පසු පරම්පරාවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම සිදු කළ යුතු වේ.

දැනට ක්‍රියාත්මක අධ්‍යයන

1. වාරි පද්ධති කළමනාකරණය තුළ ගොවි සහභාගීත්වය : සාධනය සහ පසුබෑම්

පර්යේෂණ කණ්ඩායම :	එම්.එම්.එම්. අනියාර් මහතා	-	සම්බන්ධීකාරක
	එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා	-	සම පර්යේෂක
	එම්.ටී. පද්මජානී මෙනවිය	-	සම පර්යේෂිකා

වාරි කළමනාකරණයේ මෙවලමක් ලෙස හා තිරසර බවේ මිනුමක් ලෙස සහභාගීත්ව වාරි කළමනාකරණ සංකල්පය (PIM) ලෝකය පුරා පිළිගනිමින් පවතී. වාරි පද්ධති ඉදි කිරීම, මෙහෙයුම හා නඩත්තුව තුළ ගොවි සහභාගීත්වය ශ්‍රී ලාංකීය ගොවීන්ට නවමු සංකල්පයක් නොවේ. කෙසේ නමුත් 1988 සිට මෙම සංකල්පය ජාතික වාරි පද්ධති කළමනාකරණ ප්‍රතිපත්තිය වශයෙන් මෙරටෙහි ආයතනිකගත කෙරිණි. වාරි කෘෂිකර්මාන්තයේ හා ජල සම්පත් කළමනාකරණයේ ගැටළු විසඳීම සඳහා මෙම ප්‍රතිපත්තිය ඉවහල් වනු ඇතැයි ශ්‍රී ලංකා රජය බලාපොරොත්තු වුව ද, වාරිපද්ධති කළමනාකරණය පැවරීමේ වැඩසටහන හා එහි දීර්ඝකාලීන තිරසරබව, ප්‍රතිපත්තියේ කාර්යයසාධකතාවයෙහි අවිනිශ්චිතභාවය වැඩි කරනු ලබන බව පර්යේෂණයෙහි නිරීක්ෂණ පෙන්නුම් කරයි. සහභාගීත්වය තුළ වාසි මෙන් ම අවාසි තත්ත්වයන් ඇති අතර, ප්‍රමාණවත් සහභාගීත්වය ගණනය කිරීම ගැටළුසහගත ය. මෙහෙයුම් හා නඩත්තුව සඳහා ප්‍රමාණවත් ව සම්පත් මෙහෙයවීමේ දුර්වලතාවය මත වාරි පද්ධති පරිහානියට පත්වීමත්, නියමිත කාලයට පෙර පුනරුත්ථාපනය අවශ්‍යවීමත් තුළ පොදු මහජන මුදල් විශාල ප්‍රමාණයක් නාස්ති වෙමින් තිබේ. එබැවින් වර්තමාන සන්දර්භය තුළ සහභාගීත්ව වාරි කළමනාකරණයේ වාසි සහ අවාසි අධ්‍යයනය, අනාගත ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය නිර්දේශයන් සැලසීමට විවිධ කළමනාකරණ ආකෘති යටතේ සහභාගීත්ව වාරි කළමනාකරණය සඳහා ප්‍රතිස්ථාපිත ආයතනවල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය වැදගත් වේ.

අරමුණු

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ විවිධ කළමනාකරණ ආකෘති යටතේ සහභාගීත්ව වාරි කළමනාකරණයේ ගැටළු හා ඉදිරි දැක්ම තක්සේරු කිරීම යි. මෙම පුළුල් අරමුණ සාධනය කරගැන්ම සඳහා පහත දැක්වෙන සවිස්තරාත්මක අරමුණු අර්ථ ගන්වා තිබේ.

i සහභාගීත්ව වාරි කළමනාකරණයේ ප්‍රධාන සංරචකවල ක්‍රියාකාරීත්වය, ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය, ඒකාබද්ධ කළමනාකරණ කමිටුවල ක්‍රියාකාරීත්වය සහ වාරි කළමනාකරණය පවරාදීමේ ක්‍රියාකාරීත්වය ඇගයීම.

ii සහභාගීත්ව වාරි කළමනාකරණය සාර්ථක කරගැනීම සඳහා එය පවරාදුන් ආයතනවල කාර්යභාරය හා එහි ආයතනික සැලැස්ම විභාග කිරීම.

iii පාර්ශවකරුවන් විසින් මෙහෙයුම් හා නඩත්තු සඳහා සම්පත් මෙහෙයවීමේ ප්‍රමාණය හා පද්ධතිවල තිරසර තත්ත්වය සඳහා කොතරම් බලපෑමක් එමගින් සිදුවී ඇත්ද යන්න ගණනය කිරීම.

iv වඩා ඵලදායී මෙහෙයුම් හා නඩත්තුවක් සඳහා එක් එක් කළමනාකරණ මොඩලයන් (ආකෘති) සඳහා වෙන් වෙන් වූ නිර්දේශ ඉදිරිපත් කිරීම.

2. **කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන සූර්ය බල ශක්ති බිංදු ජල සම්පාදන පද්ධති පිළිබඳ ඇගයීම (අදියර 1)**

පර්යේෂණ කණ්ඩායම	:	එම්.එම්.එම්. අහියාර් මහතා	- සම්බන්ධීකාරක
		එම්.ජේ.සී.එස්. බණ්ඩාර මහතා	- සම පර්යේෂක
		එම්.ටී. පද්මජානි මෙනවිය	- සම පර්යේෂිකා

ජල භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට යොදා ගත් ක්‍රමවේදයක් ලෙස ක්ෂුද්‍ර වාරි තාක්ෂණය තෝරා ගැනීම හැඳින්විය හැකිය. ඉහළ යමින් පවතින ඉන්ධන පිරිවැය ගැටළුව විසඳාලීම සඳහා සූර්ය බලශක්ති බිංදු ජල සම්පාදන පද්ධතිවලට හැකියාවක් පවතී. එම නිසා 2004 දෙසැම්බර් මස ඕස්ට්‍රේලියාවේ බී.පී. සෝලා ආයතනය සූර්ය බලශක්ති ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 5000 ක ප්‍රමාණයක් ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයකට ලබාදීම සඳහා ගිවිසුමක් ඇති කරගන්නා ලදී. මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳවත් දියුණු කෘෂිකාර්මික ක්‍රමවේදයක් පිළිබඳවත් පුහුණුවක් දිස්ත්‍රික් නිලධාරීන් හා කෘෂි උපදේශකවරුන් සඳහා ලබාදීම සමාගමේ වගකීම අතර වේ. ව්‍යාපෘතියේ පළමු පියවර සාර්ථකව නිම කිරීමෙන් පසු දෙවැනි පියවර ලෙස තවත් ඒකක 5000 ක් ලබාදීමට ගිවිසුමෙන් එකඟ වී ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ බල පැවැත්වෙන "තිරසාර කෘෂි ජල කළමනාකරණ ව්‍යාපෘතිය (SAWMP)" යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිණි. ගොවිපොළ ඵලදායීතාවය ඉහළ නැංවීම, ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම හා ප්‍රතිලාභී ගොවීන්ගේ ජීවිකාව නංවාලීම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරිණි. ව්‍යාපෘතියේ අනෙක් අරමුණ වූයේ ග්‍රාමීය ගොවීන් තුළ නැවත ජනනය කළ හැකි බලශක්තිය සමග ජල සම්පාදනය බිංදු පද්ධති භාවිතා කිරීමේ ශක්‍යතාවය පැහැදිලි කිරීම යි. ජල සම්පාදන පද්ධති භාවිතය මගින් බෝග අස්වැන්න හා අස්වැන්නෙහි ගුණාත්මක තත්ත්වය ඉහළ නංවාගන්නා අතර ම ජලය, ඉන්ධන සහ පොහොර ඉතිරි කරගැනීම අපේක්ෂා කෙරිණි.

අරමුණු

මෙම ඇගයීමෙහි ප්‍රධාන අරමුණ වූයේ සූර්ය බල ශක්ති බිංදු ජල සම්පාදන පද්ධති සැපයීමෙහි අරමුණුවල සාධනය සහ අනාගතයේ සමාන ව්‍යාපෘති සඳහා උපායමාර්ගයන් පිළියෙළ කිරීමට මූලික බලපෑම් තක්සේරු කිරීමයි. අධ්‍යයනයේ සුවිශේෂ අරමුණු නම්,

i ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී අනුගමනය කළ මැදිහත්වීමේ නැඹුරුතාවය සහ ක්‍රියාකාරීත්වයේ සාර්ථක අසාර්ථකභාවය අධ්‍යයනය කිරීම.

ii ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා තෝරාගත් ආයතනික යාන්ත්‍රණයේ සහ හැකියා වර්ධන වැඩසටහන්වල සාර්ථකභාවය සොයා බැලීම.

iii ව්‍යාපෘතියට අදාළ විවිධ පාර්ශවකරුවන් විසින් ඔවුන්ට අදාළ වගකීම් හා කාර්යභාරයන් ඉටු කළා ද යන්න ඇගයීම.

iv සූර්ය බල ශක්ති ක්ෂුද්‍ර වාරි පද්ධතිවල ක්‍රියාකාරීත්වය විභාග කිරීම.

v සූර්ය බලශක්ති ක්ෂුද්‍ර වාරි පද්ධති භාවිත මට්ටම පිළිබඳ සොයා බැලීම.

vi ක්ෂුද්‍ර වාරි ක්‍රමවේදයෙහි ඉදිරි තත්ත්වය සහ ගැටළු හඳුනා ගැනීම.

vii බෝග වගාව, අස්වැන්න හා එහි ගුණාත්මක තත්ත්වය වැඩි කිරීමේ දී, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පවුලේ ආදායම් මට්ටම හා සුබසාධනය වැඩි වර්ධනය කිරීමේ දී ක්ෂුද්‍ර වාරි පද්ධතිවල බලපෑම තක්සේරු කිරීම.

viii සූර්ය බලශක්ති ක්ෂුද්‍ර වාරි ක්‍රමවේදයෙහි අනාගත ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ සැකසීම

අනෙකුත් ක්‍රියාකාරකම්

පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය මගින්, ආසියා පැසිපික් කලාපය සඳහා වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය (CIRDAP) හා ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ජාතික ආයතනය (NIRD) හා සහයෝගීත්වයෙන් ග්‍රාමීය පානීය ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩසටහන 2010 නොවැම්බර් 1-10 දක්වා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තුළ දී සාර්ථකව මෙහෙයවිය. කලාපීය රටවල් 10 කින් 21 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගීත්වය ලබා දෙන ලදී.

අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය (වෙළෙඳපොළ පර්යේෂණ ඒකකය) ජාතික මට්ටමෙන් පාලනය කළ ජීවන වියදම් සමාලෝචන කමිටුවට වෙළෙඳපොළ තොරතුරු සම්පාදනය සඳහා 1979 දී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තුළ ස්ථාපිත කෙරිණි. එතැන් පටන් මෙම අංශය ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ව්‍යවසායකයින්ට, වෙළෙඳ ප්‍රජාවට ගොවීන්ට හා විද්‍යාර්ථීන්ට අදාළ දත්ත හා තොරතුරු සම්පාදනය කරන ලදී.

ඊට අමතර ව මෙම ඒකකය රාජ්‍ය ආයතනවලට (ගුවන් හමුදා, යුද හමුදා, නාවුක හමුදා, රෝහල් සහ බන්ධනාගාර) ආහාර මිල දී ගැනීම් සඳහා සුදුසු ම මිල ගණන් තීරණය කිරීමට ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පිහිටි ආහාර මිලදී ගැනීම් හා මෙහෙයුම් කමිටුව වෙත මිල ගණන් සපයනු ලැබේ.

අඛණ්ඩ වැඩසටහන

ආහාර තොරතුරු ව්‍යාපෘතිය

පර්යේෂණ කණ්ඩායම	:	සී.පී. හතුරුසිංහ මහත්මිය	- සම්බන්ධීකාරිකා
		ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා	- සම පර්යේෂක
		ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය	- සම පර්යේෂිකා
		ආර්.පී. විදානපතිරණ මහත්මිය	- සම පර්යේෂිකා
		ටී.පී. සෝමරත්න මහතා	- සම පර්යේෂක
		ඩබ්.එම්.ඩී. ප්‍රියදර්ශන මහතා	- සම පර්යේෂක
		එන්.පී.ජී. සමන්ත මහතා	- සම පර්යේෂක
		ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	- සම පර්යේෂක
		එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	- සම පර්යේෂක
සහාය	:	සංඛ්‍යාන නිලධාරීන්	- 02
		සංඛ්‍යාන සහකාරවරුන්	- 11
		අනියම් විමර්ශකවරුන්	- 28

අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය මගින් ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා කාලීන හා නිරවද්‍ය දත්ත හා තොරතුරු සම්පාදනය කරනු ලැබේ. සාමාන්‍යයෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් සහ අදාළ වෙළෙඳපොළ තොරතුරු පිටකොටුව, තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත සහ කිරිබත්ගොඩ යන සිල්ලර වෙළෙඳපොළ 9 කින් ද පිටකොටුව තොග වෙළෙඳපොළෙන් ද එකතු කර ගනු ලැබිණි. ඊට අමතර ව, ප්‍රධාන ආහාර නිෂ්පාදන හා ආහාර පාරිභෝජනය කරන දිස්ත්‍රික්කවල වෙළෙඳපොළ 24 කින් ද දත්ත හා තොරතුරු එකතු කර ගැණිනි.

දත්ත එකතු කිරීම සංඛ්‍යාන නිලධාරීන් 2 නෙක්, සංඛ්‍යාන සහකාරවරුන් 7 දෙනෙක් සහ අනියම් විමර්ශකයින් 20 දෙනෙකු විසින් සිදු කරනු ලැබිණි. පිට පළාත්වල දත්ත එකතු කිරීම සඳහා සංඛ්‍යාන නිලධාරීන් හා සංඛ්‍යාන සහකාරවරුන් යන දෙපිරිස ම සහ අනියම් විමර්ශකවරුන් 15 දෙනෙකු සේවයෙ හි නිරත වූහ.

2010 වසර තුළ කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුර, තඹුත්තේගම, පොළොන්නරුව, නුවරඑළිය, නුවර, හගුරන්කෙත, බදුල්ල, කැප්පෙටිපොළ, රත්නපුර, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාමය, මාතර, ගාල්ල, කළුතර, මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, අම්පාර, පුත්තලම, මරදගහමුල, මීගොඩ සහ නාරාහේන්පිට යන ස්ථාන ආවරණය කරන ලදී.

ඊට අමතර ව දිනපතා ම පිටකොටුව, නුවර, දඹුල්ල, නොරොච්චෝලේ, මරදගහමුල, මීගොඩ සහ නාරාහේන්පිට යන වෙළෙඳසැල්වලින් ආහාර ද්‍රව්‍යවල තොග මිල ගණන් රැස් කරනු ලැබිණි. වාණිජ හා පාරිභෝගික සබඳතා අමාත්‍යාංශයේ ඉල්ලීමක් පරිදි 2010 ඔක්තෝබර් සිට ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල දෛනික ව එකතු කිරීම ඇරඹිණි. ප්‍රධාන තොග වෙළෙඳපොළ මෙන් ම පිටකොටුව සිල්ලර වෙළෙඳපොලේ අදාළ අවස්ථාවේ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් පිළිබඳ ව දිනපතා විද්‍යුත් මාධ්‍යයන්ගෙන් ප්‍රචාරය කරමින් නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් දැනුවත් කෙරිණි. කොළඹ සහ අවට තොග හා සිල්ලර වෙළෙඳපොළ මිල ගණන් මෙන් ම, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල ගොවිපොළ මිල ගණන් විශ්ලේෂණය

කරමින් සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව සෑම සිකුරාදා දිනක ම නිකුත් කෙරෙ. අදාළ කාලය තුළ සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාවන් 52 ක් හා මාසික ආහාර තොරතුරු විවරණිකාවන් 12 ක් නිකුත් කරන ලදී.

2010 වසරේ ප්‍රගතිය

- සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව - විවරණිකා 52 ක් නිකුත් කෙරිණි.
- වසර පුරා ම අදාළ ආයතන සඳහා දිනපතා ආහාර මිල ගණන් සපයන ලදී.
- මාසික ආහාර තොරතුරු විවරණිකාව - විවරණිකා 12 ක් නිකුත් කෙරිණි.
- ජනමාධ්‍යයන් සඳහා අවශ්‍ය පරිදි දිනපතා හා සතිපතා වෙළෙඳපොළ තොරතුරු සම්පාදනය කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් ඉල්ලුම් කරන ලද මිල තොරතුරු හා අනෙකුත් වෙළෙඳපොළ තොරතුරු වර්ෂය මුළුල්ලේ ම සපයන ලදී..

අවසන් කළ අධ්‍යයන

1. **සුපිරි වෙළෙඳසැල් මඟින් එළවළු බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ එමඟින් ගොවියන්ට සිදුවන බලපෑම පිළිබඳ අධ්‍යයනය**

පර්යේෂණ කණ්ඩායම	:	ආර්.පී. විදානපතිරණ මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	සම පර්යේෂක
		ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

ශ්‍රී ලංකාව තුළ සුපිරි වෙළෙඳසැල් වේගවත් ව ව්‍යාප්ත වෙමින් පවතින අතර, ස්ථාවර ව ආයතනගත වී ඇත. සුපිරි වෙළෙඳසැල්, මිලදී ගැනීමේ ක්‍රමයෙහි වෙනසක් පමණක් ම නොව, නව මිල දී ගැනීම් ක්‍රමවේදයන් තුළින් නිෂ්පාදකයා හා සිල්ලර වෙළෙන්දාගේ සබඳතාවයෙ හි හා ආහාර සැපයුම් චක්‍රයේ විප්ලවීය වෙනසක් ද සිදු කර තිබේ. කෘෂි ආහාර පද්ධතියෙහි ව්‍යුහයට සහ තත්ත්වයට සුපිරි වෙළෙඳසැල්වලින් ඉහළ බලපෑමක් දිගුකාලීන ව අපේක්ෂා කළ හැකිය. එය සුපිරි වෙළෙඳසැල්වල ඉල්ලුමට අනුව නිෂ්පාදන සැපයිය හැකි වෙළෙඳුන් සඳහා නව අවස්ථා නිර්මාණය කරයි. ඒ අනුව කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ ජීවිකාව නඟා සිටුවීම සඳහා මෙම වෙනස්වීම්, නව අවස්ථා හා අභියෝග පිළිබඳව දැනුවත්වීම රජයකට ඉතා වැදගත් ය. සුපිරි වෙළෙඳසැල් මඟින් එළවළු මිල දී ගැනීමේ ක්‍රියාවලිය විශේෂයෙන් අරමුණු කොටගෙන අදාළ හිඩැස පිරවීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරන ලදී. සුපිරි වෙළෙඳසැල් එළවළු සැපයුම් ක්‍රියාවලියේ සංවිධානාත්මකභාවය සහ එම ක්‍රියාවලිය පිළිබඳවත්, සාම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රමවේදයට සාපේක්ෂව ගොවීන්ට ඒ තුළින් සිදු කරනු ලබන බලපෑම පිළිබඳවත් අධ්‍යයනය කිරීමට මෙම අධ්‍යයනයෙන් උත්සාහ ගෙන තිබේ. මෙහි දී නුවරඑළිය, බණ්ඩාරවෙල, තඹුත්තේගම යන ප්‍රදේශවල සාම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රමය අනුගමනය කළ ගොවීන් 100 ක් හා සුපිරි වෙළෙඳසැල් හා සම්බන්ධිත ගොවීන් 100 ක් සම්මුඛ සාකච්ඡාවකට භාජනය කරමින් සමීක්ෂණ 2 ක් මෙහෙයවනු ලැබිණි. විවිධ සුපිරි වෙළෙඳසැල්වල එළවළු සිල්ලර මිල ගණන් විමසීමට හා එය සාම්ප්‍රදායික ක්‍රමය හා සැසඳීමට ඒකමාර්ගික විචල්‍ය විශ්ලේෂණ භාවිතා කෙරිණි. තව ද සාම්ප්‍රදායික ක්‍රමයට බැඳුණු ගොවීන් හා සුපිරි වෙළෙඳසැල් හා බැඳුණු ගොවීන් මඟින් ලබා ගත් මිල ගණන් ද විශ්ලේෂණය කෙරිණි.

අරමුණු

i. එළවළු මිල දී ගැනීමේ ක්‍රියාවලියට විශේෂ අවධානය යොමු කරමින් සුපිරි වෙළෙඳසැල් හි සැපයුම් චක්‍රයේ සංවිධානාත්මක ස්වරූපය සහ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම හා එහි සීමාවන් හඳුනා ගැනීම.

ii. සුපිරි වෙළෙඳසැල් සඳහා එළවළු සැපයීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම.

iii. සාම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රියාවලිය සහ සුපිරි වෙළෙඳසැල්වලට එළවළු සැපයුම් ක්‍රියාවලිය පිළිබඳ ගොවීන්ගේ අදහස් සැසඳීම.

iv. විවිධ සුපිරි වෙළෙඳසැළ හා සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැළ එළවළුවල සිල්ලර මිල ගණන් හි වෙනස අධ්‍යයනය කිරීම.

සොයා ගැනීම්

i සාම්ප්‍රදායික වෙළෙඳසැල් වෙත එළවළු සපයන ගොවියන්ට වඩා සුපිරි වෙළෙඳසැළවලට එළවළු සැපයූ ගොවීන් සුළු වශයෙන් හෝ වැඩි ආදායමක් හිමි කරගත් බව අධ්‍යයනය මගින් සොයා ගැනිණි. එම නිසා සුපිරි වෙළෙඳසැල් වෙත එළවළු සැපයීම ගොවීන්ගේ ආදායමට ධනාත්මක බලපෑමක් සහ එයින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය වීමක් සිදු වී තිබුණි.

ii සුපිරි වෙළෙඳසැල් හා සම්බන්ධ ගොවීන් සාම්ප්‍රදායික ක්‍රමයට සාපේක්ෂව එම ක්‍රමවේදය තෝරාගෙන ඇත්තේ ඉහළ ගොවිපොළ මිලක් බලාපොරොත්තුවෙන් බව අධ්‍යයනය මගින් පැහැදිලිව ම පෙන්නුම් කෙරිණි. සුපිරි වෙළෙඳසැල් තෝරාගත් ගොවීන්ගෙන් 71% ක් ඉහළ ගොවිපොළ මිලක් ගෙවීම නිසා එය තෝරාගෙන ඇති අතර සාම්ප්‍රදායික ක්‍රමය තෝරාගත් ගොවීන්ගෙන් 75% ක් එම අලෙවි මාර්ගවලට පිවිසීම පහසු නිසා එම ක්‍රමය තෝරාගෙන තිබුණි.

iii අනෙකුත් රටවල සුපිරි වෙළෙඳසැල් සහ ඒ සඳහා එළවළු සපයන ගොවීන් අතර යම් යම් ගිවිසුම් පවතින නමුත්, ශ්‍රී ලංකාවේ සුපිරි වෙළෙඳසැල් හා ගොවීන් අතර එවැනි ගිවිසුමක් නොමැති බව අධ්‍යයනය මගින් අනාවරණය කෙරිණි.

iv සියළු ම අධ්‍යයන ප්‍රදේශ තුළ සුපිරි වෙළෙඳසැල් හා බැඳුණු ගොවීන්ගෙන් 87% කට වඩා වැඩි ප්‍රමාණයක් කාලයෙන් කාලයට තම නිෂ්පාදන අලෙවි කරනු ලබන සුපිරි වෙළෙඳසැල් වෙනස් නො කරන බව අනාවරණය විය. සෑම අධ්‍යයන ප්‍රදේශයක ම ගොවීන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වසර 3 කට වඩා වැඩි කාලයක සිට සුපිරි වෙළෙඳසැල වෙත එළවළු සපයමින් සිටියහ. ගොවීන්ගේ අත්දැකීම් අනුව, සුපිරි වෙළෙඳසැල් සඳහා එළවළු සපයන ගොවීන් අදාළ කාලපරිච්ඡේදය තුළ වර්ධනය වූ බවක් අනාවරණය විය. එසේ ම ගොවීන් අඛණ්ඩව ම සුපිරි වෙළෙඳසැල් වෙත එළවළු සපයන ලදී. මෙමගින් පෙන්නුම් කරන්නේ සුපිරි වෙළෙඳසැල් සමග ගනුදෙනු කිරීමේ දී ගොවීන් විශ්වාසදායක බැඳීමක් ගොඩනගාගෙන ඇති බව යි.

v සාම්ප්‍රදායික ක්‍රමය හා සැසඳීමේ දී සුපිරි වෙළෙඳසැල් මගින් මිල දී ගන්නා ප්‍රමාණය සීමා කරනු ලැබීම නිසා සුපිරි වෙළෙඳසැල් ආශ්‍රිත ගොවීන්ගෙන් බහුතරය තම සමස්ත නිෂ්පාදනයෙන් 50% කටත් වඩා අඩුවෙන් සුපිරි වෙළෙඳසැල් වෙත අලෙවි කොට ඇත. ඒ අනුව එම ගොවීන් බහුතරයක් නිෂ්පාදනයෙන් සුළු ප්‍රමාණයක් සුපිරි වෙළෙඳසැල වෙත අලෙවි කරන අනෙකුත් විකුණුම් මාර්ග ද සොයා ගත යුතු විය.

vi සියළු අධ්‍යයන ප්‍රදේශවල ගොවීන්ගෙන් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් ඔවුන්ගේ එළවළු සුපිරි වෙළෙඳසැල්වල එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත ගෙන එනු ලබන්නේ කි.මී. 10 කටත් වඩා අඩු දුර පරාසයක සිට බව අධ්‍යයනය තුළින් සොයා ගන්නා ලදී. එයින් අර්ථවත් වන්නේ, නියදි ගොවීන්ගෙන් වැඩි දෙනාට ඔවුන්ගේ එළවළු පහසුවෙන් හා කඩිනමින් එකතු කිරීමේ මධ්‍යස්ථාන කරා ප්‍රවාහනය කිරීමට හැකි බවත් එමගින් ප්‍රවාහනයේ දී එළවළුවලට සිදුවන හානිය අවම කිරීමට ද හැකි වන බව යි. නිෂ්පාදකයන් බොහෝ දුරක විසිර සිටී නම් හා යටිතල පහසුකම් දුර්වල ව පැවති නම් එකතු කිරීමේ දී වැය වන පිරිවැය ද විශාල විය හැකි ය. එම නිසා සුපිරි වෙළෙඳසැල්, එකතු කිරීමේ මධ්‍යස්ථානවලට සමීප ගොවීන්ගෙන් එළවළු මිල දී ගැනීමේ ප්‍රවණතාවයක් පවතී.

vii ගොවීන්ට එළවළු වගා කිරීමේ දී සුපිරි වෙළෙඳසැල් මගින් කිසිදු උපදෙසක් හෝ ප්‍රමිතියක් ලබා නොදෙන බව අධ්‍යයනය මගින් අනාවරණය විය. කෙසේ නමුත් විකුණන අවස්ථාවේ දී සුපිරි වෙළෙඳසැල් විසින් එළවළුවල ප්‍රමිතීන්ට අනුව එළවළු වර්ග කිරීම සහ ශ්‍රේණිගත කිරීම සිදු කරන අතර ඒවා ප්‍රමිතියට අනුකූල නොමැති නම් ප්‍රතික්ෂේප කරනු ලබයි.

viii සුපිරි වෙළෙඳසැල් ආශ්‍රිත ගොවීන්ගෙන් බහුතරය නිෂ්පාදන සඳහා ඔවුන්ට ලැබුණු මිල ගණන් සමග තෘප්තිමත් වුව ද සාම්ප්‍රදායික ගොවීන්ගෙන් වැඩි දෙනා ඔවුන්ට ලැබුණු මිල ගණන් සමග තෘප්තිමත් නොවූහ. මෙයින් පෙන්නුම් කරන්නේ සුපිරි වෙළඳසැල් ඔවුන්ගේ මුදල් ගෙවීම් සම්බන්ධයෙන් විශ්වාසීභාවයක් ගොඩනගාගෙන ඇති බවයි.

ix අනෙකුත් රටවල සුපිරි වෙළෙඳසැල් හා බැඳුණු ගොවියන් ණය, යෙදවුම්, ව්‍යාප්ති සේවා හා ඉහළ මිලක් යටතේ වෙළෙඳපොළ සහතිකවීම වැනි විවිධ ප්‍රතිලාභ අත්පත් කරගැනීමක් සිදු කරනු ලබයි. කෙසේ නමුත් අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් 69% කට ඉහළ මිලක් ලැබීමට අමතර ව එමගින් වෙනත් කිසිදු අමතර ප්‍රතිලාභ හිමි නො වුනු බව අධ්‍යයනය මගින් සොයා ගන්නා ලදී.

x සුපිරි වෙළෙඳසැල්වලට එළවළු සැපයීමේ දී දේශීය සැපයුම්කරුවෝ අභියෝගවලට මුහුණ දෙති. සුපිරි වෙළෙඳසැළ වෙත එළවළු සැපයීමේ දී ඉහළ ආදායම් උපයන පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සමග ගළපමින් නිෂ්පාදනයන් හි ගුණාත්මකභාවය පිළිබඳ සහතික විය යුතු ය. ඔවුන්ගේ කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පැළ බෝග

අවධියේ පටන් ම සහතික විය යුතු නිසා එය අභියෝගයකි. රට තුළ ගුණාත්මකභාවයෙන් ඉහළ කෘෂිකාර්මික යෙදවුම් (පොහොර, බීජ) මිල අධික වන අතර, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ද දුර්වල ය. එම නිසා මනා ලෙස කෘෂිකර්ම පාලනය පිළිබඳ ගොවීන්ට ඇති දැනුම අල්ප ය. මෙම අධ්‍යයනයේ දී ගොවීන් විසින් මතු කරන ලද ප්‍රධාන ගැටළුවක් වන්නේ සුපිරි වෙළෙඳසැල් මගින් එක්වරක දී ඇනවුම් කරනු ලබන එළවළු ප්‍රමාණය සීමාවීම යි. එම නිසා එළවළු අලෙවිය සඳහා ඔවුන් විකල්ප මාර්ග ද සෙවිය යුතු ය. නිෂ්පාදනය ඉහළ මට්ටමක පවතින විට සුපිරි වෙළෙඳසැල් මගින් මිල දී ගන්නා ප්‍රමාණය අඩු ය. ගොවීන් ප්‍රවාහන වියදම් ද දැරිය යුතු ය.

xi සුපිරි වෙළෙඳසැල් හා සම්බන්ධිත ගොවීහු සාම්ප්‍රදායික ගොවීන් හා සසඳන කල ඉහළ මිල ගණන් ලැබූහ. තඹුත්තේගම සහ නුවරඑළිය සුපිරි වෙළෙඳසැල් හා සම්බන්ධ ගොවීන් සාම්ප්‍රදායික ගොවීන් විසින් ලබාගන්නා මිලට සාපේක්ෂ ව පිළිවෙළින් 47% ක හා 26% ක ඉහළ මිල ගණන් ලබා ගත්හ.

නිර්දේශ

i සුපිරි වෙළෙඳසැල් හා ඔවුන්ගේ සැපයුම්කරුවන්, කුමක් කවදා නිෂ්පාදනය කරන්නේ ද යන්න පිළිබඳවත් අස්වනු නෙළන කාලය පිළිබඳවත් ගොවීන් දැනුවත් කළ යුතු වේ. කෘෂිකාර්මික යෙදවුම්, ව්‍යාප්ති සේවා, පුහුණු කිරීම් ආදිය සම්බන්ධයෙන් පහසුකම් සැපයීම සඳහා ඔවුන්ට භූමිකාවක් තිබේ. සුපිරි වෙළෙඳසැල් සඳහා කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ සහභාගීත්වය තිරසර අයුරින් ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයට ම වගකීමක් පවතී.

ii නිෂ්පාදකයන්ගේ ස්වයං විශ්වාසය හා ධාරිතාවය වර්ධනය කරන පහසුකම් සැපයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ද ඔවුන්ට සහාය විය හැක. රාජ්‍ය ආයතන මගින් සුපිරි වෙළෙඳපොළවල් හා සුළු පරිමාණ නිෂ්පාදකයන් අතර සුහද මෙන් ම වාසිදායක සබඳතාවක් ගොඩනැගීම සඳහා මෙන් ම දෙපාර්ශවයේ ආර්ථිකමය හිමිකම රැකෙන පරිදි නීතිමය රාමුවක් ද සැපයෙන පරිදි ප්‍රතිපත්තිමය පරිසරයක් සැපයිය යුතු ය.

iii සුපිරි වෙළෙඳපොළ සඳහා හුවමාරු පිරිවැය අඩු කරමින් ගොවීන්ට ඉහළ මිලක් ලැබෙන පරිදි දෙපාර්ශවයට ම යහපත් වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා ගොවීන් කණ්ඩායමක් වශයෙන් සංවිධානගත විය යුතු ය.

iv රජය විසින් මෙම නව වෙළෙඳපොළ අවශ්‍යතා ඉටු කරලීම පිණිස පූර්ව හා පසු අස්වනු ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ගොවීන්ට උපකාර වන සංවර්ධන වැඩසටහන් ඇති කළ යුතු ය. එමෙන්ම ගොවීන්ට සහාය දැක්වීමට, යෙදවුම් සමාගම්, සුපිරි වෙළෙඳසැල් හා බැංකු යන ත්‍රෛපාක්ෂික පෙළගැස්වීම් පිළිබඳව ද අධ්‍යයනය කළ යුතු ය.

v සීඝ්‍රයෙන් පරිවර්තනය වන දේශීය ආහාර වෙළෙඳපොළ තුළ ක්‍රියාකාරීව සහභාගීවීමට හැකි ලෙස අවශ්‍ය සම්පත් හා පුහුණුවීම් ගොවීන්ට අවශ්‍ය ය. විශේෂයෙන්ම කුඩා පරිමාණ ගොවීන්ට උපකාර සැපයීමට පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා අන්තර්ජාතික සංවර්ධන සංවිධාන සමග සබඳතා ඇති ව කටයුතු කිරීමට රජයට හැකි ය. එමගින් සුපිරි වෙළෙඳසැළකට සැපයීමට අවශ්‍ය ප්‍රමාණ සහ ධාරිතාවයන් ලබා ගැනීමට හැකි අයුරින් යෝජනා සංවිධානයට හා සමාගම් ක්‍රියාකාරී කිරීමට සහාය විය හැකි ය. ණය යෝජනා ක්‍රම ගොවීන් සඳහා හඳුන්වාදීම අවශ්‍ය වන්නේ සුපිරි වෙළෙඳසැළ මගින් ඉල්ලුම් කරන ඉහළ ගුණාත්මක බව හා ආරක්ෂිත ප්‍රමිතිය සඳහා අදාළ තාක්ෂණය අත්පත් කරගැනීමට හැකි වන නිසා ය.

2. ශ්‍රී ලංකාවේ ගෘහස්ථවල ආහාර මිල ගණන් ඉහළ යාමෙ හි බලපෑම

පර්යේෂණ කණ්ඩායම	: ටී.පී. සෝමරත්න මහතා	-	සම්බන්ධීකාරක
	එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	-	සම පර්යේෂක
මූල්‍ය මූලාශ්‍රය	: ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

2006 වර්ෂයේ සිට ලෝකයේ ආහාරවල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින අතර 2007 සහ 2008 වසරවල දී මිල ඉහළ යාමේ වේගය සාමාන්‍ය ඉහළ යාමට වඩා කැපී පෙනෙන ලෙස වැඩි වී තිබේ. මෙම ගෝලීය වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ ආහාර මිල ගණන් ද මෙම වසරවල ඉහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික, ග්‍රාමීය සහ වතු යන සෑම අංශයක ම ගෘහ ඒකකයන් ඉහළ යන මිල ගණන්වලට සාර්ථකව මුහුණදීම සඳහා අයවැය පාලනය කරගත යුතු ව තිබුණි. ඒ අනුව ඔවුන්ගේ මිල දී ගැනීමේ හැකියාව අඩු වී ඇති අතර, ආහාර අනාරක්ෂිතභාවයට පත් වී සිටී. ඉහළ යන

ආහාර මිල සමග මුහුණ දීම සඳහා ගනු ලබන විකල්ප උපායමාර්ග ඒ ඒ අංශයේ ගෘහ ඒකකයන්ගේ ජීවන රටාව අනුව එකිනෙකට වෙනස් ය.

එම නිසා ඉහළ යන ආහාර මිල ගණන් සමග ඒ ඒ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප ක්‍රියාමාර්ග විමර්ශනය කිරීම සහ එය ඔවුන්ගේ ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

අරමුණු

i 2007 සහ 2008 වසරවල ආහාර සම්බන්ධ උප අංශයෙ හි මිල ගණන් හි හැසිරීම විවරණය කිරීම.

ii ආහාර මිල ඉහළ යාම සමග ඒ ඒ අංශයන් හි ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපායමාර්ග විශ්ලේෂණය කිරීම.

iii නාගරික, ග්‍රාමීය හා වතු යන ඒ ඒ අංශයන්ගෙන් ගෘහ ඒකකයන්ගේ ආහාර සුරක්ෂිතතාවය සඳහා ආහාර මිල ඉහළයාමේ බලපෑම අධ්‍යයනය කිරීම.

iv ඒ ඒ අංශවල ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා යෝග්‍ය ආහාර සැපයුම් යාන්ත්‍රණයක් හඳුනා ගැනීම.

සොයා ගැනීම්

i ආහාර මිල ගණන්වල හි ඉහළ යාමේ නැඹුරුතාවය ගෘහ ඒකකවල මිලදී ගැනීමේ හැකියාවට එරෙහිව බලපා ඇත. කෙසේ නමුත්, මෙම බලපෑම වතු අංශයට මෙන්ම නාගරික පැල්පත් හා ධීවර අංශයන්ට දැඩිව බලපා තිබේ.

ii අධ්‍යයනය පෙන්නුම් කළේ, 2007 සිට 2009 අතර සහල්වල මිල ගණන් 100% කින් වැඩි වී ඇති බව යි. එසේ ම තිරිඟු පිටි 89% කින් ද, පාන් 71% කින් ද, මාංශ බෝග 56% කින් ද, පිළිවෙළින් කිරිපිටි මිල ගණන් හා සීනි මිල ගණන් 71% කින් හා 31% කින් ද වැඩි වී තිබේ.

iii ගෝලීය ආහාර වැඩසටහන් ආකෘතිය ආදේශ කරගැනීමේ දී, අනෙක් අංශයන් හා සන්සන්දනය කරන කල වතු අංශය, නාගරික පැල්පත් හා ධීවර කර්මාන්තවල ගෘහ ඒකක මට්ටම්වල දී ආහාර පාරිභෝජන අය අංකය අන්‍යෝන්‍ය වශයෙන් අවම තත්ත්වයක පවතී. තව ද, ආහාර පරිභෝජන අය අංකය පෙන්වා දෙනු ලැබුයේ අධ්‍යයනයේ නියැදි ජනගහනයෙන් 14% ක් ආහාර අනාරක්ෂිතතාවයට පත් ව ඇති බව යි. කෙසේ නමුත්, අනෙක් අංශවල ආහාර අනාරක්ෂිතතාවයේ මට්ටම් වුයේ වතු අංශය 42% ක්, නාගරික පැල්පත් 40% ක් හා ධීවර කර්මාන්තය 28% ක් ආදී ලෙස ය.

iv ආහාර මිල ගණන් ඉහළ යාම නිසා නියැදියේ සියළුම ගෘහ ඒකක ඔවුන්ගේ අයවැය පියවා ගැනීමට විවිධ විකල්ප උපායන් යෙදුහ. මින් ප්‍රධාන විකල්ප උපාය මාර්ගයන් වුයේ, ආහාර වර්ගවලින් මිල දී ගන්නා ප්‍රමාණයන් අඩු කිරීම (80%), ණය ඉල්ලීම (66%) සහ දෛනිකව පාරිභෝජනය අඩු කිරීම (66%) යි. අමතර වශයෙන් හිතවතුන්ගෙන්, නෑදෑයන්ගෙන් හා අසල්වැසියන්ගෙන් ආහාර ණයට ඉල්ලා ගැනීම (57%) සහ විවිධ දෑ විකිණීම හෝ උකස් තැබීම ද විකල්ප උපාය මාර්ගයන් විය.

v පසුගිය වසර දෙක අතරතුර දී ආහාර මිල ගණන් ඉහළ යාම හා රෝගී තත්ත්වයන් මෙන්ම සෞඛ්‍යාරක්ෂාව සඳහා වු වියදම් ගෘහ ඒකකයන් විසින් මුහුණ දෙනු ලැබූ බරපතල ම අපහසුතාවයන් විය. එය පිළිවෙළින් 32% ක් හා 29% ක් විය.

vi වර්තමානයේ ක්‍රියාත්මක වන ගෙවතු සංවර්ධන වැඩසටහන ආහාර සුරක්ෂිතභාවය වැඩි කිරීමට වැඩි දායකත්වයක් නොවී ඇති අතර නියැදිය තුළ ගෘහ ඒකකවලින් 55% ක් පමණක් ඔවුන්ගෙම ගෙවතු සංවර්ධනය කර ඇති බව සොයා ගන්නා ලදී.

vii රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි වැඩසටහන ප්‍රධානම ආහාර සහනාධාර වැඩසටහන වු අතර එය නියැදි ගෘහ ඒකකවලින් 24% ක් ආවරණය කරන ලදී, ග්‍රාමීය අංශය තුළ එය 35% ක් ද වතු, නාගරික පැල්පත් හා ධීවර ගෘහ ඒකකවල පිළිවෙළින් 20, 24% හා 24% ක් ආවරණය කරන ලදී.

නිර්දේශ

i ප්‍රධාන ම ආහාර සහනාධාර වැඩසටහන මෙම ගෘහ ඒකකයන් ඉලක්ක නොකළ නිසා වර්තමාන ආහාර සහනාධාර වැඩසටහන වතු, නාගරික, පැල්පත් හා ධීවර ජන සමාජවල දුගී ම ජනතාව ඉලක්ක කරගනිමින් ප්‍රතිසංවිධානය විය යුතු ය.

ii ගෘහණියන් සඳහා යෝග්‍ය ව්‍යාප්ති සේවා යාන්ත්‍රණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් හඳුන්වාදීම මගින් සෑම අංශයක් තුළ ම ඔවුනොවුන්ගේ ආහාර සැපයුම වැඩිකරලීමට ගෙවතු සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් අවශ්‍ය වේ.

iii මිල දී ගැනීමේ හැකියාව වර්ධනයත් දුගී ජනතාවගේ ණයගැතිභාවයෙන් ඔවුන් මුදවා ගැනීමට සහායක් වන නිසාත් ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය සඳහා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් තුළ දුගී ජනතා සහභාගීත්වය අවශ්‍ය ම ය.

iv ප්‍රාදේශීය ව මුල් කරගත් ආහාර වර්ධනය කිරීමේ වැඩසටහනක් නිර්මාණය හා ආහාර මිල ගණන් අඩු කිරීම සහ දුගී ජනතාවගේ මිල දී ගැනීමේ හැකියාව වර්ධනය කරලීම බලවත් අවශ්‍යතාවයන් ය.

v නාගරීකරණය අඩු ප්‍රදේශ තුළ පිහිටි ප්‍රාදේශීය ආහාර වෙළෙඳපොළ යටිතල පහසුකම් වර්ධනය, වෙළෙඳපොළ පිරිවැය අඩු කිරීම සහ මනා ආහාර බෙදා හැරීමේ ජාලයක් පිහිටු වීම සිදු කළ යුතු ය.

3. ශ්‍රී ලංකාවේ ලොකු ළූනු බීජ නිෂ්පාදනය සහ අලෙවිය

පර්යේෂණ කණ්ඩායම	:	එන්.පී.ජී. සමන්ත මහතා	–	සම්බන්ධීකාරක
		ආර්.පී. විදානපතිරණ මහත්මිය	–	සම පර්යේෂිකා
		එම්.ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය	–	සම පර්යේෂිකා
මූල්‍ය සම්පාදන මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

ලොකු ළූනු වාණිජ වගාවක් ලෙස 1980 දශකයේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාව තුළ ආරම්භ වූ අතර, වගාබිම් ප්‍රමාණය වාර්ෂික උච්චාවචනයන් සමගින් වර්ධනය විය. කෙටි කාලයක් තුළ ඉහළ ලාභයක් ලබාගත හැකිවීම හේතුවෙන් ගොවීන් අතර එය ඉතා ජනප්‍රිය වගාවක් වුව ද ගුණාත්වයෙන් යුතු බීජ හිඟකම දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනයේ දී ප්‍රබල ගැටළුවකි. සමස්ත බීජ සැපයුම දේශීය නිෂ්පාදනය සහ ආනයන මත පදනම් වන අතර දේශීය නිෂ්පාදනය සමස්ත සැපයුමෙන් 20% ක් පමණ වේ. එම නිසා දේශීය ලොකු ළූනු බීජ නිෂ්පාදන ඉහළ නැංවීම කාලීන අවශ්‍යතාවයකි. දේශීය ලොකු ළූනු බීජ නිෂ්පාදන වැඩසටහන් 1990 දශකයේ ආරම්භ කළ නමුත් මේ දක්වා අවශ්‍ය ඉලක්ක වෙත ළඟාවී නැත. එම නිසා ලොකු ළූනු සත්‍ය බීජ නිෂ්පාදනය සහ අලෙවිකරණ ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ලොකු ළූනු බීජ නිෂ්පාදනයේ දී ගොවීන් මුහුණ දෙනු ලබන ගැටළු හා බාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

විශේෂ අරමුණු

i ලොකු ළූනු බීජ බෙදා හැරීමේ විවිධ මාර්ග හඳුනා ගැනීම සහ විවරණය කිරීම.

ii ආනයනික ලොකු ළූනු බීජවල වර්තමාන තත්ත්වය තක්සේරු කිරීම.

iii ලොකු ළූනු බීජ නිෂ්පාදනය තුළ ගොවීන් විසින් මුහුණ දෙනු ලබන ගැටළු හා බාධක හඳුනා ගැනීම

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ඒකරාශී කිරීමට සාහිත්‍ය විමර්ශනය, මූලික සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි සමීක්ෂණ යන එකිනෙකට සම්බන්ධිත දත්ත රැස් කිරීමේ යාන්ත්‍රණ තුනක් භාවිතයට ගැනුණි. ප්‍රධාන වශයෙන් ලොකු ළූනු බීජ නිෂ්පාදිත ප්‍රදේශ වන මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල, දඹුල්ල, කිඹිස්ස සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම සහ මරදන්කඩවල යන ප්‍රදේශවලින් ගොවීන් 212 ක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

සොයා ගැනීම්

i ලොකු ළූනු බීජ නිෂ්පාදනය වැඩි අවදානමක් සහිත වන අතර මේ හේතුවෙන් ගොවීන් කුඩා බිම් කැබලි වගා කිරීමේ නැඹියාවක් දක්වයි. සමීක්ෂණයට අනුව නියැදි ගොවීන්ගෙන් 58% ක් ලොකු ළූනු බීජ කි.ග්‍රෑ. 5 කට වඩා අඩුවෙන් නිපදවන්නන් එනම්, සුළු පරිමාණයේ ගොවීන් ය.

ii මහ කන්නයට වඩා යල කන්නය තුළ වගාව බොහෝ ලාභදායක නමුත් යල දක්වා මවු බල්බ ගබඩා කිරීම, අධ්‍යයන ප්‍රදේශ තුළ ප්‍රධාන ම ගැටළුවක් විය. 30% ක ප්‍රතිශතයක ගොවීන් සතුව මවු බල්බ සඳහා මනා ගබඩා පහසුකම් තිබූ අතර බිම අතුරාලීම, එල්ලීම වැනි සාම්ප්‍රදායික ක්‍රම අනෙකුත් ගොවීහු අනුගමනය කළහ.

iii බහුතරයක් ගොවීහු (67%) වගාව සඳහා තමන්ගේ ම මවු බල්බ භාවිතා කළහ. 2010 වසර තුළ අතිරික්ත නිෂ්පාදනයන් සිදු කළ ගොවීන්ගෙන් බහුතරයක් (55%) ප්‍රදේශය තුළ හෝ ප්‍රදේශයෙන් පිට අනෙකුත් ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදනය සෘජුව ම අලෙවි කළහ.

iv බීජ නිෂ්පාදකයන්ගෙන් 10% ක් පමණක් බීජ පනත යටතේ ලියාපදිංචි වී ඇත. දේශීය ව නිපද වූ බීජ සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, ආනයනික බීජවලට වඩා ඒවායේ මිල ගණන් පස් ගුණයකින් වැඩි වී ඇත.

v පෞද්ගලික සමාගම් කිහිපයක් ලොකු ළූනු බීජ නිෂ්පාදනය හා සම්බන්ධ වී සිටින අතර නිර්දේශිත වර්ගයන්ගේ මූලික බීජ අඩුකම හා පුහුණු ශ්‍රමික හිඟකම ඔවුන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රධානතම ගැටළු ය.

vi පෞද්ගලික සමාගම් ඉන්දියාවෙන් ලොකු ළූනු බීජ ගෙන්වන අතර, 2010 වසර තුළ කි.ග්‍රෑ. 39,210 ක් ආනයනය කර ඇත. ගොවීන් විසින් අනාවරණය කරන ලද්දේ, වෙළෙඳුන් ආනයනක බීජ කාලය ඉකුත් වූ බීජ සමග මිශ්‍ර කර විකුණන බව යි.

නිර්දේශ

i ලොකු ළූනු බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පළිබෝධ හා රෝග පාලනය පිළිබඳ මනා පුහුණුවක් ගොවීන් සඳහා ලබා දිය යුතු ය.

ii මහා පරිමාණයෙන් නිෂ්පාදනය සඳහා කැමති ගොවීන් තෝරාගෙන ඔවුන්ට අවශ්‍ය ගබඩා පහසුකම් හා මූල්‍ය පහසුකම් ලබාදීම කළ යුතු ය.

iii පෞද්ගලික අංශයේ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් මූලික බීජ නිෂ්පාදන වැඩසටහන් කඩිනම් කළ යුතු ය.

iv ප්‍රමිතියෙන් තොර බීජ ආනයනය වැළැක්වීම සඳහා වගකීම්සහගත පෞද්ගලික අංශයේ සමාගම්වලට පමණක් ආනයන අවසරය ලබා දිය යුතු අතර, ගොවීන්ට ප්‍රමිතියෙන් යුතු බීජ සැපයීම සහතික වීම හඳුනාගෙන බීජ සහතික කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු ය.

4. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ස්වයං රැකියා සඳහා තරුණ දායකත්ව වැඩසටහන ඇගයීම

පර්යේෂණ කණ්ඩායම	:	ඩබ්.එම්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	සම්බන්ධීකාරක
		ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	-	සම පරයේෂක
මූල්‍ය මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ සහයෝගය මගින් ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ආරම්භ කළ ස්වයංරැකියා ව්‍යාපෘතීන් තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

විශේෂ අරමුණු

i ස්වයං රැකියා වැඩසටහන මෙහෙයවීම සහ කාර්යසාධනය හඳුනා ගැනීම.

ii ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වයන් විභාග කිරීම.

iii ප්‍රතිලාභීන් විසින් මුහුණ දෙනු ලබන ගැටළු අර්ථාවබෝධ කිරීම.

iv වැඩසටහන වර්ධනය සඳහා යෝග්‍ය ප්‍රදේශ හඳුනා ගැනීම.

v වැඩසටහනෙහි තිරසාරභාවය සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

සොයා ගැනීම්

මෙම වැඩසටහන යටතේ සම්පූර්ණ ව්‍යවසායකයින් 183 ක් ණය ලබා ඇති අතර, ඔවුන්ගෙන් 151 දෙනෙකු අධ්‍යයනය සඳහා තෝරා ගැනිණි. අධ්‍යයනය සොයා ගනු ලැබුයේ 51 ක් වූ තම ප්‍රතිලාභීන් ව්‍යාපාර මත රැඳුණවුන් බව ය. ප්‍රතිලාභීන්ගෙන් 20% ක් වයස අවුරුදු 50 ට අඩු වූ බව සහ 40% ක් පමණ කාන්තා ව්‍යවසායකයින් බව මෙමගින් සොයා ගැනිණි. මුං ඇට, අන්නාසි, බුලත් වගා ව්‍යාපෘති අසාර්ථක වෙද්දී සත්ත්ව පාලනය, විසිතුරු මත්ස්‍ය පාලනය හා සහල් සැලසුම් ව්‍යාපෘති

සාර්ථක විය. සමීක්ෂණ කාලය තුළ 13% ක් වූ ව්‍යාපාරිකයන් ව්‍යාපාර අතරමග නතර කර තිබිණි. ආසන්න වශයෙන් 80% ක් ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ණය වාරික ප්‍රමාණය ගෙවා අවසන් කර තිබිණි. වැඩසටහන තුළ ප්‍රමාණවත් නොවන පුහුණු කිරීම් හා දිගින් දිගටම පෙළඹවීම නොමැතිකම දුර්වලතා ලෙස නිරීක්ෂණය කරන ලදී. සමස්තයක් වශයෙන් ව්‍යාපෘතිය සාර්ථක වීමේ හැකියාවෙන් යුතු ය.

නිර්දේශය

ප්‍රායෝගික පුහුණු කිරීම් ඇතුළත් කිරීම, ණය වැඩි කිරීම සහ දෙවැනි වාරිකය නිකුත් කිරීමට පෙර පළමු වාරිකය ගෙවා ඇත්දැයි නැවත පරීක්ෂා කිරීම ව්‍යාපෘතීන්ගේ සාර්ථකත්වය සඳහා යෝජිත මිනුම් වේ.

5. **අන්නාසි සහ කෙසෙල්වල වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාවලිය**

පර්යේෂණ කණ්ඩායම	:	සී.පී. හතුරුසිංහ මහත්මිය	-	සම්බන්ධීකාරිකා
		ආර්.පී. විදානපතිරණ මහත්මිය	-	සම පර්යේෂිකා
		ටී.පී. සෝමරත්න මහතා	-	සම පර්යේෂක
		ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය	-	සම පර්යේෂිකා
මූල්‍ය මූලාශ්‍රය	:	ඒකාබද්ධ අරමුදල		

විෂය ක්ෂේත්‍රය

යෙදවුම් සපයන්නන්ගෙන් නිෂ්පාදකයන්ට, නිෂ්පාදකයන්ගෙන් පරිභෝගිකයන්ට වශයෙන් වටිනාකම් එකතු කිරීමේ සංකල්පය නිෂ්පාදනය සඳහා අමතර වටිනාකමක් එක් කර ඇත. මේ අනුව වටිනාකම් එකතු කිරීමේ එක් එක් මට්ටම තුළ ඵලදායීතාවය පරිවර්තනය සහ අමතර වටිනාකම් එකතුවීම සිදු වේ. වටිනාකම් එකතු කිරීමේ එක් එක් මට්ටමේ දී හුවමාරු පිරිවැය සහ විවිධ එකතු කළ වටිනාකම් දැරීම තුළින් මෙම ක්‍රියාවලියේ නිරත වුවන් නිෂ්පාදන වෙනස්වීම් මෙහෙයවයි. පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම ඇතුළත්ව නානාවිධ ක්‍රියාකාරකම් වටිනාකම් එකතු කිරීම සඳහා හේතු වේ.

1990 සිට කෙසෙල්වල ගොවිපොළ මිල ගණන් අනුක්‍රමයෙන් වර්ධනය වූ අතර, වාර්ෂික සාමාන්‍ය අගය පසුගිය දශක දෙක තුළ සැලකිය යුතු තරම් ඉහළ ගියේය. පසුගිය දශක දෙක තුළ මුරුසි සහ කිව් යන අන්නාසි දෙවර්ගයේ ම ගොවිපොළ මිල ගණන් සැලකිය යුතු තරම් ඉහළ ගිය අතර. මුරුසි වර්ගයේ නැවුම් අන්නාසි සඳහා ඉල්ලුම තරමක් වැඩි විය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය මඟින් මෙහෙය වූ වෙළෙඳපොළ සමීක්ෂණය පරිදි කෙසෙල් සඳහා මාර්ග 3 ක් හා අන්නාසි සඳහා මාර්ග 4 ක් හඳුනාගන්නා ලදී.

ගැටළුව

මෙම අංශය සඳහා වටිනාකම් එකතු කිරීම විශ්ලේෂණය ශ්‍රී ලංකාව තුළ සිදු වන්නේ අල්පව ය. ගොවිපොළ සිට සිල්ලර මට්ටම දක්වා අලෙවිකරණ ක්‍රියාවලිය මිල පිළිබඳ පමණක් නොව විශ්වසනීයත්වයන් ප්‍රේරණය පිළිබඳ සහතික කරන තොරතුරු ද ලබා දේ. ගොවියා සහ පාරිභෝගිකයා අතර පවතින දුරස්ථභාවය නිසා, විශ්වසනීයත්ව මට්ටම තහවුරු කිරීම අපහසු ය. එම නිසා කෘෂි ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම සමග වූ සම්බන්ධතාවය තුළ ප්‍රයෝජනවත් වටිනාකම් එකතු කිරීමේ කරුණු කිහිපයක් බලපා ඇත.

අරමුණ

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ක්‍රමෝපායයන් 3 ක් තුළින් තරඟකාරීත්වය වර්ධනය සඳහා මාර්ග හඳුනාගැනීම යි. වඩා කාර්යක්ෂම ලෙස භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බාරදීම, ඇසුරුම් කිරීම ගුණාත්මක ප්‍රමිති වර්ධනය කිරීම, අංකගත කිරීම තුළින් නිෂ්පාදන අවකලනය කිරීම සහ නව වෙළෙඳසැළ ඉල්ලුම දිනා ගැනීම ඒවා යි. අරමුණු ක්‍රමවත් ව දක්වන්නේ නම්, දේශීය ව අපනයන කිරීමට තරම් ඉහළ වටිනාකමින් යුතු විශේෂ ප්‍රභේදයන් හඳුනාගැනීම, නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ එක් එක් පියවරයන් සඳහා කටයුතු කරන්නන් හඳුනා ගැනීම, තාක්ෂණය සහ සේවාවල නියැළි ප්‍රධාන යෙදවුම් සැපයුම්කරුවන් හඳුනාගැනීම, ගොවිපොළ මට්ටමේ දී ඵලදායීතා තත්ත්වයන් හඳුනා ගැනීම, වර්තමාන වෙළෙඳපොළ සහ විකල්පයන් හඳුනා ගැනීම, වටිනාකම් එකතු කිරීම සඳහා බලපෑම්සහගත ක්‍රියාකාරී සාධක විශ්ලේෂණය කිරීම, මැදිහත්ව ක්‍රියාත්මකවීම සඳහා කර්මාන්තය තුළ ක්‍රියාකරුවන්ගේ භූමිකා සහ සම්බන්ධතා විශ්ලේෂණය කිරීම, කෘෂිකාර්මික අංශය තුළ පාර්ශවකරුවන් හා ග්‍රාමීය දුගී ජනතාව දියුණු කිරීම තුළින් ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රයෝජනවත් නිර්දේශ සැලසීම යනාදිය යි.

නිගමනය

රාජ්‍ය අංශයේ ක්‍රියාත්මකභාවය මෙන් ම ප්‍රතිපත්තිමය අවශ්‍යතාවය පිළිබිඹු කරන කරුණු කිහිපයක් විශ්ලේෂණය පුරාම හඳුනාගත හැකි විය. ඊට අමතරව මෙම අංශය මගින් මුහුණ දෙන බොහෝ අභියෝග ඍජුවම පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය සමග ඇති කරන සම්බන්ධතාවය මත විසඳීම සිදු කළ හැකි ය. අන්නාසි සහ කෙසෙල් අලෙවි තරඟකාරීත්වය ඇති කරන අයහපත් බලපෑම් මර්දනය හෝ අඩු කිරීම සඳහා අධ්‍යයනය තුළින් මතු වූ, කරුණු වෙත යොමු වීමට යම් ක්‍රියාමාර්ග අවශ්‍ය ය.

නිෂ්පාදන පිරිවැය අවම කිරීම පිණිස පොහොර මිල ගණන් අඩු කරන ලෙස ගොවීන් විසින් ඉල්ලා සිටින ලදී. කෘෂි රසායන සහ ශ්‍රමික පිරිවැය සැලකිය යුතු තරම් ඉහළ යන ලදී. බෝග කළමනාකරණය, අස්වනු නෙළීම, පිරිසැකසීම, ඇසුරුම්කරණය සඳහා හැකියාවෙන් අනූන වූ කම්කරුවන් අවශ්‍ය ය. පොල් ඉඩම්වල අන්නාසි වගා කිරීම සහ සියළු ම අන්නාසි වගාකරුවන් පාහේ අන්නාසි වගාව සඳහා පොල් පොහොර භාවිතා කිරීම හේතුවෙන් පොල් වගාව සඳහා පොහොර සහනාධාරය සැපයීමට වර්තමානයේ රජයේ ගෙන ඇති තීරණය අන්නාසි වගාකරුවන් සඳහා සැලකිය යුතු මට්ටමේ වාසිසහගත තත්ත්වයක් වී ඇත.

කෙසෙල් අපනයනය හා සම්බන්ධ වී සිටි ජාත්‍යන්තර ව පිළිගත් පෞද්ගලික ආයතන මනාව බෝග නඩත්තුව සඳහා මෙන් ම අස්වනු නෙළීම, ඇසිරීම සඳහා අවශ්‍ය ගුණාත්මකභාවය සම්පූර්ණ කිරීමට ඉහළ තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරයි. කෙසේ නමුත් අනෙකුත් අපනයනකරුවන් අඩු පිරිවැය තාක්ෂණයක් භාවිතා කිරීම මගින් එම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට උත්සාහ කරන්නේ එය දේශීය අවශ්‍යතාවයට ප්‍රමාණවත් ය යන ඔවුන්ගේ ප්‍රායෝගික දැනුම පරිදි ය.

දේශීය වෙළෙඳපොළ සඳහා වවන්නෝ පලතුරු පැසුණු විට බෝග නෙළති. ඉන්පසු නෙළාගත් අස්වැන්න ආසන්න ම තොග වෙළෙඳපොළට අලෙවි කරති. ඇතැම් සුළු පරිමාණ වගාකරුවන් ඔවුන්ගේ අස්වැන්න ආසන්නතම එකතු කිරීමේ මධ්‍යස්ථානයට හෝ ජංගම එකතු කරන්නට විකිණීමට කටයුතු කරති. එමගින් නිරීක්ෂණය කළ හැකි වූයේ කෙසෙල් හසුරුවන ආකාරය කැණෙ හි යට ම ඇවරිවලට හානි සිදු කරන බව යි. ඒ අනුව පසු අස්වනු නාස්තිය අඩු කිරීම සහ ගුණාත්මක තත්ත්වය මෙන්ම නිෂ්පාදන ඉදිරිපත් කරන ආකාරය වැඩි දියුණු කිරීමට සුවිශේෂ ක්‍රමවේද කෙරෙහි සැලකිලිමත්වීම අවශ්‍ය ය. අස්වනු නෙළීම මනා ලෙස හසුරුවාලීම සඳහා සරළ පුහුණු කිරීම් හා අවධානය තුළින් හානිවීම හා නාස්තිය අවම වීම කරා ළඟා විය හැකි ය. තැලීම් සහ නාස්තිය අඩු කිරීම සඳහා ප්‍රවාහනය සහ ගබඩා කිරීම යොදා ගත හැකි ය. වගාකරුවන් පලතුරුවල බර වැඩි කිරීමට දරන උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ඉදුණු පලතුරුවලට බලපෑමක් සිදු වේ. මෙය අන්නාසිවල සහ කෙසෙල් පොත්තෙහි වැඩි තෙතමනය නිසා සිදු වේ. විශේෂයෙන් ම වැඩි තෙතමනයෙන් යුත් අන්නාසි රසයෙන් තොර අතර, මෙය පලතුරෙ හි බාහිර පොත්තෙ හි පෙනුම මගින් හඳුනාගත හැකි ය. මෙවැනි පලතුරුවලට අපනයන වෙළෙඳපොළ තුළ ඉල්ලුමක් නො පවතී.

මේ වන විට පලතුරු සඳහා ගෝලීය ඉල්ලුම ඉහළ ගොස් ඇත. පලතුරු අලෙවියේ දී, ඉහළ ගුණාත්මක අලුත් පලතුරු වසර පුරා ප්‍රශස්ත මට්ටමක පැවතීම ඉහළ ගොස් තිබුණි. කෘෂි නිෂ්පාදනයන්ට ඉහළ ම වටිනාකම පිළිබඳ විභවතාවයක් පලතුරු මගින් නියෝජනය කෙරේ. එසේ වුව ද, දේශීය වෙළෙඳපොළෙහි අලුත් අන්නාසි අපනයනය හෝ විකිණීම තුළ අන්නාසි මිලෙහි සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවීය. එකම වෙනස වන්නේ අපනයනය සඳහා අන්නාසි අස්වැන්න නෙළීමේ දී එය ඉදෙන්නට/පැසෙන්නට පෙර සිදු කිරීමයි. මෙරට අන්නාසි සහ ක්වැන්ඩිශ් වර්ගයේ කෙසෙල් ඉතා ඉහළ අපනයන තත්ත්වයක පවතී. අන්නාසි නිෂ්පාදනයේ දී සහ අලෙවියේ දී වැවිලිකරුවන් සහ අපනයනකරුවන් අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී. අපනයනකරුවන්ට වසර පුරා අලුත් අන්නාසි එකතු කිරීමේ හැකියාව පවතී. වැවිලිකරුවන් දේශීය වෙළෙඳපොළට අන්නාසි සපයනු ලබන්නේ විවෘත වෙළෙඳපොලේ තොග වෙළෙඳුන්ගේ ඉල්ලීම මත අස්වනු නෙළීමෙනි. ඔවුහු නිෂ්පාදනයන් සිල්ලර වෙළෙඳුන්ට සහ සුපිරි වෙළෙඳසැල්වලට අලෙවි කරති. මෙම තොග වෙළෙන්දෝ සුපිරි වෙළෙඳසැල් සහ අනෙකුත් ගිවිසුම් ගත මිලදී ගන්නන්ගේ අවශ්‍යතාවය මත පලතුරු වර්ගීකරණය / තේරීම සිදු කරනු ලැබේ.

නිර්දේශ

i. වත්මන් වෙළෙඳසැල් මෙම පලතුරු ආවරණය පුළුල් කිරීමට මාධ්‍ය හා දීර්ඝකාලීන ක්‍රමෝපායික දර්ශකයක් සහ සැලසුමක් අනුගමනය කොට රජයේ සහ පෞද්ගලික අංශයේ සංවාදය ශක්තිමත් කිරීම. මෙය සාක්ෂාත් කරගැනීමට වටිනාකම පිළිබඳ දම්වැළෙහි විවිධ භූමිකාවන් නිරූපනය කරන්නවුන් අතර විශ්වාසය ගොඩනැංවීම අවශ්‍ය වේ.

ii. ඉලක්කගත වෙළෙඳපොළවල් හි ඉල්ලුමට අනුව ගොවීන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිරෝගී බීජ නිෂ්පාදනය සහ විවිධ වූ පැළ බෙදාදීමේ වැඩසටහන් දියත් කිරීමට රජයේ සහ පෞද්ගලික අංශයේ කතිකාව ශක්තිමත් කළ යුතුය.

iii සැකසුම් අංශය සංවර්ධනය කිරීමට කෙටි හා මධ්‍යකාලීන මූල්‍ය ලබා ගැනීම දියුණු කළ යුතුය.

iv ඉලක්කගත වෙළෙඳපොළ සඳහා ජාත්‍යන්තර මට්ටමේ කාලීන තොරතුරු සහ ඉල්ලුම් කිරීමේ සහතිකය ගොවීන්ට සහ නිෂ්පාදකයාට ලබාගැනීමේ හැකියාව වැඩිදියුණු කළ යුතුය.

v බෙදා හැරීම පුළුල් කිරීම සඳහා මහා පරිමාණ නිෂ්පාදකයින්ට සහ සැකසුම්කරුවන් කරා ළඟාවීමට සුළු පරිමාණ ගොවියාට සහාය විය හැකි ආකාරයෙන් සැපයුම් දම්වැල සංවර්ධනය සහ ශක්තිමත් කළ යුතුය.

vi නිසි පාලන උපක්‍රම සහ මෙහෙයුම් මධ්‍යස්ථාන, මෙහෙයුම් ඇතුළත් පුහුණු වැඩසටහන්, පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් හි පවතින ගැටළු ආමන්ත්‍රණයට අදාළ වැඩසටහනක් දියත් කළ යුතුය.

vii වර්තමානයේ පවතින ව්‍යාප්ති සේවා ගැටළු අවම කිරීමට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේ ගොවිපොළ ව්‍යාප්ති සේවාවන්, තිරසර ධාරිතාවය හා ප්‍රවේශය ශක්තිමත් කළ යුතු ය.

viii පර්යේෂණ හා සංවර්ධන ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා නව ප්‍රභේදයන් සංවර්ධනය කරමින් නව වෙළෙඳපොළවල් සොයා ගැනීම සහ අනෙකුත් අපනයන රටවල් සමග තරගකාරීත්වය අවශ්‍ය වේ.

6. අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් හි සීනි ව්‍යාපෘතියේ පූර්ව ශක්‍යතා අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම : ආචාර්ය එල්.පී. රූපසේන - සම්බන්ධීකාරක

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න - සම පර්යේෂක

සංක්ෂේපය

ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් 2005 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමින් සීනි කර්මාන්තය, සංවර්ධනයේ ඉහළම ප්‍රමුඛතාවය ලබා දී ඇත. එමගින් ජාතික සීනි අවශ්‍යතාවයෙන් 50% ක ප්‍රතිශතයක් ලබා ගැනීමට ඉලක්ක කොට ඇත. මෙම ඉලක්කය සපුරා ගැනීමට හැකි වුව හොත්, කෘෂිකාර්මික පරිවර්තනයේ හා දළ දේශීය නිෂ්පාදනයේ කෘෂිකාර්මික ඉපිලීම උක් වගාවේ ප්‍රධාන භූමිකාවක් රඟදක්වයි. මෙම ඉලක්ක හඳුනා ගැනීම සඳහා අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශය මඟින් බිබිල, සියඹලාණ්ඩුව, අනුරාධපුර සහ කුරුණෑගල ප්‍රදේශයන් හි නව සීනි කර්මාන්තශාලා පිහිටුවීමට සැලසුම් කොට ඇත. උක් වගාව සඳහා භූමිය ප්‍රධාන සාධකයක් වීම සහ නව කර්මාන්ත ශාලා ස්ථාපිත කිරීමේ සිට එය අනිවාර්යයෙන් විමර්ශනය කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ප්‍රදේශයන් හි යෝජිත සැලසුම් සඳහා භූමිය ලබා ගැනීම තහවුරු කර ගැනීමට සැලසුම් කළ යුතු ය. අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති උක් පර්යේෂණ ආයතනය යෝජිත අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් හි සීනි ව්‍යාපෘති සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය ක්‍රියාත්මක කරන්නට යෙදුණි. කහටගස්දිගිලියේ කර්මාන්ත ශාලාව පිහිටුවීමට අපේක්ෂිත ය. මෙම දිස්ත්‍රික්කයන් හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහතුනකින් (13) උක් සැපයුම අපේක්ෂා කෙරේ. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහයක් (10) සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනකට අයත් ප්‍රදේශ මෙයට අයත් වේ.

අරමුණු

අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහතුනකට (13) අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාස 341 කට ඇතුළත් ප්‍රදේශයන් හි මෙම සමාජ-ආර්ථික පර්යේෂණය සිදු කරන ලදී. අතිරේක වැවිලි සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ උපදේශකත්වයෙන් අධ්‍යයන ප්‍රදේශයන් හඳුනා ගැණුනි. සමීක්ෂණයේ අරමුණු i) ජනතාවගේ ගති ලක්ෂණ, අධ්‍යාපන මට්ටම, රැකියාව, විරැකියාව, ඉඩම් හිමිකම, ඉඩම් භාවිතයේ රටාවන් හඳුනා ගැනීම. ii) පවතින යටිතල පහසුකම් පරීක්ෂා කිරීම. iii) තරගකාරී ලාභය සඳහා වැඩ කිරීම. iv) උක් වගාව සඳහා භූමියේ විභවතාවය තක්සේරු කිරීම.

කඩිනම් ඇගයීමක් විමසීමේ දී, පූර්ව ශක්‍යතා අධ්‍යයනයන් හි පුළුල්ව භාවිතා කරන ඍජු නොවන වාචික ක්‍රමය මගින් 2009 දෙසැම්බර් සිට 2010 මාර්තු දක්වා අධ්‍යයන ප්‍රදේශයන්ගෙන් තොරතුරු එක්රැස් කරගන්නා ලදී. මෙම ක්‍රමය යටතේ දත්ත එක්රැස් කිරීම සඳහා අධ්‍යයන ප්‍රදේශය පිළිබඳ පෘථුල දැනුමක් ඇති ග්‍රාම නිලධාරීන්, ගම් නායකයන්/මුලදෑනීන් තෝරා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සරල වක්‍ර තාක්ෂණික ක්‍රම ඇතුළත් සංඛ්‍යාන වාර ගණන සහ හරස් වගු ගත කිරීම භාවිතා කරන ලදී.

සොයා ගැනීම්

i වයාපෘතිය බල පැවැත්වෙන ප්‍රදේශයේ ලිංග භේදය අනුව බෙදී ගොස් ඇති ජනගහනය 367599 කි. ගෘහස්ථ ඒකක සංඛ්‍යාව 89325 ක් වන අතර ඉන් 75% ක් කෘෂිකාර්මික ගෘහස්ථයන් ය. ජනගහන් සාක්ෂරතාවය 96% ක් වූ අතර ඔවුන්ගෙන් තුනෙන් දෙකක් (2/3) අවම වශයෙන් ද්විතීය අධ්‍යාපනය ලබා තිබුණි. තවදුරටත් අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රමාණය 11% ක් විය. ගෘහස්ථයන්ගෙන් 45% කට ආසන්න ප්‍රමාණයක් දිළිඳුකමේ රේඛාවට වඩා පහළින් ජීවත් වන බව සොයා ගන්නා ලදී. මෙමගින් දැක්වෙන්නේ වර්තමාන බෝග වගාව / ගොවිතැන ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට උපකාරී නොවන බවයි. රැකියාවෙහි නියුතු ජනගහනයෙන් ආසන්න වශයෙන් 60% ක් කෘෂිකර්මාන්තයෙ හි නියුතු ව සිටිති. විරැකියාවෙන් සිටින ජනගහනය ලක්ෂය ඉක්මවන අතර ඔවුන්ගෙන් බහුතරය තරුණයන් ය.

ii බලපැවැත්වෙන ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය අක්කර 266059 කි. මෙම සමස්ත ප්‍රදේශයෙන්, වන ජීවී සහ වනාන්තර සඳහා 16% ක් වෙන් කොට ඇත. එමෙන් ම, පෞද්ගලික අයිතිය සතු භූමි ප්‍රමාණය 42% කි. අනවසරයෙන් අල්ලා ගත් භූමිය 17% ක් සේ ගණනය කොට ඇති අතර රජය නියෝජනය කරන භූමි ප්‍රමාණය 24% .කි. අල්ලා ගෙන සිටින භූමි ප්‍රමාණය ජාතික මට්ටමට සාපේක්ෂව විශාල ය. ප්‍රමාණයෙන් අක්කර 05 කට ඉහළ ගෙවතු වගා නොමැති භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් 16% ක් වේ. උක් වගාව සඳහා විභවතාවයක් සහිත භූමි ප්‍රදේශ වශයෙන් අක්කර 69,000 ක් හඳුනා ගෙන තිබේ.

iii ප්‍රධාන සෘතුමය බෝග වශයෙන් බඩ ඉරිඟු, තල, කලු කව්පි සහ මිරිස් මෙම ප්‍රදේශයේ වගා කෙරේ. ඉලක්ක කණ්ඩායම් සම්මුඛ සාකච්ඡාවලියේ දී අනාවරණය වූයේ පහසුව, සහතික වෙළෙඳපොළ සහ නිෂ්පාදනයේ අඩු අවදානම හේතුවෙන් අනෙකුත් බෝගයන්ට වඩා ගොවීන් උක් වගාවට කැමැත්තක් දක්වන බව යි.

iv ගෘහස්ථයන්ගෙන් 70% කට වැඩි සහ ආසන්න වශයෙන් 45% කට පිළිවෙළින් විදුලිය සහ දුරකථන තිබුණි. සමස්ත මාර්ගයන්ගේ දිග ප්‍රමාණය කි.මී. 5332 ක් වන අතර ඉන් 45% ක් සම්බන්ධ වන්නේ ගුරු පාරවල් (තාර නො දමන ලද) වලට ය. සමස්ත මාර්ගයන්ගේ දිග ප්‍රමාණයෙන් 73% ක් අලුත්වැඩියා කිරීම අවශ්‍ය වේ. මහජනයා භාවිතා කරන පාසැල්, වෛද්‍ය මධ්‍යස්ථාන, තැපැල් කාර්යාල, බැංකු සහ සන්නිවේදන මධ්‍යස්ථාන වැනි දෑ ප්‍රමාණවත් නොවන බව දැකිය හැකිය.

නිගමනය

යෝජිත කර්මාන්ත ශාලාවේ අවශ්‍යතාවය සපුරාලීමට අවශ්‍ය උක් වගාව සඳහා ඉඩම් දැනට පවතින කෘෂිකාර්මික ඉඩම්වලින් ලබා ගත හැකි බව අධ්‍යයනයේ නිගමනය යි. උක් වැනි බෝගයක් විශාල වශයෙන් වගා කිරීම සාපේක්ෂව වාසියක් බැව් සඳහන් කළ යුතු ය. එමෙන් ම, වගාවේ සහ කර්මාන්ත ශාලාවේ ක්‍රියාත්මක භාවයට අවශ්‍ය ශ්‍රමය ව්‍යාපෘති බල ප්‍රදේශයෙන් ම ලබා ගත හැකි ය. වාණිජ උක් වගාව සඳහා ජනගහනයේ අධ්‍යාපන මට්ටම අමතර සුදුසුකමක් වේ. කෙසේ වුව ද, විශේෂයෙන් ම මාර්ග වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පවතී.

කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයටත්, කෘෂිකර්ම අමාත්‍යාංශයටත් ඉදිරිපත් කළ විශේෂ වාර්තා

i කොළඹ දිස්ත්‍රික්කයේ වර්තමාන එළවළු බෙදා හැරීමේ රටාවන් සහ ඉල්ලුම - ආර්.පී. විදානපතිරණ

ii ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සඳහා වී අතිරික්තය සහ හිඟය, 2010 - ඩබ්.ඒ.එන්. විජේසූරිය

iii සහල් සඳහා උපරිම සිල්ලර මිල තීරණය කිරීම - 2010 ඔක්තෝබර්, සී.පී. හතුරුසිංහ, ඩබ්.ඒ.එන්. විජේසූරිය සහ යූ.ඒ.එස්. එදුස්සූරිය

iv 2000-2010 වී සහ සහල් මිල විමසුම - 2010 ඔක්තෝබර්, සී.පී. හතුරුසිංහ

v ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිත ගොවිපොළ මස් සහ බිත්තර අලෙවිකරණය - 2010 ඔක්තෝබර්

පුහුණු වැඩසටහන් - සම්පත් දායකයන් ලෙස සහභාගී වීම.

2010 වර්ෂයේ දී පවත්වන ලද අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ පුහුණු වැඩසටහන්

කාලය	ස්ථානය	සහභාගී වූවන්	සහභාගී වූ සංඛ්‍යාව
මාර්තු 20-22	මහවැලි සංවර්ධන මධ්‍යස්ථානය - ගිරාදුරුකෝට්ටේ	මහවැලි "බී" කලාපයේ කෘෂි ව්‍යාප්ති සේවා කාර්ය මණ්ඩලය	38
නොවැම්බර් 8-12	දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානය - ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කෘෂි ව්‍යාප්ති සේවා කාර්ය මණ්ඩලය	42
නොවැම්බර් 21-25	දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානය - අම්පාර	අම්පාර දිස්ත්‍රික්කයේ කෘෂි ව්‍යාප්ති සේවා කාර්ය මණ්ඩලය	33
නොවැම්බර් 28 දෙසැම්බර් 02	දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානය - මඩකලපුව	මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂි ව්‍යාප්ති සේවා කාර්ය මණ්ඩලය	38

ඉහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා පහත නම් සඳහන් පර්යේෂණ කාර්ය මණ්ඩලය සම්පත් දායකයන් ලෙස සහභාගී වූහ.

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා - අධි පර්යේෂක
ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - පර්යේෂණ නිලධාරී
එන්.පී.ජී. සමන්ත මහතා - පර්යේෂණ නිලධාරී
ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා - පර්යේෂණ නිලධාරී

අනෙකුත් ක්‍රියාකාරකම්

සී.පී. හතුරුසිංහ මහත්මිය

i රජයේ ආහාර ආවේක්ෂණය පිළිබඳව කැබිනට් මණ්ඩලය අනුමත කළ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකාවක ලෙස සහභාගී වීම.

ii වෙළෙඳ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකාවක ලෙස සහභාගී වීම.

iii සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව සහ මාසික ආහාර තොරතුරු විවරණිකාව සංස්කරණය කිරීම.

iv අදහස් හා යෝජනාවලින් සංයුක්ත/සමන්විත අනෙකුත් ක්ෂේත්‍ර බෝග අංශය පිළිබඳ අවසන් විමර්ශන කෙටුම්පත සැකසීම.

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා

i 2010 ඔක්තෝබර් 12-15 යන දිනයන් හි උගන්ඩාවේ කම්පාලා හි උගන්ඩා ජාතික සංඛ්‍යා මණ්ඩලය, ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ලෝක බැංකුව සහ සංඛ්‍යා දත්ත පිළිබඳ ජාත්‍යන්තර ආයතනයේ සංවිධානයෙන් පැවති "කෘෂිකාර්මික සංඛ්‍යා දත්ත (ICAS - 5) ජාතික සංඛ්‍යා දත්ත, පද්ධතිය කෘෂිකර්මයට ඒකාබද්ධ කිරීමේ පස්වැනි ජාත්‍යන්තර සමුළුව පිළිබඳ සම්මන්ත්‍රණය" සඳහා කෘෂිකාර්මික දත්ත දියුණු කිරීමට නව ආයතනික ප්‍රවේශයක භාවිතය පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

ii 2010 ඔක්තෝබර් 14 වැනි දින සබරගමු විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය දයානන්ද සෝමසුන්දර ගෞරවාභිනන්දනය වෙනුවෙන් ප්‍රකාශිත ග්‍රන්ථයට ටී.ඒ. ධර්මරත්න මහතා විසින් "මකරාගේ ආශ්චර්යය: නව සහශ්‍රයක කාලපරිච්ඡේදයේ දී චීන ආර්ථිකයේ නව ආර්ථික ප්‍රතිසංස්කරණ සහ මෑතකාලීන ආර්ථික සංවර්ධන ප්‍රවණතා" යන මැයෙන් ලිපියක් සම්පාදනය කිරීම.

iii 2010 වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් විවිධ පශ්චාත් උපාධි වැඩසටහන් (මූල්‍ය ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති, සංවර්ධන ආර්ථික විද්‍යා සහ ආර්ථික සංවර්ධන ඩිප්ලෝමා) සඳහා "කෘෂිකර්මාන්තයේ භූමිකාව", "ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය", "දේශීය කෘෂිකර්මාන්තයේ මූල්‍ය ගැටළු", "සැපයුම්දාම කළමනාකරණය" සහ "ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන්" යන මැයෙන් දේශන මාලාවක් පැවැත්වීම.

iv 2010 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ආර්ථික වද්‍යා විශේෂ උපාධි අපේක්ෂකයන් සඳහා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස "චීන ආර්ථිකයේ සංවර්ධනය සහ ව්‍යාපෘති කළමනාකරණය" යන මැයෙන් දේශන මාලාවක් පවත්වනු ලැබීම.

v 2010 වසරෙ හෝමාගම පිහිටි මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ රැස්වීම් සඳහා භාරකාර මණ්ඩල සාමාජිකයෙකු ලෙස අඛණ්ඩව සහභාගී වීම.

vi 2010 දෙසැම්බර් මාසයේ දී මුදල් හා සැලසුම් අමාත්‍යාංශය සඳහා 2010/11 මහ කන්නයේ වී නිෂ්පාදන අංශය සඳහා බෝග තත්ත්වය පිළිබඳ විශේෂ වාර්තාවක් සැකසීම.

vii කොළඹ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයන් විසින් සකසන ලද උපාධි නිබන්ධන සහ පශ්චාත් උපාධි නිබන්ධන සඳහා පර්යේෂණ අධීක්ෂකයෙකු මෙන් ම පරීක්ෂකයෙකු ලෙස සේවා සැපයීම.

viii 2010 පෙබරවාරි මාසයේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 38 වැනි සැමරුම වෙනුවෙන් ප්‍රකාශයට පත් "ගොවි ජනතා" සඟරාව සඳහා "ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වෙළෙඳපොළවල දත්ත සහ තොරතුරු, ප්‍රතිපත්ති සම්පාදකයන්ට, වෙළෙන්දන්ට සහ ගොවි ප්‍රජාවට ලබාදෙමින් අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ දායකත්වය" මැයෙන් ලිපියක් සම්පාදනය කිරීම.

ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා

i එක්සත් ජනපදයේ නිව් ජර්සි රුට්ජර්ස් රාජ්‍ය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් පැමිණි ශිෂ්‍ය නියෝජිතයන්ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා සහ ව්‍යාපාරික කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත "ශ්‍රී ලංකාවේ ධාන්‍ය මිල හැසිරීම" පිළිබඳ දේශනයක් 2010 අගෝස්තු 20 වැනි දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්වීම.

මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය

මෙම අංශය මගින් ප්‍රධාන වශයෙන් කෙටිකාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ, ශාස්ත්‍රීය සංවාද මණ්ඩප, පර්යේෂණ මූලික කොට ගත් අධ්‍යයන කව පවත්වනු ලබයි. මෙම සම්මන්ත්‍රණ බොහොමයක් සඳහා සම්පත් දායකයන්ගේ සේවය ආයතනයෙන් සපුරා ගන්නා අතර විශේෂිත අවශ්‍යතාවයන් අනුව විශ්වවිද්‍යාල රජයේ සහ රාජ්‍ය නොවන ආයතනවල සම්පත් දායකයින්ගේ සේවය ලබා ගනී. ඊට අමතරව මෙම අංශය මගින් පර්යේෂණ අධ්‍යයනයන් ද සිදු කරනු ලබයි.

අවසන් කළ පුහුණු වැඩසටහන්

1. **ග්‍රාම /ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා සහභාගීත්ව ශිල්පීය ක්‍රම (කඩිනම් ගැමි විමසුම, සහභාගීත්ව ගැමි විමසුම සහ ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය) පිළිබඳ පුහුණු වැඩසටහන් (ගම නැගුමට සිනට සවිය)**

පුහුණු කණ්ඩායම	:	එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	සම සම්බන්ධීකාරක
		ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	අංශ ප්‍රධාන
		එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
		ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	සහාය අධි පර්යේෂක
		එස්. ඇපාසිංහ මහතා	-	පර්යේෂණ නිලධාරී
		පී.සී.ජේ. ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරී
		එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

2010 වසරේ දෙවන අර්ධයේ දී, අංශය මගින් වැඩසටහන් හතරක් (04) පැවැත්වීය. ග්‍රාමීය සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් හි සෘජුව නියුක්තව සිටින නිලධාරීන් අතර සාකච්ඡා කිරීම හා අවබෝධය ජනිත කිරීමට මෙම වැඩසටහන් සකසා තිබුණි. ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම දියුණු කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. අනෙක් අරමුණ සහභාගීත්ව සැලසුම් කිරීම හා කළමනාකරණ සංකල්පය සහ විධි ක්‍රමයන් භාවිතය පිළිබඳ සහභාගීවන්නන්ගේ දැනුම වැඩිදියුණු කිරීමයි.

මධ්‍යම පළාතේ ''හදබිම'' අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා 2010 ජුලි 09-12 දක්වා පළමු සිව්දින වැඩසටහන පවත්වන ලදී. ග්‍රාමීය සහ ප්‍රජා සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් හි නියුක්ත ''හදබිම'' අධිකාරියේ සහභාගීවන්නන් මෙම වැඩසටහන සඳහා ඇදා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට තිබුණි. මෙම පුහුණු වැඩසටහනෙන් පසුව තෝරා ගත් ගම්මානයක් ''හදබිම'' අධිකාරියේ ක්‍රියාකාරී වැඩසටහනට ඇතුළත් කර ගැණුනි.

2011 වර්ෂයේ මොණරාගල දිස්ත්‍රික්කයේ පැවති ''දැයට කිරුළ'' වැඩසටහන යටතේ පර්යේෂණ අත්දැකීම් පදනම් කොට ගනිමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ගොවි ගම්මාන සංවර්ධන ආදර්ශනයක් සංවර්ධනය කොට දියත් කිරීමට තීරණය කළේ ය.

මොණරාගල අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්) ගේ උපදේශකත්වය සමග ''දැයට කිරුළ'' වැඩසටහන යටතේ හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ගම්මාන හයක් (06) තිරසර ගොවි ගම්මාන ලෙස හඳුනා ගැණුනි.

තෝරා ගන්නා ලද ගම්මාන

i මොණරාගල මැතිවරණ කොට්ඨාසයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මදුරුකැටිය හා කුඹුක්කන

ii වැල්ලවාය මැතිවරණ කොට්ඨාසයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුහුල්කොටුව, යටිඇල්ලතොට සහ

iii බිබිල මැතිවරණ කොට්ඨාසයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අමුණෙකඳුර, රත්නදෙණිය

මෙම ගම්මාන හයට (06) අයත් ග්‍රාමීය සහ ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් හි සෘජුව නියුක්ත රාජ්‍ය අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මෙම වැඩසටහන පැවැත්විණි. වැඩසටහනට නිලධාරීහු 45 දෙනෙක් සහභාගී වූහ. ඔවුහු ග්‍රාම නිලධාරීන්, කෘෂි උපදේශකයන්, කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය සභා සාමාජිකයින් සහ අනෙකුත් අදාළ නිලධාරීහු වෙති. මෙම වැඩසටහන යටතේ ක්‍රියාකාරී ප්‍රජා සැලසුම් 06 ක් සකසන ලදී. මෙම ක්‍රියාකාරී ප්‍රජා

සැලසුම්වලට අනුව බුත්තල පවත්වන "දැයට කිරුළ" වැඩසටහනට පූර්වගාමීව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ අනෙකුත් අදාළ රජයේ සංවිධාන මෙම ක්‍රියාකාරකම් දියත් කිරීම භාර ගැනීමට එකගත්වය පළ කළේ ය. මෙම පුහුණු වැඩසටහන් 2010 සැප්තැම්බර් 14 සිට 18 දක්වා පැවැත්විණි.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් මත තෙවැනි වැඩසටහන මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලදී. මෙහි දී ක්ෂේත්‍ර නිලධාරීන් හතළිහක් (40) පුහුණු කරනු ලැබී ය. ක්ෂේත්‍ර අභ්‍යාසයන් සඳහා වැලිගම මැතිවරණ කොට්ඨාසයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ගම්මාන හතරක් (04) තෝරා ගැණුනි. අමාත්‍යතුමා සහ අදාළ නිලධාරීන් වෙත ක්‍රියාකාරී ප්‍රජා සැලසුම් හතරක් දියත් කිරීම / ක්‍රියාවට නැංවීම සඳහා ඉදිරිපත් කරන ලදී. 2010 නොවැම්බර් 22 සිට 27 දින දක්වා මෙම වැඩසටහන පැවැත්විණි.

සිව්වැනි වැඩසටහන සබරගමුව පළාත් සභාවේ ඉල්ලීම මත පැවැත්විණි. පශු සම්පත් සහ කෘෂි අංශයේ අභිනවයෙන් තේරී පත් වූ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම වශයෙන් මෙම වැඩසටහන විශේෂයෙන් සැලසුම් කොට තිබුණි. 2010 දෙසැම්බර් 06 දින සිට 09 වැනි දින දක්වා මෙම වැඩසටහන පවත්වන ලදී.

2. අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ පුහුණු වැඩසටහන

පුහුණු කණ්ඩායම	ආචාර්ය එල්.පී. රූපසේන මහතා	සම්බන්ධීකාරක
	ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා	අධි පර්යේෂක
	ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	පර්යේෂණ නිලධාරී
	ඊ.ඒ.සී. ප්‍රියංකර මහතා	පර්යේෂණ නිලධාරී
	එන්.පී.ජී. සමන්ත මහතා	පර්යේෂණ නිලධාරී
	ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	පර්යේෂණ නිලධාරී
	එන්.එස්.ඩබ්. නවරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

කුමක්, කවදා වගා කරන්නේද? අලෙවි කරනු ලබන්නේ කෙසේද? අලෙවි කරන්නේ කවදා කුමන මිලක් යටතේ ද යන්න පිළිබඳව ගොවීන්ට උපදෙස් දීම සඳහා අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ කෘෂි ව්‍යාප්ති නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම පිණිස මෙම වැඩසටහන සැලසුම් කරන ලදී.

අරමුණු

i අලෙවිකරණ ව්‍යාප්ති සංකල්පය පිළිබඳ සහභාගිවන්නන්ගේ දැනුම වර්ධනය කිරීම.

ii වෙළෙඳ භාණ්ඩ සම්පාදකයන්ගේ සංවිධානාත්මකව හා මෙහෙයුම් අවබෝධ කරගැනීම.

iii 21 වන ශතවර්ෂයේ කෘෂිකර්මාන්තයෙ හි ව්‍යාප්ති නිලධාරියෙකුගේ භූමිකාව අවබෝධ කරගැනීම.

iv ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

ප්‍රාදේශීය/ග්‍රාමීය මට්ටමේ රාජකාරියෙහි නියුතු කෘෂි ව්‍යාප්ති නිලධාරීන් සඳහා මෙම පුහුණු වැඩසටහන සැලසුම් කරන ලදී. ගිරාදුරුකෝට්ටේ, අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශයන්හි මෙම වැඩසටහන දියත් කිරීමට කටයුතු කෙරිණි.

මෙම වැඩසටහනෙ හි නිමැවුම වූයේ අදාළ දිස්ත්‍රික්කයන්ගෙන් පුහුණු කිරීමේ නිලධාරීන් 160 දෙනෙකු බිහිවීමයි.

3. **සමාජ සජීවීකරණ සහ සහභාගිත්ව සංවර්ධන පුහුණු වැඩසටහන**

පුහුණු කණ්ඩායම	:	එන්.එස්.බී. ඇපාකන්ද මහතා	- සම සම්බන්ධීකාරක
		ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	- අංශ ප්‍රධාන
		එස්.එම්.ඒ. සමරකෝන් මහතා	- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
		ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	- සහාය අධි පර්යේෂක
		එස්. ඇපාසිංහ මහතා	- පර්යේෂණ නිලධාරී
		පී.සී.ජේ. ද සිල්වා මහතා	- පර්යේෂණ නිලධාරී
		එන්.එස්.ඩබ්. නවරත්න මහතා	- ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශයේ ඉල්ලීම මත මෙම වැඩසටහන දෙසැම්බර් මස 21 සිට 24 දින දක්වා පවත්වන ලදී. ''වයඹ ගැමි සවිය'' වැඩසටහනට සෘජුව සම්බන්ධ අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා මෙම වැඩසටහන පැවැත්විණි. ඉහත සඳහන් කළ ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීහු උත්ප්‍රේරක මට්ටමේ භූමිකාවක් රඟ දැක්වූහ. සහභාගී වූවන්, ග්‍රාම නිලධාරීන්ගෙන් සහ පරිවාස ළමාරක්ෂක නිලධාරීන්ගෙන් සමන්විත විය. උතුරු මැද පළාතේ ගැමි සවිය වැඩසටහන් යටතේ මෙම වැඩසටහනෙහි නිමැවුම/අවසාන ඵලය වූයේ සමාජ අභිප්‍රේරණ පුහුණුවූවන් හැට (60) දෙනෙකි.

4. **ගොවි සංවිධාන සවිබල ගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන**

පුහුණු කණ්ඩායම	:	එන්.එස්.බී. ඇපාකන්ද මහතා	- සම සම්බන්ධීකාරක
		ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	- අංශ ප්‍රධාන
		එස්.එම්.ඒ. සමරකෝන් මහතා	- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

පුත්තලම දිස්ත්‍රික්කයේ දිසා ලේකම්තුමාගේ ඉල්ලීම මත තබ්බෝව සහ ඉඟිනිමිටිය ප්‍රධාන වාරි යෝජනා ක්‍රමයන් හි ගොවි නායකයන් සඳහා මෙම වැඩසටහන පැවැත්විය. මෙම වැඩසටහන සැලසුම් කරන ලද්දේ ගොවි සංවිධානයන් ශක්තිමත් කිරීමට ය. 2010 ඔක්තෝබර් මස 26 සිට 29 දින දක්වා පැවති මෙම රැස්වීමට ගොවි නායකයන් සිය දෙනෙකු (100) පමණ සහභාගී විය.

5. **සුදුසු කෘෂි තාක්ෂණයක් (සොබා දහමේ ගොවිතැන පිළිබඳ තාක්ෂණික ක්‍රමෝපායයන්) භාවිතය සඳහා ගොවි නායකයන් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන**

පුහුණු කණ්ඩායම	:	ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	- සම සම්බන්ධීකාරක
		එන්.එස්.බී. ඇපාකන්ද මහතා	- අංශ ප්‍රධාන
		එස්.එම්.ඒ. සමරකෝන් මහතා	- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
		එන්.එස්.ඩබ්. නවරත්න මහතා	- ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී
		තිලක් කන්දේගම මහතා	- සභාපති, ජාතික ගොවි සම්මේලනය

සංවර්ධිත හා තිරසර කෘෂිකර්මය සඳහා කණ්ඩායමක් ලෙස කාලයට සහ වාරයට (කලට, කන්නයට සහ කයියට) වගා කිරීම පිළිබඳ ගොවි නායකයන්ට නැවත සිතීමට මෙම වැඩසටහන සැලසුම් කොට තිබුණි. විවිධ සංවිධානයන් සහ ගොවි සංවිධානයන්ගෙන් මෙම වැඩසටහන සඳහා ඉහළ ප්‍රතිචාරයක් ලැබිණි.

මෙහි දී 2010 ජූලි 30 දින සිට දෙසැම්බර් 30 වැනි දින දක්වා හම්බන්තොට, ගාල්ල, මාතර සහ මොණරාගල දිස්ත්‍රික්කයන් හි වැඩසටහන් 32 ක් පවත්වනු ලැබුණි. මූල්‍ය සහයෝගය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. මෙහි දී ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරකම් හි නියුතු ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සහ ගොවි නායකයන් තුන් දහසකට (3000) අධික පිරිසක් සම්පූර්ණයෙන් පුරුදු කෙරිණි.

අවසන් කළ අධ්‍යයන

1. කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා හවුල් ජාලය

පී.සී.ජේ. ද සිල්වා - පරයේෂක

මෙම අධ්‍යයනය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම මත භාරගන්නා ලදී. මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශයට වඩාත් හොඳින් සහ කාර්යක්ෂමව රාජකාරී ඉටු කරමින් හවුල්කාරත්වය ගොඩනගන පාර්ශවකරුවන් හඳුනා ගැනීමට උවමනා විය. තවදුරටත් ඔවුන් අමාත්‍යාංශය සමග පැවති හවුල්කාරත්වයේ ස්වභාවය පිළිබඳව පාර්ශවකරුවන්ගේ ආකල්පයන් පරීක්ෂා කිරීමටත් ඒ පිළිබඳව සොයා බලා වැඩිදියුණු කිරීමටත් අපේක්ෂා කරන ලදී. රටේ කෘෂි අංශයට සැලකිය යුතු ලෙස අදාළ වන පිරිස සහ තනි පුද්ගල ස්වභාවයන් වැඩි දියුණු කිරීම හවුල්කාරත්වය ජාලයේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාව විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂ ජාලයන්ගේ සිටින පාර්ශවකරුවන්ගේ පරතරය ඉහළ විවිධත්වයක් දක්වයි.

අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධානයන්, පෞද්ගලික සමාගම් සහ මාධ්‍ය ආයතනයන්ට අයත් රාජකාරී වඩාත් හොඳින් ක්‍රියාවට නැගීම සඳහා ජාලයක් හඳුනා ගැනීම හා සුදානම් කිරීමයි.

විශේෂ අරමුණු

i කෘෂිකර්ම අමාත්‍යාංශය සහ දැනට හඳුනාගෙන ඇති හවුල්කාරත්වයේ ස්වභාවය පෙන්නුම් කිරීමට ජාලා රූප සටහනක් සැකසීම.

ii කෘෂිකර්ම අමාත්‍යාංශය සහ හඳුනාගත් ස්වභාවයන් අතර, හවුල්කාරත්වයේ ජාලයට ඇති සබැඳියාවේ ස්වභාවය සොයා ගැනීම.

iii ඉහත සඳහන් ස්වභාවයන් සමග වඩා හොඳ සහ වැඩි දියුණු කළ ස්වභාවයන් සඳහා අදහස් ලබාදීම.

සොයා ගැනීම්

i හඳුනාගත් හවුල්කාර පිරිසෙන් බහුතරය කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වේ. ඔවුන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වත්මන් හවුල්කාරත්වයේ ස්වභාවය සමග සෙසු පිරිස තෘප්තිමත් නොවේ.

ii අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය යටතේ ඇති සමහර ආයතනයන් හා කාර්යභාරය සම්බන්ධයෙන් අධීක්ෂණය, ඇගයීම හා පිළිගැනීම පිළිබඳව පවතින අඩුපාඩුකම් දක්නට ලැබේ.

iii සමහර කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශයට අයත් ආයතනයන්ගේ වැඩ කිරීම සතුටුදායක මට්ටමක නො පවතින බව අමාත්‍යාංශයට වාර්තා විය. එසේ වුවත්, මුල්‍ය හා අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතා දෙන විටෙක, අමාත්‍යාංශයට අයත් ආයතනයන්ට ලබා දී ඇති රාජකාරීමය නියමයන්/වගකීම් පිළිබඳව අමාත්‍යාංශය විසින් සොයා නො බලන බවක් පෙනී යයි.

iv අමාත්‍යාංශයේ අඛලන් වූ පරිගණක අලුත්වැඩියාව සඳහා අමාත්‍යාංශයේ පරිගණක ඒකකය වැඩ පොළක මට්ටමකට පත්ව ඇත. එමගින් සෙසු පිරිස සමග ගොඩනැගීමේ හෝ නඩත්තු සබඳතාවයක් වෙත දායකත්වයක් නොමැත.

v අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් සමග පවා සමීප සබඳතාවයක් ඇති දත්ත පදනමක් පවත්වාගෙන යාමක් නො පවතී.

vi පෞද්ගලික මාධ්‍ය සුබවාදී නැඹුරුවකින් වෙනස් විය යුතු ය යන්න අමාත්‍යාංශයේ ආකල්පය යි.

vii රටේ කෘෂි අංශය නියුක්ත කිනම් කාර්යයක ද, ඔවුන්ගේ අවශ්‍යතාවය මත ඔවුන් විමසන සහයෝගය ලබාදීම වැනි රාජ්‍ය නොවන අංශය සමග කටයුතු කිරීම පිළිබඳ සොයා බැලීමක් නැත.

viii රටේ කෘෂි අංශය සමග සමීපව කටයුතු කරන අනෙකුත් රජයේ ආයතන සමග සහයෝගයෙන් වැඩ කිරීමේ වාසිය, වසර ගණනාවක පටන් අමාත්‍යාංශය මගින් ප්‍රයෝජනයට නො ගනී.

ix අමාත්‍යාශය මගින් පවරන ලද අනෙක් පිරිසගේ රාජකාරී ඉටු කිරීම සමග සමස්තයක් ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය මේ දක්වා සහයෝගයෙන් කටයුතු නො කරන බව සොයා ගැනුණි.

x අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අමාත්‍යාංශය මගින් ප්‍රමාණවත් සහ සමාන අවස්ථාවන් ලබා නො දෙයි.

xi රටේ කෘෂිකර්මයේ වැඩි දියුණුව සඳහා බැංකු ක්ෂේත්‍රයේ වාසිසහගතබව අමාත්‍යාංශය විසින් සුදුසු පරිදි ලබාගෙන නොමැත.

xii විශ්වවිද්‍යාලයන් හි කෘෂි පීඨයන්ගේ හැකියාවන් ප්‍රයෝජනයට ගැනීමට අමාත්‍යාංශය මගින් ප්‍රමාණවත් ආයාසයක් දරා නැත.

යෝජනා

i සම්ප සබඳතාවයන් ගොඩනැගීම ආරම්භ කිරීම සඳහා හවුල්කාර පිරිස් වර්ගීකරණයට කෘෂිකර්ම අමාත්‍යාංශය තීරණය කළ යුතු ව ඇත.

ii කෘෂිකර්ම අමාත්‍යාංශය ඉහත හවුල්කරුවන්ගේ දත්ත පදනමක් සකසා නිතිපතා එය යාවත්කාලීන කළ යුතුව ඇත.

iii අනවශ්‍ය අනවබෝධයන් මගහැරීමට හෝ අර්බුදයන් විසඳීමට ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට, ඔවුන්ගේ උදව් සහ සහයෝගය ලබා ගැනීමට අවශ්‍ය විට හවුල්කරුවන් සමග අමාත්‍යාංශය විසින් සබඳතා ඇති කොට ගත යුතු ය.

iv හැකි හැම විටකම අදාළ හවුල්කරුවන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය මගින් නිර්ව්‍යාජ ආයාසයන් දැරිය යුතු ය.

v අමාත්‍යාංශය සමග සන්නිවේදනය පහසුවෙන් කරගෙන යාමට හවුල්කරුවන්ට අවකාශ සලසා දිය යුතු ය.

vi ඉහත කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා තොරතුරු පිළිබඳ දැනුමැති නිලධාරියෙකු සමග ක්ෂණික දුරකථනයක් ක්‍රියාවෙහි යෙදවිය යුතු ය.

vii අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණික ඒකකය, ඊට නියමිත/සුදුසු ක්‍රියාවෙහි යෙදවීමෙන් හවුල්කාරත්ව සබඳතා ජාලයක් නඩත්තු කිරීමේ හැකියාව වර්ධනය කළ යුතුය.

viii හඳුනාගත් සියළු හවුල්කරුවන් සමග සහයෝගීතාවය සහ සාමූහිකත්වය ශක්තිමත් කිරීමට වාර්ෂික සහ අර්ධ වාර්ෂික රැස්වීම් පැවැත්විය යුතු ය.

ix හවුල්කාරත්ව ජාලයේ උපරිම වාසිය ලබා ගැනීමට වැඩිදියුණු නූතන එදිනෙදා තාක්ෂණය භාවිතයට ගත යුතුය.

x. නොමිලයේ මාර්ගගත සන්නිවේදන ක්‍රම භාවිතය ශක්තිමත් කළ යුතු අතර අදාළ නිලධාරීන් විසින් වියදම් අඩු මාර්ගගත සාකච්ඡා වෙත අදාළ හවුල්කරුවන් යොමු කළ යුතු ය.

xi අමාත්‍යාංශයට අයත් ආයතනයන් අතර බාධක නොමැති පහසු සන්නිවේදනයක් සංවර්ධනය කළ යුතු ය.

xii අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් ආයතනයන් සමග වඩා ශක්තිමත් සහයෝගීතාවයක් සහ එකට බැඳීමක් ස්ථාපනය කළ යුතුය (මේ සඳහා දැනට පවතින පරතරය අඩු කිරීම සඳහා ප්‍රධාන උපකාරකය වන්නේ ජාලයයි).

xiii ජාලයට අයත් සෙසු හවුල්කරුවන් සමග කටයුතු කිරීම දිරිමත් කළ යුතු අතර ආයතනයන්ට අවශ්‍ය පසුබිම සැකසිය යුතුය.

xiv කෘෂිකර්ම අමාත්‍යාංශයට සම්බන්ධ ආයතනයන්ගේ දුක් ගැනවිලි (ඉහත සඳහන්) වලට ප්‍රමාණවත් ඇහුම්කන්දීමක් සිදු කළ යුතු ය.

xv පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයන් සහ ඔවුන් මුහුණ දෙන ගැටළු විසඳීමට ප්‍රමාණවත් පියවර ගැනීම සහ සුදානම් කිරීම සමග ප්‍රමාණවත් අවධානය යොමු කිරීම මෙන් ම සන්නිවේදනයක් පවත්වා ගත යුතුය.

xvi පෞද්ගලික මාධ්‍ය දිනා ගැනීම සඳහා සුහදත්වයේ සහ පිළිගැනීමේ ආකල්පයන් වැඩිදියුණු කිරීම, සුහදත්වය/ මිත්‍රශීලීත්වය වර්ධනය කරමින් ඔවුන්ගේ ආකල්ප ඔස්සේ මෙය සිදු කළ යුතුය.

xvii ක්ෂේත්‍රයේ කටයුතු කරන කෘෂි රසායන සමාගම් රාජ්‍ය නොවන සංවිධානයන් අධීක්ෂණය හා නියාමනය කළ යුතුය. මෙය සාක්ෂාත් කොට ගත හැක්කේ ඔවුන් මෙම ජාලයට සම්බන්ධ කොට ගැනීමෙනි. කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් අදාළ ආයතනයන් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රවේශම් විය යුතුය.

xviii කෘෂිකර්ම අමාත්‍යාංශය සමග විශ්වවිද්‍යාල සහ ඔවුන්ගේ හවුල්කාරීත්වය ශක්තිමත් කිරීම මගින් ඔවුන්ගේ සහයෝගීතාවය ඔස්සේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් දිරිමත් කළ යුතුය.

xix කෘෂි ක්‍රියාකාරකම් හි පහසුවෙන් නියුක්තවීමට බැංකු ක්ෂේත්‍රය දිරිමත් කිරීම හා පහසුකම් සැලසිය යුතුය.

2. **මොණරාගල දිස්ත්‍රික්කයේ 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය යටතේ තිරසර කෘෂි ගම්මාන හයක් (06) සංවර්ධනය කිරීමේ ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩසටහන**

පුහුණු කණ්ඩායම :	ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	සම්බන්ධීකාරක
	එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	පර්යේෂණ නිලධාරී
	එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
	එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

දැයට කිරුළ සංවර්ධන වැඩසටහනෙහි කොටසක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කය මූලික කොටගෙන මෙම ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි.

වැඩසටහන් සඳහා ගම්මාන හයක් (06) තෝරා ගැණුනි.

	ජන්ද කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ගම්මානය
i	මොණරාගල	මොණරාගල	1. මදුරුකැටිය
			2. කුඹුක්කන
ii	වැල්ලවාය	බුත්තල	1. පුහුල්කොටුව
			2. යටිඇල්ලතොට
iii	බිබිල	මැදගම	1. රත්තනදෙනිය
			2. අමුණෙකඳුර

මොණරාගල, සැලසුම් අධ්‍යක්ෂ විසින් මෙම ගම්මාන හය (06) තෝරාගන්නා ලදී.

ප්‍රථමයෙන්, මෙම ගම්මානයන් හි නිලධාරීන් සඳහා "සහභාගීත්ව ගැමි විමසුම" පුහුණුව ලබා දෙන ලදී. මෙම ගම්මාන සංවර්ධනය සඳහා අදාළ වැඩසටහන තුළ ගැටළු සහ විසඳුම් හඳුනා ගන්නා ලදී.

පුහුණුවේ දී මතු වූ සියළු ගැටළු, විසඳුම් සහ ව්‍යාපෘති යෝජනාවෙන් පසු වාර්තාව සකසන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ප්‍රගති සමාලෝචන රැස්වීමට වාර්තා ඉදිරිපත් කෙරුණි. ඉන් අනතුරුව, එම ව්‍යාපෘති ක්‍රියාකාරකම් අදාළ දෙපාර්තමේන්තු සහ සංවිධානයන්ට භාර දෙන ලදී. වැඩසටහනට අදාළ ඉහත සංවිධානයන් හි ක්‍රියාකාරකම් සුපරීක්ෂණය කිරීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වගකීම දරයි.

අනෙකුත් ක්‍රියාකාරකම්

1. **සංවර්ධන කතිකාවත (සංවර්ධනය සඳහා සාකච්ඡා කිරීම) ප්‍රසිද්ධ දේශන මාලාව**

පුහුණු කණ්ඩායම :	ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	සම්බන්ධීකාරක
	තිලක් කන්දේගම මහතා	-	සභාපති, ජාතික ගොවි සම්මේලනය
	මංගල තිස්ස මහතා	-	අගමැතිතුමාගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
	අයි.ආර්. පෙරේරා මහතා	-	කණ්ඩායම් නායක, ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය

මෙය මානව සම්පත් සහ ආයතනික අංශය මඟින් ආරම්භ කරන ලද ප්‍රසිද්ධ දේශනයක් හා සාකච්ඡා අන්තර්ගත නවතම වැඩසටහනකි. සැසිවාරයන් හි දී, කාලීනව වැදගත් ගැටළු, සාකච්ඡාවට බඳුන් කෙරේ. මිනිසුන් නිවැරදි සහ තිරසර අයුරින් ගොවිතැන් කරන්නේ කෙසේද යන්න කියැවෙන "සොබාදහමේ ගොවිතැන" මෙහි ප්‍රථම වැඩසටහන විය. විශේෂයෙන් ම, කලට, කන්නට සහ කයියට වගා කොට සාර්ථක අස්වැන්නක් ලබාගැනීම මෙමඟින් කියැ වේ.

"සීඝ්‍ර සංවර්ධනයක් සඳහා ධනාත්මකව සිතීම" දෙ වැන්නයි. විශේෂයෙන් ම, අන්තර්පුද්ගල සබඳතාව මෙමඟින් සාකච්ඡා කෙරිණි. තෙ වැනි කාරණය කාලීන සහ ඉතා වැදගත් මාතෘකාවක් විය. "අලි-මිනිස් අර්බුදය සඳහා සරල විසඳුමක් මැයෙන්" මෙම වැඩසටහන යටතේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම මට්ටමේ නිලධාරීන් 150 කට වඩා වැඩි පිරිසක් පුහුණු කරවන ලදී.

සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාතික තොරතුරු මධ්‍යස්ථානය (NACIAD) වශයෙන් සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය ක්‍රියාත්මක වේ. එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන (USAID) හි සහයෝගයෙන් 1979 වසරේ දී හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂිකර්ම කළමනාකරණ තොරතුරු ජාලයක් ස්ථාපනය කිරීමෙන් ජාතික සංවර්ධනයට දායකවීම ඉලක්ක කොටගෙන මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. මෙම මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් භාවිතා කරන පිරිස වන්නේ පර්යේෂකයන්, සැලසුම්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවීන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පිරිස් ය. මෙම ඒකකයෙ හි ප්‍රධාන කාර්යභාරය වන්නේ ආයතනයේ පර්යේෂණ අධ්‍යයනයන්ට සම්බන්ධ දත්ත විශ්ලේෂණය කිරීම යි.

දත්ත බැංකුව

කෘෂි අංශයේ සංවර්ධනයට සමාජ විද්‍යා පර්යේෂණ සැලසුම් හා ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය පහසුකම්වලින් දත්ත බැංකුව සමන්විත වේ. පර්යේෂකයන් තමන්ගේ ම අධ්‍යයනයන් ඔස්සේ විවිධ මූලාශ්‍රයන් තුළින් උත්පාදනය කරගන්නා දත්ත සමාජ විද්‍යා දිශානතියකට යොමු කළ පර්යේෂණ පරිසරයක් තුළ මෙම දත්ත බැංකුව ස්ථානගත වී ඇත. ශ්‍රී ලංකාවේ කෘෂි තත්ත්වය හා සම්බන්ධ දත්ත එක්රැස් කිරීම හා ගබඩා කොට තබා ගැනීම දත්ත බැංකුවේ නිත්‍ය කාර්යය යි.

දත්ත බැංකුවේ ක්‍රියාකාරකම්

දත්ත බැංකුවේ ක්‍රියාකාරකම් වර්ගීකරණයන් ත්‍රිත්වයකින් එනම්, දත්ත එක්රැස් කිරීම, දත්ත නිරවද්‍යතාවය විමසා බැලීම, පද්ධති සංවර්ධනය යන කරුණු මත සිදු වේ. වසර තුළ දත්ත පරිගණක ආශ්‍රයෙන් කඩිනමින් ලබා ගැනීමේ වැඩසටහන, තවදුරටත් පහසුවෙන් ළඟා වී දත්ත ලබාදීම නවීනත්වයට පත් කරන ලදී. යාවත්කාලීන කරන ලද නවතම දත්තයන් හි නිරවද්‍යතාවය සඳහා සමස්ත දත්ත පද්ධතිය ම පරීක්ෂාවට ලක් කරන ලදී. දත්ත ලබා ගැනීමට ඇති හැකියාව පරීක්ෂාවට දත්ත නැවත උත්පාදනය කරන ලදී. ඒකකය මඟින් ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර මඟින් දත්ත එක්රැස් කෙරෙන අතර කෘෂිකාර්මික බෝගයන්, පශු සම්පත්, ජනගහනය සහ වැදගත් දත්ත පිළිබඳ දත්ත පදනම නඩත්තු කරනු ලබයි.

වසර තුළ යාවත්කාලීන කරන ලද දත්ත දර්ශක

i ආහාර බෝගයන්ගේ නිෂ්පාදන මිලෙහි සාමාන්‍ය - 2008/2009
ii වී සම්බන්ධ සංඛ්‍යා දත්ත (වපුරන ලද භූමි ප්‍රමාණයන්, අස්වැන්න ලබාගත් භූමි ප්‍රමාණයන්, නෙළාගත් අස්වැන්නෙ හි සාමාන්‍ය සහ නිෂ්පාදනය - 2009 යල සහ 09/10 මහ
iii සාම්ප්‍රදායික ක්‍රම භාවිතයෙන් වී වගා කළ භූමි ප්‍රමාණය - 2009
iv අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කළ භූමි ප්‍රමාණය සහ නිෂ්පාදනය - 2009
v ආහාර බෝගයන්ගේ සිල්ලර මිලෙහි සාමාන්‍ය - 2009
vi වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝගයන්ගේ වගා වියදම - 2009 යල සහ 2008/2009 මහ
vii වී වගාවේ දී ආදායම සහ ලැබීම්/ලාභය සම්බන්ධ තොරතුරු - 2009 මහ 2009 යල
viii ආහාර ද්‍රව්‍යයන්ගේ තොග මිලෙහි සාමාන්‍ය - 2009
xi ආහාර ද්‍රව්‍යයන්ගේ ආනයන-අපනයන ප්‍රමාණය සහ වටිනාකම 2009
x ස්ථානයන් අනුව වර්ෂාපතනයේ මාසික සාමාන්‍ය - 2008
ix ස්ථානයන් අනුව උපරිම සහ අවම උෂ්ණත්වය - 2008

වසර තුළ සංඛ්‍යාවෙන් 102,505 ක් වාර්තා එක්රැස් කොට නිරවද්‍ය කරන ලදී. පරිගණක ගත කරන ලද දත්ත පදනමට එක් රැස් කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව 98,882 කි.

2010 වසර තුළ ඒකකයෙන් සිදු කෙරෙන සමස්ත ඉල්ලීම් සංඛ්‍යාව 133 ක් විය. එම මුළු සංඛ්‍යාවට පරිබාහිරව ආයතනය තුළ භාවිතා කරන්නන්ගෙන් ඉල්ලීම් 79 ක් පැවති අතර ඉතිරි ඉල්ලීම් 57 සිදු කරනු ලැබුවේ බාහිර භාවිතා කරන්නන් විසිනි.

භාවිතා කරන අයගේ ඉල්ලීම් පහත සඳහන් වේ.

	ඉල්ලීම් සංඛ්‍යාව	(%) (බාහිර පාර්ශ්ව)
හෙ.ගො.ප.පු. ආයතන කාර්ය මණ්ඩලය	79	.
රජයේ ආයතන / දෙපාර්තමේන්තු	15	0.26
පෞද්ගලික ආයතන / සමාගම	13	0.23
විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල / ශිෂ්‍යයන්	25	0.44
තනි පුද්ගල	4	0.07

අංශය විසින් ක්‍රියාවට නගන ලද පර්යේෂණ අධ්‍යයනයන්ගේ දත්ත සැකසුම් ක්‍රියාකාරකම්

වසර තුළ දී ඒකකය විසින් පහත සඳහන් අධ්‍යයනයන්ගේ දත්ත විශ්ලේෂණයන් ක්‍රියාවට නගන ලදී.

i දේශීය සහ ආනයනික සහල් වර්ගයන් සඳහා සිදු කරන ලද සමීක්ෂණය

ii R-353 - එළවළු සහ පලතුරු සඳහා ප්ලාස්ටික් බඳුන් භාවිතය

iii R-373 ශ්‍රී ලංකාවේ පලතුරු බෝග ක්ෂේත්‍රයේ සංවර්ධනය

iv R-374 සුළු පරිමාණ අංශයේ කෘෂි ව්‍යාප්තිය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතයෙහි බලපෑම

v G-22 - ශ්‍රී ලංකාවේ බදු/කුළී ගොවිතැන් ක්‍රමයෙහි වර්තමාන තත්ත්වය

vi R-380 තෝරාගත් වාණිජ බෝගයන්ගේ ග්‍රාමීය මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳ පැවරුම

vii R-375 ග්‍රාමීය ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ වී වගා අංශයේ යාන්ත්‍රීකරණයේ බලපෑම

viii R-377 වාරි පද්ධති කළමනාකරණයේ ගොවි සහභාගීත්වය

ix R-381 ගොවිජනපද ක්‍රමයන් හි අවිධිමත් ඉඩම් කැබලිවීම

ආයතනයේ වෙබ් පිටුව

නිත්‍ය රාජකාරි කටයුත්තක් ලෙස අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයෙන් ලබාදෙන දෛනික මිල තොරතුරු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වෙබ් පිටුවට ඇතුළත් කිරීම.

අනෙකුත් ක්‍රියාකාරකම්

i පරිගණක මෘදුකාංග හා දෘඩකාංගයන් හි ගැටළු සම්බන්ධයෙන් පැමිණෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම.

ii පරිගණක හා ආශ්‍රිත උපාංග මිල දී ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර/විශේෂ හා ඇගයීම් වාර්තා සැකසීමට සම්බන්ධ වීම.

iii ටී.එන්.ආර්. ප්‍රනාන්දු මහතා, එස්.එස්.ජේ. රෝසා මහතා සහ එම්.පී. යසරත්න මහතා ක්ෂේත්‍ර දත්ත එක්රැස් කිරීම සඳහා සහභාගී වීම.

iv එම්.ඩී.එල්. සෙනරත් මහතා, ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පවත්වන ලද ජුම්ලා (Joomla) භාවිතයෙන් වෙබ් පිටු සංවර්ධනය පිළිබඳ වැඩමුළුවට සහභාගී වීම.

v හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන තොරතුරු යැවීමේ වගකිව යුතු නිලධාරියා ලෙස ටී.එන්.ආර්. ප්‍රනාන්දු මහතා පත් කිරීම.

vi සහල් පරිභෝජනය, නියැදි තේරීම, ප්‍රශ්නාවලි සැකසීම පිළිබඳ සමීක්ෂණය පැවැත්වීමට වැදගත් වන අවශ්‍ය කටයුතු දැනටමත් ඉටු කොට හමාර ය.

පුස්තකාලය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයන්ගේ මෙන්ම ආයතනයන්ගේ ප්‍රයෝජනය සඳහා කෘෂි අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ බෙදා හැරීම පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වේ. වසර තුළ, කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විමර්ශන උවමනාවන් සඳහා පොත් 1024 ක් සහ සඟරා කලාපයන් 211 ක් ලබා ගෙන තිබුණි. වසර තුළ පුස්තකාලයට පැමිණි බාහිර පුද්ගලයන්ගේ සංඛ්‍යාව 169 කි.

පොත්, සඟරා සහ වාර්තා අත්පත් කරගැනීම

වසර තුළ මිල දී ගත් පොත් 43 කින් සමන්විතව පොත් එකතුවට තවත් පොත් 281 ක් ද, බඳින ලද වෙළුම් 114 ක් සහ ප්‍රකාශන හුවමාරු වැඩසටහන යටතේ සහනදායී පදනමක් මත පොත් 124 ක් ද ලැබුණි. සහනදායී හෝ හුවමාරු පදනම මත වාර ප්‍රකාශන විශාල සංඛ්‍යාවක්, ප්‍රවෘත්ති හසුන්, වාර්ෂික වාර්තා, විදේශීය මෙන් ම දේශීය ආයතනයන්ගෙන් ලැබුණි. විදේශීය සඟරා නාමයන් (එය කලාප 125 ට ඇතුළත් වේ) සහ දේශීය සඟරා නාමයන් 10 කට ආයතනය විසින් දායකත්වය ලබා ගන්නා ලදී.

පුස්තකාල සේවා

පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර/පිටස්තර භාවිතා කරන්නන්ටත් ලිපි ලේඛන විමර්ශන, විමර්ශන සේවා, කාලීන දැනුවත් කිරීමේ සේවා සහ ඡායා පිටපත් සේවා ලෙස තොරතුරු හා ලිඛිත සේවාවන් ඉල්ලුම අනුව සපයන ලදී. නවතම පොත් සහ ප්‍රදර්ශනය කෙරෙන අලුත් පොත් සහ සඟරාවන්ගේ මාතෘකාවන් අන්තර්ගත මෑතකාලීන අත්පත් කරගැනීමේ ලැයිස්තු සංස්කරණය කරමින් දැනට පවතින දැනුවත් කිරීමේ සේවා සපයන ලදී. පුස්තකාලයේ පවතින අන්තර්ජාල පහසුකම් සමග පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාලය පදනම් කොටගත් තොරතුරු පහසුකම් ලබා ගැනීමේ හැකියාව තවදුරටත් පුළුල් කරන ලදී.

පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ පිටස්තර/බාහිර භාවිතා කරන්නන්ගේ පාවිච්චිය සඳහා විවිධ විෂයයන් පිළිබඳ පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩව දර්ශකගත කොට ඇත.

අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)

පුස්තකාලය, කෘෂිකර්ම පුස්තකාල තොරතුරු ජාලයේ (ඇග්‍රිනෙට් - AGRINET) සහ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සාමාජිකයෙකි. පුස්තකාලය එහි නාභි ලක්ෂ්‍ය මත ක්‍රියාත්මක වෙයි. ඇග්‍රිනෙට්, එස්.ඩී.සී.පී. වැඩසටහනට පුස්තකාලය අඛණ්ඩව සහභාගී වෙයි. (අන්තර්ගත පිටු දත්ත පදනමේ තෝරාගෙන ඇති බෙදා හැරීම්) සාමාජික පුස්තකාලයන් මගින් සඟරා, මාතෘකා 11 කට අදාළ අන්තර්ගත පිටු 288 ක ඡායා පිටපත් ඉල්ලුම් කළ අතර සාමාජික පුස්තකාලයන්ගෙන් සඟරා මාතෘකා 06 ක අන්තර් පිටු 55ක් ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩල ඉල්ලා ඇත.

ඇග්‍රිනෙට් විසින් පහත දත්ත පදනමේ නඩත්තුවට පුස්තකාල එකතුවෙන් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලි විමර්ශන සපයන ලදී.

i ජාතික කෘෂිකර්මය ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (NAB)

ii පාරම්පරික ඥානය මත පදනම් වූ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (කෘෂිකර්ම විමර්ශනය සමග)

අන්තර් පුස්තකාල ණය සේවාව මත සෙසු පුස්තකාලයන් විසින් පොත් දහසයක් (16) ක් ගනු ලැබීය.

ප්‍රකාශන හුවමාරු වැඩසටහන

ආයතනයේ ප්‍රකාශන තිස් තුනක් (33) (පොත්/සඟරා) පුස්තකාලයන් පහකට (05) යවන ලද අතර ප්‍රකාශන තිහක් (30) හුවමාරු වැඩසටහන යටතේ ආපසු ලැබුණි.

ප්‍රකාශන ඒකකය

ප්‍රකාශන ඒකකය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වන අතර පර්යේෂණ වාර්තා සංස්කරණය, ප්‍රකාශයට පත් කිරීම, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, අත් පත්‍රිකා සහ අනෙකුත් තොරතුරු භාෂා තුනෙන් ම ප්‍රකාශයට පත් කිරීම සිදු කරයි. මෙම ඒකකය අදාළ වසර තුළ දී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක ද නියුතු විය.

වසර තුළ දී, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් පර්යේෂණ වාර්තා හතක් නිකුත් කරන ලදී. ඒවායෙහි විස්තර පහත සඳහන් වේ.

- i ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සහ දිළිඳු බව අඩු කිරීම සඳහා ජලජීවී වගාව: විභවතා සහ බාධක පිළිබඳ තක්සේරුවක්
- ii උඩරට එළවළු නිෂ්පාදනයේ ස්වභාවික සම්පත් කළමනාකරණ පර්යාලෝකනය: ගොවීන්ගේ දැනුම, ආකල්ප සහ ප්‍රතිචාර
- iii කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ මධ්‍යකාලීන ඇගයීම
- iv ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයේ අවිධිමත් ඉඩම් භාවිතයෙහි බලපෑම
- v ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය
- vi කාබනික පොහොර භාවිතයේ ඇති විභවතාවන්
- vii ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වැව් විකාශනය

ඊට අමතරව වසර තුළ දී පහත සඳහන් වාර ප්‍රකාශනයන් නිකුත් කරන ලදී.

- i වාර්ෂික වාර්තාව - 2009 (සිංහල)
- ii වාර්ෂික වාර්තාව - 2009 (දෙමළ)
- iii Annual Report - 2009 (ඉංග්‍රීසි)
- iv Sri Lanka Journal of Agrarian Studies Vol. 13,1 (2009)
- v Sri Lanka Journal of Agrarian Studies Vol. 13.2 (2009)
- vi ගොවි ජනතා - 2010 ජනවාරි - ජූනි
- vii ගොවි ජනතා - 2010 ජූලි - සැප්තැම්බර්
- viii ගොවිකටයුතු අධ්‍යයන 2009 8 වෙළුම 1 කලාපය
- ix ගොවිකටයුතු අධ්‍යයන 2010 9 වෙළුම 1 සහ 2 කලාප

සඳහන් කරන කාලපරිච්ඡේදය තුළ ඒකකය පහත සඳහන් ප්‍රදර්ශනයන්ට සහභාගී විය.

- i ''ගොවි සතිය'' - ජාතික කෘෂිකාර්මික ප්‍රදර්ශනය, - බටඅත කෘෂිකාර්මික තාක්ෂණික උද්‍යානය - 2010 සැප්තැම්බර් 01-05
- ii ''දැයට කිරුළ'' ජාතික සංවර්ධන ප්‍රදර්ශනය, පල්ලෙකැලේ, මහනුවර - 2010 පෙබරවාරි 04 - 10

2010 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය/ස්වභාවය

	2009.12.31 දිනට තත්ත්වය	වසර තුළ දී සේවය නැවැත්වීම/ ඉල්ලා අස්වීම	පත්වීම්	2010.12.31 දිනට තත්ත්වය
අධ්‍යක්ෂ	01	01	01	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01	-	-	01
අංශ ප්‍රධාන	03	-	02	01
පර්යේෂණ කාර්ය මණ්ඩලය	28	01	-	27
පරිපාලන කාර්ය මණ්ඩලය	06	02	02	06
ජ්‍යෙෂ්ඨ පුස්තකාල කාර්ය මණ්ඩලය	02	-	-	02
දත්ත සංවර්ධන ඒකකය	01	-	-	01
පරිගණක ඒකකය	02	-	-	02
ප්‍රකාශන ඒකකය	02	02	01	01
සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	19	01	-	18
තාක්ෂණික කාර්ය මණ්ඩලය	01	01	-	-
ලිපිකාර, ලේකම් සහ සමාන්තර ශ්‍රේණි	51	03	-	48
මෙහෙයුම් සහ සමාන්තර ශ්‍රේණි	37	02	-	35
එකතුව	155	13	06	147

කාර්ය මණ්ඩල සංවර්ධනය

පශ්චාත් උපාධි/උපාධි වැඩසටහන්

පහත සඳහන් පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයනයන් හි නියුක්තව සිටිති.

පී.සී.ජේ. ද සිල්වා මහතා - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, විද්‍යා හා තාක්ෂණය පිළිබඳ හෝසොං (Huazhony) විශ්වවිද්‍යාලය (2007 සිට 2010 දක්වා)

ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා - පරිසර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, කෘෂිකර්ම පීඨය රියුකයුස් (Ryukyus) විශ්වවිද්‍යාලය, ජපානය (2008 අප්‍රේල් සිට 2011 දෙසැම්බර් දක්වා)

එම්.කේ.එන්. දමයන්ති මෙනවිය - රාජ්‍ය ප්‍රතිපත්ති සහ පාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය, උතුරු - දකුණු විශ්වවිද්‍යාලය, ඩකා, බංගලාදේශය (2009 අගෝස්තු සිට 2011 ජූලි දක්වා)

ටී.ඒ.සී. ප්‍රියංකර මහතා - ග්‍රාමීය සංවර්ධන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, 2010 - 2011 ඉන්දියාවේ හයිද්‍රාබාද් හි නර්ඩ් (NIRD) ආයතනය මගින් සංවිධානය කරන ලදී. (2010 අගෝස්තු සිට 2011 ජූලි දක්වා)

ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු/සමුළු/රැස්වීම් ආදියට සහභාගිවීම

සුසිලා ලුරදු මහත්මිය - පර්යේෂණ නිලධාරිණී, 2010 පෙබරවාරි 21 දින සිට මාර්තු 04 දින දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවති ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

එච්.එම්.ජේ.කේ. හේරත් මහතා - පර්යේෂණ නිලධාරි, 2010 මාර්තු 22 සිට 31 දින දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවති නිර්මාණාත්මක සහ හොඳම භාවිතයන් හුවමාරු කරගැනීම සඳහා ග්‍රාමීය සංවර්ධනයේ තු තොරතුරු භාවිතය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

ආර්.එම්.පී.කේ.බී. රත්නායක මහතා - සහාය අධි පර්යේෂක, 2010 අගෝස්තු 01-06 දක්වා ඉන්දියාවේ පැවති සීනි කර්මාන්තයට නිළ පිරික්සුම්කරුවෙකු ලෙස සහභාගී විය.

ආචාර්ය එල්.පී. රූපසේන මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) 2010 අගෝස්තු 23-26 දින දක්වා ඉන්දියාවේ අගර්තල හි පැවති "කෘෂි අධ්‍යාපනය සහ දැනුම කළමනාකරණය" පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගී විය.

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා - අධි පර්යේෂක, 2010 අගෝස්තු 29 දින සිට සැප්තැම්බර් 05 දක්වා කාම්බෝජයේ සියැම් රීප් හි පැවැති ආහාර සහ ප්‍රතිපත්ති වැඩමුළුවට ආරාධිතයෙකු ලෙස සහභාගී විය.

පී.පී.එස්.පී. නානායක්කාර මෙනවිය. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිණී, 2010 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 08 දක්වා ඉන්දියාවේ හයිද්‍රබාද් හි පැවති " ප්‍රතිපත්ති මූලික කළමනාකරණ ක්‍රියාකාරකම් දර්ශක අධීක්ෂණය සහ අගැයීම්" පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී විය.

එස්. ඇපාසිංහ මහතා - පර්යේෂණ නිලධාරි, 2010 සැප්තැම්බර් 6 - 11 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලියෙ හි පැවති "දැනුම කළමනාකරණය ඔස්සේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා පද්ධති ප්‍රතිසංස්කරණය" පිළිබඳ අධ්‍යයන රැස්වීමට සහභාගී විය.

එම්.එම්.එම්. අභියාර් මහතා - සහාය අධි පර්යේෂක, 2010 ඔක්තෝබර්11-14 දින දක්වා ඕස්ට්‍රේලියාවේ පර්ත් හි පැවති 13 වැනි ජාත්‍යන්තර "ගංගා ශාස්ත්‍රීය" සමුළුවට සහභාගී විය.

එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - පර්යේෂණ නිලධාරි, 2010 නොවැම්බර් 1 සිට 10 දින දක්වා ශ්‍රී ලංකාවේ පැවති " ග්‍රාමීය පානීය ජලය හා සනීපාරක්ෂාව කළමනාකරණය" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

එම්.ටී. පත්මජානී මෙනවිය - පර්යේෂණ නිලධාරිණී, 2010 නොවැම්බර් මස 01 සිට 10 දින දක්වා ශ්‍රී ලංකාවේ පැවති "ග්‍රාමීය පානීය ජලය සහ සනීපාරක්ෂාව කළමනාකරණය" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

ලලිත් කාන්ත ජයසේකර මහතා - අධ්‍යක්ෂ, 2010 දෙසැම්බර් 11 - 16 දින දක්වා ඇෆ්ගනිස්ථානයේ කාබුල් හි පැවති සර්ඩැප් 26 වැනි තාක්ෂණික කමිටුවේ රැස්වීමට සහභාගී විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම	සටහන්	2010.12.31	2009.12.31
		රු.	රු.
මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්		84,930,000.00	87,600,000.00
නේවාසිකාගාර හා සම්මන්ත්‍රණ ශාලා කුලියට			
දීමෙන් ලද අරමුදල්	16	9,430,441.53	7,002,645.42
ප්‍රකාශන අලෙවිය		138,774.00	120,664.50
ආයෝජන පොළිය		1,384,011.22	3,574,611.19
කාර්ය මණ්ඩල ණය මත පොළී ආදායම		1,006,250.33	934,455.41
ව්‍යාපෘති පුනරාවර්තන දායකත්වය	17	1,826,528.85	1,970,411.45
විවිධ ආදායම්	18	1,794,565.51	3,697,425.04
		100,510,571.44	104,900,213.01
වියදම්			
පරිපාලන සහ ආයතනික වියදම්	19	(100,110,184.75)	(93,287,101.25)
ක්ෂය		(4,423,637.86)	(6,907,471.03)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම්		(9,167,130.35)	(8,336,366.97)
බොල් ණය සහ ඌණ වෙන් කිරීම්		(70,547.93)	9,969.98
මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම්වලින් ලත් ශුද්ධ			
ආදායම්/වියදම්		(13,260,929.45)	(3,620,756.26)
මූල්‍ය පිරිවැය		(38,034.43)	(26,750.00)
බදුවලට පෙර ශුද්ධ හිගය		(13,298,963.88)	(3,647,506.26)
බදු		-	-
ආදායම ඉක්මවූ වියදම		(13,298,963.88)	(3,647,506.26)

....

සභාපති   අධ්‍යක්ෂ   ගණකාධිකාරී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
වර්ෂය සඳහා ශුද්ධ හිගය			(13,298,963.88)
ගැලපීම්			
ක්ෂයවීම්		4,423,637.86	
ආයෝජන ආදායම		(1,384,011.22)	
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		2,613,736,.50	
සුන්බුන්/ඉවතලන අයිතමයන් විකිණීමෙන්		(27,100.00)	5,626,263.14
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙයෙහුයම් ලාභය/අලාභය			(7,672,700.74)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
තොග		72,620.07	
ණය ගැතියන්		(1,693,150.23)	
ඉදිරි ගෙවීම්		346,243.95	
අත්තිකාරම්		(570,415.83)	
ණය හිමියෝ		(802,913.96)	
උපචිත වියදම්		2,560,722.17	(86,893.83)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් භාවිතය			(7,759,594.57)
පාරිතෝෂික ගෙවීම්			(3,195,037.50)
මෙහෙයුම් ක්‍රියාකාරකම් ශුද්ධ මුදල් භාවිතය			(10,954,632.07)
ආයෝජන ක්‍රියාකාරකම් මුල්‍ය ප්‍රවාහය			
දේපොළ, යන්ත්‍රෝපකරණ සහ උපාංග මිලදී ගැනීම		(7,491,992.62)	
ආයෝජන ආදායම්		1,384,011.22	
ඉවතලන/ සුන්බුන් අයිතමයන් අලෙවිය		27,100.00	
කාර්ය මණ්ඩල සංවර්ධන වියදම		(246,496.30)	
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලත් ශුද්ධ මුල්‍ය ප්‍රවාහය			(6,327,377.70)
මුල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම්		3,825,261.00	
ව්‍යාපෘති පොදු සංචිත		291,000.00	
දිරිදීමනා අරමුදල – ව්‍යාපෘති		(324.14)	
ව්‍යාපෘති දීමනා අරමුදල – ආයතනයේ කොටස		145,150.18	
රාජ්‍ය උකස් බැංකුව - නිවාස ණය		1,629,394.41	
මුල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්			5,890,481.45
මුදල් හා මුදල් සමාන අනෙකුත් අයිතමයන්ගේ ශුද්ධ අඩුවීම			(11,391,528.32)
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා සමාන අයිතමයන්	I		30,635,475.96
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන අයිතමයන්	II		19,243,947.64
සටහන්:			
මුදල් හා මුදල් සමාන අයිතමයන්		I	II
		01.01.2010	31.12.2010
ආයෝජන - ස්ථාවර තැන්පතු		20,281,414.73	6,122,285.65
භාණ්ඩාගාර බිල්පත්		8,699,757.00	8,699,757.00
බැංකු ශේෂය		1,644,304.23	4,411,904.99
අතැති මුදල්		10,000.00	10,000.00
එකතුව		30,635,475.96	19,243,947.64

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

	රජයේ ප්‍රාග්ධන ප්‍රතිලාභ රු.	ඉතුරුම්වල මූලධන දායකත්වය රු.	අමාත්‍යාංශයේ මූලධන දායකත්වය රු.	ව්‍යාපෘති මූලධන අරමුදල් රු.	මූලධන සංචිත රු.	ව්‍යාපෘති පොදු සංචිත රු.	දිරිදීමනා හා අරමුදල් රු.	දිරිදීමනා අරමුදල් ව්‍යාපෘති රු.	පුහුණු අරමුදල ව්‍යාපෘති රු.	දිරිදීමනා අරමුදල ආයතනයේ කොටස රු.	සමුච්චිත ආදායම්	එකතුව රු.
2010.01.01 දිනට ශේෂය	122,382,500.00	1,102,372.79	2,342,835.00	14,886,206.09	3,242,284.40	16,301,977.47	137,061.91	324.17	396,261.91	2,016,751.85	(81,830,476.61)	80,978,098.9
මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	3,825,261.00	-	-	-	-	-	-	-	-	-	-	3,825,261.00
වසර තුළ ලැබුණු ප්‍රතිපාදන	-	-	-	291,000.00	-	-	-	-	-		-	291000
වසර තුළ සිදු කළ ගෙවීම්	-	-	-		-	-	-	(324.14)	-		-	(324.14)
වසර තුළ ව්‍යාපෘතීන්ගේ දායකත්වය	-	-	-		-	-	-	-	-	145,150.18		145,150.18
ආදායම සහ වියදම	-	-	-		-	-	-	-	-	-	(13,298,963.89)	(13,298,963.8
එකතුව	126,207,761.00	1,102,372.79	2,342,835.00	15,177,206.09	3,242,284.40	16,301,977.47	137,061.91	-	396,261.91	2,161,902.03	(95,129,440.50)	71,940,222.1

2010 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සටහන්

1 ගිණුම් ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට අනුකූලව හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අදාලව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට ඇත.

1.2 වත්කම් තක්සේරුව

I. දේපොළ, පිරියත හා උපකරණ ශේෂ පත්‍රයෙහි දේපොළ පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත. පහත සඳහන් ක්ෂය රේටයන් යටතේ සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කර තිබේ

ගොඩනැගිලි වාර්ෂිකව 2 1/2%

උපකරණ/ගෘහ භාණ්ඩ වාර්ෂිකව 10%

පරිගණක වාර්ෂිකව 20%

සුබසාධන උපකරණ වාර්ෂිකව 10%

පොත් වාර්ෂිකව 10%

සාහන වාර්ෂිකව 20%

මිලදී ගත් වර්ෂයේදී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලබයි.

II. ණය ගැතියෝ

උප ලබ්ධි වේ යැයි අපේක්ෂිත අගයන් වන ණය ගැතියන්ගේ වටිනාකම සඳහන් කොට ඇත. වාර්තා කරන දිනය වන විට ශුද්ධ ණයවලින් 04% ක්, අඩමාණ ණය වෙනුවෙන් වූ ප්‍රතිපාදන සඳහා වෙන් කොට ඇත.

III. තොග

පාරිභෝගික තොග පිරිවැයට ගණනය කොට ඇත. අනෙකුත් තොග පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය හා ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුත් කිරීම් යන අගයන්ගෙන් අඩු අගයට ගණනය කොට ඇත (FIFO ක්‍රමය)

1.3 පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික පණතට අනුව, පාරිතෝෂක ගෙවීම් සඳහා වෙන් කිරීම සිදු කොට ඇත.

1.4 ආදායම් හා වියදම් ගිණුම

වියදම ඉක්ම වූ ආදායම හෝ ආදායම ඉක්ම වූ වියදම පහත ගැළපීම සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

(අ) අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් බොල් ණය හා අඩමාන ණය වෙන් කිරීම් සිදු කොට තිබේ. ආයතනයේ දේපොළ,පිරියත සහ උපකරණ ඵලදායී ලෙස නඩත්තු කෙරෙයි.

(ආ)වසර තුළ සිදු කරන ලද සියළු වියදම් සැලකිල්ලට ගෙන ඇත.

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

සටහන 2

විස්තර	2010.01.01 දිනට පිරිවැය රු.	2010 වසරේ මිල දී ගැනීම් ඉවත් කිරීම් රු.	2010.12.31 දිනට මුළු පිරිවැය රු.	2010.01.01 සමුච්චිත ක්ෂය රු.	2010 වර්ෂය සඳහා ක්ෂය රු.	2010.12.31 දිනට සමුච්චිත ක්ෂය රු.	2010.12.31 දිනට ශුද්ධ අගය රු.
ඉඩම්	1,716,667.00		1,716,667.00				1,716,667.00
ගොඩනැගිලි	26,251,844.31	5,076,470.68	31,328,314.99	9,797,462.24	783,207.87	10,580,670.11	20,747,644.88
උපකරණ/ලී බඩු	31,662,288.76	1,156,435.17	32,818,723.93	20,298,609.05	1,045,720.57	21,344,329.62	11,474,394.31
පරිගණක හා උපාංග	17,538,383.58	830,294.00	18,368,677.58	15,037,437.37	759,433.62	15,796,870.99	2,571,806.59
මෝටර් රථ	12,308,988.06	-	12,308,988.06	8,332,139.06	1,343,400.00	9,675,539.06	2,633,449.00
පොත්	9,696,719.45	428,792.77	10,125,512.22	7,426,383.35	491,875.80	7,918,259.15	2,207,253.07
සුඛසාධන උපකරණ	3,734.55		3,734.55	3,733.55		3,733.55	1.00
එකතුව	99,178,625.71	7,491,992.62	106,670618.33	60,895,764.62	4,423,637.86	65,319,402.48	41,351,215.85

3	හෙ.ගො.ප.පු. ආයතන ආයෝජන - ස්ථාවර තැන්පතු	රු.
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පත්	5,855,500.00
	කෙටි කාලීන තැන්පතු	266,785.65
		6,122,285.65
4	කාර්ය මණ්ඩල සංවර්ධනය	
	2010.01.01 දිනට ශේෂය	20,445,068.72
	වර්ෂය තුළ දී සිදු කරන ලද ගැළපීම්	246,496.30
		20,691,565.02
5	තොග	
	ප්‍රකාශන සහ සඟරා	1,456,482.00
	පරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය සැපයීම	1,161,989.48
	අලෙවිසැල	332,329.00
		2,950,800.48
6	ණය ගැතියෝ	
	කාර්ය මණ්ඩල ණය ගැතියෝ	
	නිවාස ණය	3,991,338.00
	ඒකාබද්ධ ණය	23,277,802.91
	විශේෂ අත්තිකාරම්	900.00
	උත්සව අත්තිකාරම්	136,860.00
	අස්ථානගත වූ පුද්ගලයන්ගෙන් අය	6,723.32
	වැටුප් අත්තිකාරම්	613,496.04
	ශිෂ්‍යත්වලාභීන්ගේ ණය ගැතියෝ	22,331,454.49
		50,358,574.76
	වෙනත් ණය ගැතියෝ	
	ලැබිය යුතු ආයෝජන ආදායම්	355,500.00
	සේවස්ථ පුහුණු ආයතනය ලැබිය යුතු	6,806.38
	කේ.එන්.යු.ගුණසේකරගෙන් ලැබිය යුතු	12,100.00
	කෘෂිකර්ම අමාත්‍යංශයෙන් ලැබිය යුතු	85,527.16
	ඉවත් වූ සේවකයන්ගෙන් අය කරගත යුතු	234,731.72
	සරසවි පොත් සැළ	21,832.25
	සර්ඩැප් ආයතනයෙන් ලැබිය යුතු	124,450.00
	රක්ෂණ අයවීම්	173,700.00
	උපතිස්ස පරණමාන - භෝජනකරු	12,434.43
	කෘෂිකර්ම අමාත්‍යංශය - පුහුණු ක්‍රියාකාරකම්	589,022.12
	ඒ.පී.ඕ	40,000.00
		1,656,104.06
		52,014,678.82
	අඩු කළා	
	බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(1,187,328.97)
	ණය හිමියන් (බැඳුම්කාර) සඳහා වෙන් කිරීම්	

		(110,373.69)
	ශිෂ්‍යත්වලාභීන් සඳහා වෙන් කිරීම්	(22,331,454.49)
		28,385,521.67
7	තැන්පතු	
	ස්ථාවර - භෝජනාගාර හිමිකරු	70,000.00
	ස්ථාවර - මුදල් අයකැමි	1,500.00
	විවිධ - ෆීලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ	147,500.00
	විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්)	3,125.00
	විවිධ - තැපැල්පති	24,945.00
	විවිධ - කොළඹ ගෑස් සහ ජල සමාගම	4,750.00
	විවිධ - ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	500.00
	විවිධ - සී.ස.සෙල්ටෙල් ලංකා සමාගම	3,500.00
	විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය	406,250.00
		662,070.00
8	ඉදිරි ගෙවීම්	278,091.96
	මෝටර් රථ රක්ෂණය	278,091.96
9	අත්තිකාරම්	
	මිල දී ගැනීම් අත්තිකාරම්	197,712.95
	අනෙකුත් අත්තිකාරම්	463,045.00
		660,757.95
10	බැංකුවෙහි ඇති මුදල්	
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323293	524,881.84
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323292	666,965.08
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323317	3,204,702.20
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323315	15,355.87
		4,411,904.99
11	රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	
	2010.01.01 දිනට ශේෂය	3,825,261.00
	වසර තුළ ප්‍රාග්ධන දායකත්වය	
12	ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල	
	2010.01.01 දිනට ශේෂය	14,886,206.09
	වසර තුළදී එකතු කිරීම්	291,000.00
		15,177,206.09
13	ව්‍යාපෘති පොදු සංචිතය	
	2010.01.01 දිනට ශේෂය	16,301,977.47
	වසර තුළදී එකතු කිරීම්	-
		16,301,977.47
14	ශුද්ධ හිගය	
	2010.01.01 දිනට ශේෂය	81,830,476.61
	2010.12.31 දිනට ආදායම ඉක්ම වූ වියදම	13,298,963.88
		95,129,440.49

15	ණය හිමියන්	
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	118,462.20
	ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු-උපතිස්ස පරණමාන	50,000.00
	නොගෙවූ වියදම්	63,088.39
	ඉවත් වූ සේවකයන් සඳහා ගෙවිය යුතු	150,015.00
	සේවක සහ ආපනශාලා තැන්පතු	13,084.50
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	5,600.00
	රඳවා ගත් මුදල	85,087.41
	පන්සිළු ඔෆ්සෙට් මුද්‍රණකරුවෝ	54,531.25
	ව්‍යාපෘතිවලට එරෙහි ණය හිමියෝ	
	සහල් නිෂ්පාදනය පිළිබඳ ග්‍රන්ථය	644,767.68
	ආර්-300-සමෘද්ධි හා සමෘද්ධි නොවන්නන් තුලනාත්මක විශ්ලේෂණය	234,996.50
	ආර්-322-වාරියපොළ ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සම්බන්ධ යෝජනාව	26,119.08
	ආර්-324-ගෘහස්ථ මට්ටමෙන් සහල් නිෂ්පාදනයේ ආර්ථිකමය ශක්‍යතාවය	42,568.10
	ආර්-332-බස්නාහිර පොළ වෙළෙඳාම ප්‍රවර්ධනය සඳහා වන අධ්‍යයනය	1,535,452.72
	ටී-294-ෆිවිම්ස් (FIVIM)	217,946.87
	ආර්-318-ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතභාවය සහ තොරතුරු සිතියම් ගත කිරීම	22,450.07
	ආර්-334-ශක්‍යතා අධ්‍යයනය-යෝජිත බලංගොඩ ආර්ථික මධ්‍යස්ථානය	24,048.32
	ආර්-371-අනුරාධපුරය හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි සීනි ව්‍යාපෘතිය නිදහස් ශක්‍යතා අධ්‍යයනය	691,562.20
	ටී-228-ගැටුම්වලට මුහුණ දුන් ප්‍රදේශයන්හි සංවර්ධනාත්මක ක්‍රියාමාර්ග අරභයා වූ ක්‍රමෝපායයන් පිළිබඳ වැඩමුළුව	613,680.24
	ආර්-330-ශක්‍යතා අධ්‍යයනය-යෝජිත කුරුදුවත්ත ආර්ථික මධ්‍යස්ථානය	163,057.26
	ආර්-356-පූර්ව ශක්‍යතා අධ්‍යයනය-යෝජිත මොණරාගල සියඹලාණ්ඩුව උක් වගා ව්‍යාපෘතිය	163,945.94
	ටී-226-ප්‍රජා මට්ටමේ නායකයන්ට උපදේශනාත්මක තොරතුරු පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමේ වැඩසටහන	387,068.94
	ටී-239-කෘෂි අලෙවිකරණ ව්‍යාපෘතිය පිළිබඳ දේශීය පුහුණු වැඩසටහන	461,285.95
	ටී-236-ශ්‍රී ලංකාජල සංවර්ධන වාර්තාව පිළිබඳ උපදේශනාත්මක වැඩමුළුව	41,749.05
	ටී-232-පුහුණු වැඩසටහන	443,078.38
	ටී-245-දිළිඳුකම පිටුදැකීම අරමුණු කොට ගත් ග්‍රාමීය සංවර්ධනයේ නව සහ මතු වී ඇති අභියෝගයන් පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන	889,205.68
	ටී-274-පුහුණු වැඩසටහන-ගොවීන් සවිබල ගැන්වීම	36,309.90
	ටී-281-පුහුණු වැඩසටහන-ආහාර සරක්ෂිත හා ආවේක්ෂණ පිළිබඳ ආහාර වැඩසටහන	148,500.00
		7,327,661.63
16	ශ්‍රවනාගාරය,සම්මන්ත්‍රණශාලාව සහ නේවාසිකාගාර අයකිරීම්	
	ශ්‍රවනාගාරය සහ සම්මන්ත්‍රණශාලා අයකිරීම්	4,193,620.80

	නේවාසිකාගාර අයකිරීම්	5,236,820.73
		9,430,441.53
17	ව්‍යාපෘති ආදායම	
	පරිපාලන වියදම සහ ව්‍යාපෘති ආදායම	1,826,528.85
		1,826,528.85
18	විවිධ ආදායම්	
	බංගලා ගාස්තු සහ කාමර කුළී	143,531.57
	පැල්වෙහෙර කාමර කුළී	22,800.00
	පරිගණක ආදායම	2,749.68
	ටෙන්ඩර් ගාස්තු	7,250.00
	අනෙකුත් ආදායම්	1,618,234.26
		1,794,565.51
19	පරිපාලන හා ආයතනික වියදම්	
	වැටුප් - ස්ථිර කාර්ය මණ්ඩලය	43,032,164.74
	වැටුප් - අනියම් කාර්ය මණ්ඩලය	7,290,227.08
	සේවක අර්ථසාධක අරමුදල	7,408,602.23
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	1,481,720.38
	අතිකාල	2,046,021.34
	නිවාඩු දින ගෙවීම්	21,177.29
	ජීවන වියදම් හා වෙනත් දීමනා	14,802,169.32
	පාරිතෝෂික	2,613,736.50
	ගමන් වියදම් හා යැපීම් දීමනා	550,051.71
	විදේශීය ගමන් වයදම්	618,853.97
	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	909,505.85
	වෙනත් පරිභෝජන ද්‍රව්‍ය	1,418,384.95
	ඉන්ධන සහ ලිහිසි තෙල්	1,076,383.28
	නිල ඇඳුම්	273,346.20
	වාහන අළුත්වැඩියා	2,001,965.27
	ගොඩනැගිලි නඩත්තු කටයුතු	607,848.12
	යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා	1,174,546.66
	දුරකථන ගාස්තු	993,300.60
	විදුලිය	3,219,684.11
	ජල බිල්පත්	945,755.52
	බදු සහ වරිපනම්	274,888.80
	තැපැල් ගාස්තු	405,000.00
	ප්‍රවාහන	355,370.00
	නීති උපදෙස්	120,000.00
	පරිගණක උපදේශක	72,000.00
	පුවත්පත්	234,238.00
	බලපත්‍ර සහ රක්ෂණය	579,755.90

	ආරක්ෂක ගාස්තු	1,555,793.06
	පිරිසිදු කිරීමේ ගාස්තු	482,384.60
	රෙදි සේදීම	331,790.00
	විගණන ගාස්තු	300,000.00
	වෛද්‍ය ගාස්තු	14,741.93
	ආපනශාලා ගාස්තු	103,175.00
	විවිධ වියදම්	602,929.77
	නීති ගාස්තු	361,375.00
	සුබ සාධන	369,440.00
	දැන්වීම්	167,014.40
	සම්මුඛ පරීක්ෂණ ගාස්තු	2,000.00
	පාලක මණ්ඩලය	40,000.00
	මුද්‍රණ හා ප්‍රකාශන	223,977.42
	විනෝදාත්මක	4,769.00
	වාර්ෂික දායකත්ව මුදල්	89,187.00
	38 වැනි සංවත්සර වියදම්	144,383.00
	තොරතුරු බෙදාහැරීම	154,800.00
	බොල් ණය කපා හැරීම	386,901.75
	අලෙවි වියදම් - ප්‍රකාශන	123,930.00
	පළුදු වූ තොග කපා හැරීම	124,895.00
		100,110,184.75
20	කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ සමාන අයිතමයන්	
	ආයෝජන - ස්ථාවර තැන්පතු	20,281,414.73
	භාණ්ඩාගාර බිල්පත්	8,699,757.00
	බැංකුවේ ඇති මුදල්	164,304.23
	අතැති මුදල්	10,000.00
		29,155,475.96
21	කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන අයිතමයන්	
	ආයෝජන - ස්ථාවර තැන්පතු	6,122,285.65
	භාණ්ඩාගාර බිල්පත්	8,699,757.00
	බැංකුවේ ඇති මුදල්	4,411,904.99
	අතැති මුදල්	10,000.00
		19,243,947.64

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல: ඒඑෆ්/ඩී/එච්ඒආර්ටීඅයි/ එෆ්එ/2010

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி: 2011 ජූනි 28 දින

සභාපති,
හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය .

හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 05 දරන හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත සමඟ සංයෝජිතව කියවිය යුතු , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2010 මාර්තු 31 දින ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1:3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් බාරගන්නා බවට ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18**

(i) ආයතනය දිගින් දිගටම ප්‍රයෝජනයට ගන්නා පිරිවැය රු.4,990,323 ක්වූ මෝටර් රථ 09 ක් සම්පූර්ණයෙන් ක්ෂයකර මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ අගය ශුන්‍ය ලෙස දැක්වුවද, ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ආයතනයේ නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනයට ලබාදෙන ශිෂ්‍යත්ව සඳහා වැයකරන ලද මුදල්වල එකතුව වූ රු.20,691,656 ක් ශේෂ පත්‍රයේ සේවක සංවර්ධනය නමින් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අයකර ගතයුතු රක්ෂණ වන්දි වු රු.173,700 ක් මූල්‍ය ප්‍රකාශනයේ අයකරගත යුතු රක්ෂණ වන්දි ලෙස නොදක්වා වෙනත් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන/ලේඛනයේ ශේෂයන් සමඟ නොසැසඳුණු අවස්ථා නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

අයිතමය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	උපලේඛනය/ලේඛනය	උපලේඛනය/ලේඛනය අනුව ශේෂය	වෙනස
	රු.		රු.	රු
ප්‍රකාශන හා ජනල්	1,456,482	උපලේඛනය	1,467,052	10,570
පාරිභෝගික ද්‍රව්‍ය	1,161,989	-එම-	1,159,364	2,625
අලෙවි මධ්‍යස්ථානය	332,329	-එම-	329,427	2,902
සමාලෝචිත වර්ෂයේ පරිගණක හා පරිගණක උපකරණ මිලදී ගැනීම්	830,294	ස්ථාවර වත්කම් ලේඛනය	712,274	118,020

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
ලී බඩු උපකරණ	11,474,394	(i) විස්තරාත්මක උපලේඛන
පරිගණක හා උපාංග	2,571,807	(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා
		(iii) 2009 වර්ෂයට පෙර මිලදී ගත් වටිනාකම් ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන
මෝටර් රථ	2,633,449	(i) භාණ්ඩ සමීක්ෂණ වාර්තා
පුස්තකාල පොත්	2,207,253	(ii) 2009 වර්ෂයට පෙර මිලදී ගත් වටිනාකම් ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන
බොල්ණය කපාහැරීම	386,902	අමාත්‍යංශ අනුමැතිය
මෝටර් රථ හා මොටර් සයිකල් ණය	2,400,000	වාහන මිලදී ගත් බවට ඉදිරිපත් කලයුතු ලියවිලි

2.2.5 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සේවය අත්හැර ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවියයුතු රු.234,732 ක ශේෂයක් වර්ෂ 4 කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී සේවකයින් 20 දෙනෙකුට ලබාදුන් රු. 660,758 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනවන විටද නිරවුල් කරගෙන නොතිබුණි.

(iii) බාහිර ආයතන හා පුද්ගලයින් 08 දෙනෙකුගෙන් රු.461,742 ක මුදලක් වර්ෂ 01 සිට වර්ෂ 06 කටත් වැඩි කාලයක සිට ලැබිය යුතුව පැවතුණි.

(iv) මූල්‍ය ප්‍රකාශනවල 2008 වර්ෂයටත් පෙර සිට පැවැත එන හඳුනානොගත් ණයගැතියෝ (බැදුම්කර) රු.110,374 ක් සමාලෝචිත වර්ෂයේදී ණයගැතියන්ගෙන් අඩුකර ගිණුම් ගත කර තිබුණි.

(v) පර්යේෂණ ව්‍යපෘති 14 ක් අවසන්වීමෙන් පසු ඉතිරිවී තිබුණු රු.5,102,707 ක් 2009 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දක්වා තිබුණද එම මුදල් ආයතනයේ පුනරාවර්තන වියදම්වලට යොදවා ගෙන තිබුණු බැවින් ණයහිමියන් නිරවුල් කිරීමට ප්‍රමාණවත් මුදල් ආයතනයේ නොමැති බව 2011 අප්‍රේල් 07 දිනැති ලිපියෙන් ආයතනයේ අධ්‍යක්ෂවරයා දන්වා තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණයගැතියන් 18 දෙනෙකුගෙන් රු.453,955 ක මුදලක් අයකරගත යුතු වන අතර ඉන් 6 දෙනෙකුට පමණක් ණය පියවන ලෙස දන්වා ලිපි යවා තිබුණි.

(vii) සේවය අත්හිටුවනු ලැබූ සේවකයෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දින වන විට අයවීමට තිබුණු හිඟ ණය මුදල වූ රු.98,991 ක් අයකරගෙන නොතිබුණි.

(viii) ණය යෝජනා ක්‍රමයෙන් ණය ලබාදුන් සේවකයින් 05 දෙනෙකු දැනට සේවයේ නොමැති අතර ඔවුන්ගෙන් අයවියයුතුව පවතින ණය ශේෂය රු.120,237 ක් විය.

(ix) 2010 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය රු.22,331,454 ක් වූ අතර ඉන් 06 දෙනෙකුගෙන් රු.11,438,649 ක මුදලක් අයවියයුතු වුවද වර්ෂය තුල කිසිදු මුදලක් අයවී නොතිබුණි.

2.2.6 නිති,රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නිති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නිති,රීති රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය , 371(2)	තත්කාර්ය අතුරු අග්‍රිමයන් වශයෙන් රු.20,000 ඉක්මවා අවස්ථා 10 කදී රු.130,000 ක් ලබාදී තිබුණි.
(ආ) චක්‍රලේඛ	
(i) අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය	ධාවන තත්ත්වයේ ඇති වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව මාස 6 කට වරක් කළයුතු ඉන්ධන පරීක්ෂාව 2005 පෙබරවාරි 01 දිනෙන් පසුව සිදුකර නොතිබුණි.
(ii) අංක 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9.3.1 ඡේදය	ආයතනය විසින් ප්‍රයෝජනයට ගන්නා ආයතනයේ වාහන 7 ක් මත රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.
(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය	(i) වාහන අලුත්වැඩියා සඳහා මිල කැඳවීම් කර නොතිබුණු අතර,ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන ආයතනයකින් වාහන 11 ක් අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.1,391,197 ක් වැයකර තිබුණි.

(ii) ටෙන්ඩර් ක්‍රියාවලිය විධිමත්ව අනුගමනය නොකර වායු සමීකරණ යන්ත්‍ර 28 ක් මිලදී ගෙන රු.1,509,206 ක් ගෙවීම්කර තිබුණි.

2.2.7 අධිකාර බලයෙන් තොර ගනුදෙනු

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනයේ සේවකයින්ට නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවක රු.2,000,000 ක මූලික තැන්පතුවක් තබා එම තැන්පතුව පදනම් කර ගෙන ණය දීමට 1993 වර්ෂයේ ගිවිසුමකට ඇතුලත් වී තිබුණි.

ඒ අනුව වර්ෂය අවසානයේ පැවති තැන්පතු මුදල වූ රු.2,361,944 ක් ඉක්මවා ලබා දුන් රු.1,629,394 ක ණය, ශේෂ පත්‍රයේ ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. ආයතනයේ අරමුදලින් පවත්වා ගෙන යන නිවාස ණය යෝජනා ක්‍රමය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.13,298,964 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,647,506 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,651,458 ක පිරිහීම සඳහා පරිපාලන වියදම් ඉහල යාම හා භාණ්ඩාගාර ප්‍රදාන අඩුවෙන් ලැබීම යන කරුණු බලපා තිබුණි.

3.2 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ආයතනය ආරම්භ කරන ලද ව්‍යාපෘති 15 ක් හා පෙර වර්ෂයේ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණි. එයින් ව්‍යාපෘති 14 ක් 2010 වර්ෂයේ අවසන් කර තිබුණද වටිනාකම රු. 5,572,435 ක්වූ ව්‍යාපෘති 02 ක් සඳහා අවශ්‍ය මුදල් හා තොරතුරු නොලැබීම මත අත්හැර දමා තිබුණි.

3.3 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගත වීමට පෙර සියලු ණය මුදල් පියවිය යුතු වුවද 2009 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබා විදේශ ගතවූ නිලධාරියෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දින වන විට රු.99,362 ක ණය මුදලක් අයවීමට තිබුණි.

(ii) වියදම් කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන් නිවැරදිව තක්සේරු කිරීමකින් තොරව නිලධාරීන් 14 දෙනෙකු රු.270,000 ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන දින 4 සිට දින 14 දක්වා කාල පරාසයකින් පසු රු.199,497 ක මුදලක් ආපසු පියවා තිබුණි.

(iii) නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් අවස්ථා 08 කදී ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි.

(iv) පුද්ගලයින් විසින් රැගෙන ගොස් ආපසු බාරදී නොමැති පුස්තකාලපොත් 285 ක් හා විනාශ වී තිබුණු පොත් 129 ක් සම්බන්ධයෙන් ආයතනය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) ආහාර හා කෘෂිකර්ම සංවිධානය සතු අංක 65-1280 දරන පැජරෝ ජීප් රථය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කලමනාකරණය

කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යංශය යටතේ පැවැති සංචාරක බංගලාව ආයතනය වෙත භාරදී අවුරුදු 06 ක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එහි නීතිමය අයිතිය ආයතනය වෙත පවරාගෙන නොතිබුණි.

3.5 මානව සම්පත් කළමණාකරනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආයතනයේ කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන නොතිබුණි.

(ii) ආයතනයේ පවත්වාගෙන යනු ලබන කාර්ය මණ්ඩල වාර්තාවේ නොමැති තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර, අනුමත වයස් කාණ්ඩය ඉක්ම වූ තිදෙනෙකුද අනියම් පදනම මත බඳවා ගෙන තිබුණි.

(iii) අනියම් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 04 දෙනෙකුගේ සේවා කාලය අවසන් වී තිබුණද සේවය අවසන් කර හෝ සේවා කාලය දීර්ඝ කර හෝ නොමැතිව සේවයේ යොදවා තිබුණි.

(iv) නඩත්තු නිලධාරී තනතුර සඳහා බඳවා ගනු ලබන දිනට තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හිමි අයකු පත්කළ යුතු නමුත් 2008 වර්ෂයේ බඳවා ගනු ලැබූ නඩත්තු නිලධාරියා සඳහා එදිනට සුදුසුකම් සපුරා නොතිබියදී බඳවා ගැනීම සිදුකර තිබුණි.

(v) ආයතනයේ නිත්‍ය තනතුරු 7 ක් සඳහා ස්ථිර පත්වීම් සිදු නොකර මාස 7 සිට මාස 41 දක්වා කාල පරාසයන් සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කර රු.367,360 ක ගෙවීම් සිදුකර තිබුණි.

(vi) කාර්යභාරයන් පැවරීමේ පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත 2010 ජූනි මාසයේ සිට සේවකයින් 22 ක් බඳවා ගෙන තිබුණු අතර, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි.

(vii) 2010 වර්ෂය තුළදී අනුමත බඳවා ගැනීම් පරිපාටියෙන් බැහැරව සේවකයින් 33 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

3.6 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත දත්ත හා තථ්‍ය දත්ත අතර සැලකිය යුතු විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

04. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(i) සේවක කළමනාකරණය
(ii) අත්තිකාරම් .
(iii) සේවක ණය
(iv) ස්ථාවර වත්කම් කළමනාකරණය
(v) ආදායම් ගිණුම්

එච්.ඒ.එස්.සමරවීර
වැඩබලන විගණකාධිපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා වූ පිළිතුරු වාර්තාව

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අ) 2011 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී ගණකාධිකරණ ප්‍රතිපත්ති යටතේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ට අනුව මෙම නිවැරදි කිරීම කරගැනීමට සටහන් කරගන්නා ලදී.

ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18

(I) 2011 වර්ෂයේ ගිණුම් ගත කිරීම සඳහා මෝටර් රථ 09 ප්‍රත්‍යාගණනය කර ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව සකස් කිරීමට පියවර ගන්නා ලදී.

(II) වර්ෂ 2011 ගිණුම් පිළියෙල කිරීමේ දී ආයතනයේ නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනයට ලබාදෙන ලද මුදල්වල මුළු එකතුව ගිණුම්වලින් නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

අයකර ගතයුතු රක්ෂණ වන්දිය වූ රු. 173,700/- මූල්‍ය ප්‍රකාශනයේ අයකර ගතයුතු රක්ෂණ වන්දි යටතේ ගිණුම් ගත කිරීමට තීරණය කරන ලදී.

2.2.3. නොසැසඳුණු පාලන ගිණුම්

පරිගණක හා පරිගණක උපකරණ මිලදී ගැනීම්වල නොසැසඳුණු ගිණුම් ජ'නල් අංක මගින් නිවැරදි කර ඇත.

2.2.4. විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

(I) ලී බඩු උපකරණ පරිගණක හා උපාංග
(II) මෝටර් රථ
(III) පුස්තකාල පොත්
(භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත 2011/04/25 වැනි දින යොමු කර ඇත.)

බොල් ණය කපා හැරීම

පාලන මණ්ඩලයේ අනුමැතිය මත මෙම ණය කපා ඇති නමුත් ඉදිරි කපා හැරීම් වලදී අමාත්‍යංශ අනුමැතිය ලබාගැනීමට සටහන් කර ගන්නා ලදී.

මෝටර් රථ හා මෝටර් සයිකල ණය

මේ පිළිබඳව 2010/08/18 දිනැති කාර්යාල නියෝග අංක 365 ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

2.2.5. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(I) මෙම ශේෂයන් ඉතා පැරණි ශේෂයන් බැවින් අදාල විස්තර ආයතනය සතුව නොපවතින බැවින් අයකර ගැනීමට නොහැකි වී ඇත.

(II) මෙම සියළු අත්තිකාරම් මුදල් 2011 වර්ෂයේදී අයකර ගත් අතර අත්තිකාරකම් සඳහා තිබූ අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කර ඇත.

(III) මෙම 461,742 මුදලින් රු. 111,156/86 ඉතා පැරණි ශේෂයන් වන අතර අදාල ලියකියවිලි ආයතනය සතුව නොමැත. APO ආයතනයෙන් ලැබිය යුතු මුදල වන රු.40,000/- සහ උපතිස්ස පරණ විතාන මහතාගෙන් අයවිය යුතු රු.12,434.43 ක මුදල 2011 වර්ෂය තුලදී අයකරගෙන ඇත. ඉතිරි අයකර ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(IV) 2011 වර්ෂයේදී ගිණුම් පිලියෙල කිරීමේදී ණය ගැති බැදුම් කර මුදල වන රු.110,374/- නිවැරදි කරනු ලැබේ.

(V) මෙම මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. 2010 දෙසැම්බර් මාසය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අක්මුදල් ලෙස ආයතනය සතු බැංකු තැන්පත්වලින් රු. මිලියන 5.8 ක් පුනරාවර්තන වියදම් සඳහා ලබා ගන්නා ලදී. ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා යෙදවීම වෙනුවෙන් ඉතිරි තැන්පත් මුදල් උපයෝගී කරගෙන වාහන 02ක් මිල දී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී ඇති බැවින් මෙම කරුණු වෙනුවෙන් මුදල් යෙදවූ පසු මෙය නිරවුල් කිරීමට තරම් මුදලක් ආයතනය සතුව නොපවතී. කෙසේ වුවද මුදල් තත්වය යහපත් වූ විගස මෙය නිරවුල් කිරීමට සටහන් කර ගන්නා ලදී.

(VI) මෙම ශේෂයෙන් ඉතා පැරණි ශේෂයන් බැවින් සහ මේ පිලිබඳ විස්තර ආයතනය සතුව නොමැත.

(VII) අත්හිටවනු ලැබූ සේවකයා වන කේ.බී. අනුරතිලක 2011/06/01 සිට නැවත සේවයට පැමිණි අතර එම ණය මුදල වාරික වශයෙන් අයකර ගනු ලැබේ.

(VIII) ආර්.එම්.ආර්. බණඩාර,ටී.ජ්.සෝමරත්න සහ ආර්.ඩබ්.දිසානායක යන සේවකයින්ගෙන් අය කර ගත යුතු මුදල අයකර ගැනීම සඳහා බැංකුව වෙත ලිඛිතව දන්වා ඇත.

කේ.පී.එස්. වනිගසිංහ මිය සහ ආයතනය අතර ඇති නීතිමය කටයුතු අවසන් වී නොමැත.ඒ.ඒ.එස්.ආර්.අබේසිරිවර්ධන මහතා නමින් සඳහන්ව ඇති ණය මුදල දැනට ආයතනයේ සේවය කරන දීප්තිකා රූපසිංහ මහත්මිය වෙනුවෙන් ලබා දුන් ණය මුදලකි

(IX) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂය 22,331,454.49 කි. ඉන් කිසිදු මුදලක් අය නොවන ණයගැතියන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු. 11,473,649.60 කි. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

- එස්.ඩී. අබේරත්න මහත්මිය - රු. 501,392/-

  අබේරත්න මහත්මියගේ විදේශ ලිපිනයන් සොයාගැනීමට නොහැකි වීමෙන් මෙම නඩුව දැනට අධිකරණයේ බහා තබා ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ලිපිනය සොයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටී. තවද ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හරහා ද අබේරත්න මියගේ වර්තමාන ලිපිනය සොයා ගැනීමට කටුතු කරමින් සිටී.

- ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මයා - රු. 5,231,878.10

  ගාමිණී වික්‍රමසිංහ මහතා සම්බන්ධ නඩුව අධිකරණයේ විභාග වීමෙන් පසුව 2010.11.24 දින ආයතනයේ වාසියට තීන්දු කර ඇත. ගාමිණී වික්‍රමසිංහ මහතා විසින් තීන්දුවට එරෙහිව අභියාචනා පෙත්සමක් ගොනු කර ඇත. එහි නියෝගය ලැබෙන තෙක් කිසිදු අය කිරීමක් ලබාගත නොහැක.

- සී.බී.ආර්. කුමාරසිරි මහතා - රු. 499,302.98

  මෙම නඩුවට අදාළව විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා ඇත. මීළඟ විභාග දිනය 2011.06.01 දිනට යෙදී ඇත. නඩු තීන්දුව ලැබෙන තෙක් අය කරගැනීමක් සිදු කළ නොහැක.

- යූ.එල්.ජේ.කේ. පෙරේරා මහතා - රු. 569,487.71

  අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතින අතර, මේ වනතෙක් අදාළ තීන්දුව ලැබී නොමැත.

- ආර්.බී. සේනකාරච්චි මහතා - රු.3,421,942.70

  2006.08.17 දිනැති අධිකරණ තීන්දුව අනුව රු.3,421,943/- ක මුදලක් ආයතනයට ගෙවීමට ආර්.බී. සේනකාරච්චි මහතා වෙත තීන්දු කර ඇත. මෙම

තීන්දුවට එරෙහිව 2007.01.12 දින අභියාචනා පෙත්සමක් ගොනු කර ඇත. දැනට සිවිල් අභියාචනා මහාධිකරණයේදී විභාගය සඳහා දින නියම කර නැත. එම නඩු තීන්දුව ලැබෙනතෙක් අදාළ මුදල් අය කරගැනීමට හැකියාවක් නොමැත.

- ඒ.ඩී.කේ. සේපාල මහත්මිය - රු. 1,249,646.11

2006.06.21 දිනැති අධිකරණ තීන්දුව අනුව රු. 1,249,641.00 මුදලක් ආයතනයට ගෙවීමට තීන්දු කර ඇත. මෙම තීන්දුවට එරෙහිව විත්තිකරුවන් විසින් 2006.08.18 දින අභියාචනා පෙත්සමක් ගොනු කර ඇත. සිවිල් අභියාචනා මහාධිකරණයේ දී එම අභියාචන පෙත්සම විභාගය සඳහා දින නියම කර නැත. එම නඩු තීන්දුව ලැබෙන තෙක් අදාළ මුදල් අය කරගැනීමට හැකියාවක් නොමැත.

ඉහත විස්තර කිරීම අනුව අධිකරණයේ තීරණය ලැබෙන තෙක් නම් කරන ලද ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 දෙනා සම්බන්ධයෙන් ණය අයකිරීම්වල ප්‍රගතියත් පෙන්නුම් කිරීමට හැකියාක් නොමැති බව දන්වමි.

2.2.6 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ, 371(2).

අප ආයතනය සිදු කරනු ලබන පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා අදාල පාර්ශවයන් දැනුවත් කිරීම තොරතුරු රැස් කිරීම වෙනුවෙන් කෙටි කාලීනව හා දීර්ඝ කාලීන ව ක්ෂේත්‍ර කටයුතු වල නියැලීමට සිදුවේ. එබැවින් එම කාර්යයන් සඳහා අධික මුදලක් වැය වන අතර එම අවශ්‍යතාවයන් මත මෙසේ අත්තිකාරම් මුදල් ලබා දී ඇත.

(ආ) චක්‍රලේඛ

(i) අංක 41/90 හා 1990 ඔක්තෝම්බර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් නොකිරීම

වාහන බොහොමයක් ධාවන තත්ත්වයේ නොතිබූ බැවින් ඒවා භාවිතයට නොගැනුණි. ඊට හේතුව වූයේ ඒ සඳහා අධික මුදලක් අලුත්වැඩියාවන් සඳහා වැයකිරීමට සිදුවන බැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම අපහසු නිසාය. ධාවන තත්ත්වයේ ඇති වාහන හදිසි ක්ෂේත්‍ර රාජකාරි සඳහා යොදවා ඇති නිසා මෙම ඉන්ධන පරීක්ෂාවට ලක් කිරීමට නොහැකි වුණි. මින් ඉදිරියේදී 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මාස 06 කට වරක් ඉන්ධන පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ii) අංක 10/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9.3.1 ඡේදය වාහන 7 ක ආයතන නාමය සහ ලාංඡනය පින්තාරු නොකිරීම

ආයතනය සතු වාහන 16 අතුරින් වාහන 07 ක 2008/2009 වර්ෂ තුළ කරන ලද පින්තාරු කටයුතුවලදී ආයතනයේ නාමය සහ ලාංඡනය මැකී ගොස් ඇති අතර එම වාහනවල ආයතනයේ නාමය සහ ලාංඡනය පින්තාරු කිරීම සඳහා කඩිනමින් පියවර ගනු ලැබේ.

(ඇ) 2006 ප්‍රසම්පාදන

(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය

ආයතනය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට අනුව වාහන අළුත්වැඩියාව සඳහා සැමවිටකම මිල කැඳවීම් සිදුකළ අතර අවස්ථා කිහිපයකදී පමණක් එසේ අනුගමනය නොකිරීමට සිදුවූයේ ක්ෂේත්‍ර කටයුතු සඳහා පර්යේෂණ නිලධාරීන්ට ඉතා කෙටි කාල සීමාවකදී වාහන ලබාදිය යුතු නිසාත් අළුත්වැඩියාවන් කටයුතු සඳහා මිල කැඳවූ අවස්ථාවන් වලදී, එම මිල ගණන් ඉතා ඉහළ මට්ටමක පැවති බැවින් අවශ්‍යම නඩත්තු කටයුතු සිදුකර ධාවනය සඳහා යෙදවීමේ අවශ්‍යතාවයක් මතය (කුළී පදනම මත වාහන ලබා ගැනීමට ආයතනයට සිදුවූයේ නම් මේ සඳහා විශාල මුදලක් වැයකළ යුතු වේ).

(ii) ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර ඇත. නමුත් තත්ත්වයේ උසස් යන්ත්‍රවල ධාරිතාවය පහළ මට්ටමක පවතින අවම මිල ගණන් ද ඉදිරිපත් කර තිබූ ජයසේකර එන්ටර්ප්‍රයිසස් ආයතනයේ (සිංගර් වායුසමීකරණ යන්ත්‍ර) මිලදී ගැනීමට සිදුවිය. මේ මගින් ආයතනයට විශාල වාසියක් සිදුවිය.

2.2.7 අධිකාර බලෙන් තොර ගනුදෙනු

2011 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්කරණ දෝෂ සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදර නොකිරීම් සියල්ල ඇතුලත් කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.

3.0 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

2010 දෙසැම්බර් මස අත් මුදල් සඳහා භාණ්ඩාගාරයේ උපදෙස් මත රු. මි. 5.8 ක මුදලක් බැංකු තැන්පතුවලින් ලබාගන්නා ලදී. මෙම ඌනතාවය වර්ධනයට බලපා ඇත.

3.2 කාර්ය සාධනය

2010 වර්ෂයේ ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක වූ අතර ඉන් ව්‍යාපෘති 14 ක් වර්ෂය තුළ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති 05 න් 02 ක් අවසන් කිරීමට සැලසුම් කර ඇත්තේ 2011 වර්ෂයේය. රු. 5,572,435 ක් ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘති 02 ක් අත්හැරීමට පාදක වූ හේතු පහත දැක්වේ.

01. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වී වගාවේ වත්මන් තත්ත්වය සොයා බැලීමේ අධ්‍යයනය අමාත්‍යාංශයේ මුදල් (රු.5,310,470) නොලැබීම නිසා අත්හරින ලදී.

02. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම මත රාජ්‍ය තේ වතු පෞද්ගලිකරණය කිරීම තුළින් කර ඇති බලපෑම සොයා බැලීමේ අධ්‍යයනය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අවශ්‍ය තොරතුරු නොලැබීම නිසා නතර කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා රු. 261,965/- ඇස්තමේන්තු කරන ලදී.

ඉහත අධ්‍යයනයන් 02 කම 2010 ක්‍රියාකාර් සැලැස්මට පරිබාහිරව ආරම්භ කරන ලදී. වී වගාව සම්බන්ධ අධ්‍යයනය 2010 දෙසැම්බර් මාසයේදී, තේ වතු සම්බන්ධ අධ්‍යයනය 2010 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී.

2010 වර්ෂයේ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 14 ට අමතරව විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන වල ඉල්ලීම මත විශේෂ අධ්‍යයන 21 ක් කර වාර්තා ඉදිරිපත් කරන ලදී.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(i) එල්.ජී. ආර්යරත්න මහතාගෙන් අයවීමට ඇති මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ii) අත්තිකාරම් මුදල් ලබාගෙන ඇත්තේ දුර බැහැර ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සඳහාය. ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු වලදී ගොවීන්ගේ නිවෙස් වෙත යාමට සිදුවීමත් එසේ ගමන් කිරීමේදී ඔවුන් නිවෙස්වල නොසිටියහොත් කිහිපවරක් යාමට සිදුවේ. මේ අනුව වාහනය සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය වෙනුවෙන් මෙම අත්තිකාරම් ලබාගන්නා අතර ආයතනය වෙතින් අනුමත නිතිරීති යටතේ කටයුතු කර ඇත. අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයට අමතර වශයෙන් ගමනේදී සිදුවන වාහනයේ බිඳවැටීම් සැකසීම වෙනුවෙන්ද යම් ප්‍රමාණයක් මුදල් ලබා ගන්නා අතර එය නිශ්චිතවම කොතරම්දැයි පූර්ව තක්සේරුවක් කළ නොහැක. ආයතනය සතු බොහොමයක් වාහන අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් එසේ අමතර මුදලක් ලබා ගැනීමට සිදුව ඇත.

(iii) නිලධාරීන් තිදෙනා සඳහා අත්තිකාරම් ලබා දී ඇත්තේ මෙසේය

- එන්.පී.ජ්. සමන්ත මහතා

2010.07.30 දින නිකුත් කරන ලද රු. 20,000/- ක අත්තිකාරම් මුදල නිරවුල් කළ පසු 2010.08.11 දින චෙක්පත් අංක 000835 යටතේ මෙහි සඳහන් දෙවන රු.20,000/- නිකුත් කර ඇත.

- එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා

2010.06.14 දින රු.15,000/- අත්තිකාරම නිකුත් කර ඇති අතර, එය නිරවුල් කල පසු රු. 20,000/- අත්තිකාරම් 2010.06.28 දින චෙක්පත් අංක 000673 යටතේ ලබා දී ඇත.

- ජ්.ජ්.ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මිය

රු. 15,000/- අත්තිකාරම චෙක්පත් අංක 000889 යටතේ 2010.08.23 දින නිකුත් කර ඇති අතර, එය නිරවුල් කල පසු රු.12,000/- අත්තිකාරම චෙක්පත් අංක 000977යටතේ 2010.09.09 දින ලබා දී ඇත.

(iv) දීර්ඝ කාලයක් පොත් බැහැර ගෙන ගොස් ආපසු භාර නොදී තිබීම වැළැක්වීම සඳහා ආයතනය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. 2008.01.04 දිනැති කාර්යාල නියෝග අංක 351 හා 2008.01.04 දිනැති කාර්යාල නියෝග 351 (1) නියෝගයන් මේ සම්බන්ධයෙන් පනවන ලදී.

එම නියෝග අනුව පර්යේෂණ නිලධාරීන් සඳහා මාසයක්ද, පර්යේෂණ නොවන නිලධාරීන් සඳහා සති 02 ක් ද වශයෙන් පොත් නිකුත් කිරීමටද, පොතක් නැති වුවහොත් එම පොතේ වර්තමාන වටිනාකමින් 30% ක අමතර මුදලක්ද අය කරන බවට දන්වා ඇත. ප්‍රමාද ගාස්තු අයකිරීම හේතුවෙන් ඉන්පසු ලබාගන්නා ලද පොත් ආපසු භාරදීම ක්‍රමවත්ව සිදුවිය. එසේම පොත් භාරදීමට නියමිත දිනට පෙර සිහිකැඳවීම් ලිපි යැවීම සහ අභ්‍යන්තර දුරකථනය මඟින් දැනුම්දීමද පුස්තකාලය මඟින් කරගෙන යනු ලැබේ.

එම කාර්යාල නියෝග දෙකෙහි ඇතුළත් කරුණු සංශෝධනය කර පුස්තකාල පොත් නිකුත් කිරීම පිළිබඳව අළුතින් කාර්යාල නියෝගයක් අංක 366 ලෙස 2010.09.02 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

නිලධාරීන් විශ්‍රාම යන විට හෝ සේවයෙන් ඉවත්ව යන විට ඔවුන්ගෙන් පුස්තකාලයට අයවිය යුතු අලාභය අයකර ගැනීමේදී භාර නොදුන් පොත් සම්බන්ධයෙන් පොතක වර්තමාන වටිනාකමින් 30% ක අමතර මුදලක් අයකිරීමේ අංක 6 දරණ වගන්තිය අනුව කටයුතු කරනු ලැබේ.

විනාශ වී තිබූ පොත් 129 සම්බන්ධයෙන් පහත සඳහන් පියවර ගෙන ඇත.

භාවිතා කිරීමට තරම් සුදුසු තත්ත්වයේ නොමැති පොත් මෙම ගණයට අයත් වේ. ආයතනයේ පුස්තකාල සේවාව ආරම්භ කළ දින පටන් භාවිතය නිසා කැඩී බිඳී අබලි බවට පත්වූ පොත් සහ කෘමීන් හා ස්වභාවක උපද්‍රව නිසා අබලි බවට පත් පොත් මෙන්ම, කල්ඉකුත්වීමෙන් පුස්තකාල භාවිතයට නුසුදුසු යැයි තීරණය කරන ලද පොත්ද, අනවශ්‍ය පිටපත් සහ බහු පිටපත් ද මේ ආකාරයට පුස්තකාල භාවිතයෙන් ඉවත්කර ඇත.

(v) 65-1280 පැජරෝ ජීප් රථය අප ආයතනයට පවරා ගැනීම සඳහා ලෝක ආහාර සංවිධානයට ලිඛිතව දන්වා ඇත.

3.4 වත්කම් කළමනාකරණය

පැල්වෙහෙර සංචාරක බංගලාව ආයතනය වෙත පවරා ගැනීමේ නීතිමය කටයුතු ආරම්භ කර ඇත.

3.5 මානව සම්පත් කළමනාකරණය

(i) ආයතනයේ කාර්ය මණ්ඩලය 2011.07.13 දින අනුමත කරවා ගෙන ඇත.

(ii) ආයතනයේ කාර්යභාරය පුළුල්වීමත් සමඟම ඒ ඒ විෂයට දක්ෂතා ඇති පුද්ගලයින්ගේ සේවය ලබා ගැනීමට සිදුවිය. දැනට සකස් කරගෙන යන බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටිය අනුව එම තනතුරු අන්තර්ගත කොට ඇති බැවින්, අවශ්‍ය මූලික සුදුසුකම් සකස් කොට ඉදිරියේදී ඊට අදාල කටයුතු සිදුකරනු ලැබේ.

(iii) මෙම සේවකයින් සඳහා පත්වීම් ලිපි නිකුත් කර තිබූ නමුත් එහි පිටපතක් යොමු කිරීමට නොහැකි වීම නිවැරදි කර ගන්නා ලදී.

(iv) පාලක මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු නඩත්තු නිලධාරී තනතුර සේවය පහත හෙලන ලදී.

(v) මෙම නිත්‍ය තනතුරු 07 සඳහා වැඩබැලීමේ පදනම සම්පූර්ණයෙන්ම නතර කර ඇති අතර බඳවා ගැනීමේ පටිපාටියට අනුව නිලධාරීන් පත් කිරීමට කටයුතු යොදා ඇත.

(vi) භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.

(vii) ආයතනයේ නව ව්‍යාපෘති සහ සැලසුම් සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී එම ව්‍යාපෘති කාර්යක්ෂමව සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට

අවශ්‍ය ශ්‍රමය, කාර්ය පැවරීමේ පදනම මත යොදාගෙන ඇති අතර එම ව්‍යාපෘති වල වැඩ අවසන් වූ වහාම එම කාර්ය පැවරීමේ කටයුතු වලින් ඔවුන් නිදහස් කරනු ලැබේ.

3.6 අයවැය ලේඛනමය පාලනය

හැකි සෑම විටම සත්‍ය වියදම අයවැයගත වියදම සමඟ පාලනය කිරීමට ආයතනය කටයුතු කරනු ලැබේ. නමුත් ඇතැම් අවස්ථාවලදී නොවැළැක්විය හැකි හේතුමත මෙසේ සත්‍ය වියදම අයවැයගත වියදම ඉක්මවනු ඇත. කෙසේ වෙතත් ඉදිරි වර්ෂයේ දී මේ සඳහා වැඩි අවධානය යොමු කරන ලෙස වගකිවයුතු නිලධාරීන්ට දැනුවත් කරන ලදී.

4.0 පද්ධති හා පාලනය

(i) අත්තිකාරම් ගෙවීම

(ii) සේවක ණය ගෙවීම

(iii)ස්ථාවර වත්කම් කළමනාකරණය

(iv)නිවාස ණය යෝජනා

(v) ආදායම් ගිණුම්ගත කිරීම

ඉහත සඳහන් කර ඇති අඩුපාඩු වළක්වා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත. කලින් ලබාගත් අත්තිකාරම නිරවුල් කල පසු නැවත අත්තිකාරම් ලබාදීමට පියවර ගෙන ඇත.

- ආයතනයේ ඇති සියලුම ස්ථාවර වත්කම් නිසිපරිදි හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී පියවර ගනු ඇත.
- නිවාස ණය තවදුරටත් නොගෙවන ලෙස බැංකුවට දන්වා ලිපි යවා ඇත.
- ආදායම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් දැනුවත් කර ඇත.
- සේවක ණය ගෙවීම දැඩි සුපරීක්ෂණයට ලක් කර ඇත.